*සැ. යු.* - 2010.06.18 දින පළවූ අංක 1659 දරන *ගැසට් පත්‍රයේ* I-III, කොටස පළ නොවීය.

මෙවර පළවන *ගැසට් පත්‍රයේ* VI කොටසේ 2010 වර්ෂය සඳහා ගාල්ල මහාධිකරණයේ ජූරි සභිකයින්ගේ හා උපදේශකවරුන්ගේ නාමාවලියක් සිංහල භාෂාවෙන් පළවේ.


# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,660 - 2010 ජුනි මස 24 වැනි බ්‍රහස්පතින්දා - 2010.06.24**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස : I වැනි ඡෙදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | 1184 |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... ... | — |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... ... | — |

| | පිටුව |
|---|---|
| රජයේ නිවේදන ... ... ... | 1184 |
| මිල පාලන දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන ... ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... | 1185 |
| නැවියන්ට දැන්වීම් ... ... ... | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳ ව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳ ව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳ ව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2010 ජූලි මස 02 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2010 ජුනි මස 18 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2010 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.


1183- B 79877—3,350 (2010/06)
A1–

# ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

2010 අංක 000

**ජාතික ශිෂ්‍යභට බළකාය**

අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කරන ලද නිල උසස් කිරීම්

(අ) *2008 අගෝස්තු මස 25 වැනි දින සිට ලුතිතන් වශයෙන් :*
නි/6349 2/ලුතිතන් සීඑස්කේ කරුණාරත්න

(ආ) *2008 සැප්තැම්බර් මස 15 වැනි දින සිට ලුතිතන් වශයෙන් :*
නි/5271 2/ලුතිතන් එල්පීයූ ශාන්ත

(ඇ) *2009 ජුනි මස 28 වැනි දින සිට ලුතිනන් වශයෙන් :*
නි/6376 2/ලුතිතන් වයිඑම්එච්කේ අබේකෝන්
නි/6378 2/ලුතිතන් ජීඑච්එස්කේ සුමනසේන
නි/6379 2/ලුතිතන් එස්එෆ්ඩී මර්තිනු
නි/6380 2/ලුතිතන් ජේ සුනිල්
නි/6382 2/ලුතිතන් ඕඩබ් ජෝර්ජ්
නි/6383 2/ලුතිතන් එච්කේ වික්‍රමනායක
නි/6386 2/ලුතිතන් ඒජීජේ රත්නායක
නි/6387 2/ලුතිතන් එම්පී විජේනායක
නි/6389 2/ලුතිතන් එම්ඩීඑස්එස් චමින්ද
නි/6391 2/ලුතිතන් ඩබ් ශ්‍රියානි (ගැ)
නි/6393 2/ලුතිතන් ටීජීඑස්කේ අඹතැන්න
නි/6397 2/ලුතිතන් ඒඑම්ජීසීඩී අබේසිංහ
නි/6400 2/ලුතිතන් එන්පී නිගමුණි
නි/6403 2/ලුතිතන් ඒඑච්ජීඑස් අමුණුගම
නි/6405 2/ලුතිතන් එම්පී වීරසේකර
නි/6406 2/ලුතිතන් කේජීවීකේ ගුණවර්ධන
නි/6407 2/ලුතිතන් එච්ජ්ඩබ්කේ හපුආරච්චි
නි/6412 2/ලුතිතන් ටීජ් ද සිල්වා
නි/6414 2/ලුතිතන් එස්එම්ඩී ප්‍රසංග
නි/6415 2/ලුතිතන් ඒඑම්ආර්පීකේ ගුණසේකර
නි/6417 2/ලුතිතන් එම්ආර්ඩී තලකොටුව
නි/6418 2/ලුතිතන් යූජීජීසී එදිරිසිංහ
නි/6419 2/ලුතිතන් ඩීජී ශාන්ත
නි/6420 2/ලුතිතන් පීඩබ්ජ්කේ තලාපොලවත්ත
නි/6421 2/ලුතිතන් ඩීඑම්බී දිසානායක
නි/6424 2/ලුතිතන් කේඑම්පීඩබ් චන්ද්‍රකුමාර
නි/6426 2/ලුතිතන් අයිටී සූරියාරච්චි (ගැ)
නි/6428 2/ලුතිතන් සීපීජ් චන්ද්‍රරත්න
නි/6429 2/ලුතිතන් අයිසීජී විජේසිංහ (ගැ)
නි/6431 2/ලුතිතන් පීඑස්එස් ජයසිංහ
නි/6433 2/ලුතිතන් කේජී දිඹුල්කුඹුර (ගැ)
නි/6436 2/ලුතිතන් ආර්එම්කේ අයිරාංගනී (ගැ)

(ඈ) *2009 අගෝස්තු මස 30 වැනි දින සිට ලුතිතන් වශයෙන් :*

නි/5362 2/ලුතිතන් කේඩී ප්‍රේමරත්න
නි/6122 2/ලුතිතන් එච්එම් ධනපාල
නි/6271 2/ලුතිතන් ඩබ්එම්එස්ආර් ප්‍රනාන්දු (ගැ)
නි/6299 2/ලුතිතන් ජේඑම්එන් ජයකොඩි
නි/6312 2/ලුතිතන් එච්එම්ආර් පුෂ්පකුමාර
නි/6317 2/ලුතිතන් එම්ආර් දහනායක
නි/6336 2/ලුතිතන් පීජ් සිරිසෝම
නි/6355 2/ලුතිතන් එම්ජීටී වික්‍රමසිංහ
නි/6384 2/ලුතිතන් කේඩීඑම් ද සොයිසා
නි/6395 2/ලුතිතන් ආර්එම්ජ්කේ රත්නායක
නි/6399 2/ලුතිතන් ඊජ්ආර් මිණිරුවන්
නි/6408 2/ලුතිතන් කේඑච්පීඑම්පී කුසුම්සිරි
නි/6410 2/ලුතිතන් එම්ජීඑල්ආර් බණ්ඩාර
නි/6413 2/ලුතිතන් ආර්එම්එස් රාජපක්ෂ
නි/6416 2/ලුතිතන් පීසීඑස්එස් ද සිල්වා
නි/6432 2/ලුතිතන් එස්ජ්ඩීඑන් සුහසිංහ.

අතිගරු ජනාධිපතිතුමන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය.

2010,
කොළඹ දී ය.

06-481

---

# රජයේ නිවේදන

**2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 34(2)(අ) වගන්තිය යටතේ නියමය**

2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 34(2)(අ) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මුදල් අමාත්‍ය මහින්ද රාජපක්ෂ වන මම, මෙහි පහත දක්වා ඇති උපලේඛනයේ සඳහන් "ජගද්දලා සමාජ සුභ සාධක ආයතනයේ ජගද්දලා ළමා සංවර්ධන මධ්‍යස්ථානය" එකී වගන්තියෙහි කාර්ය සඳහා අනුමත පුණ්‍යායතනයක් ලෙස මෙම දැන්වීමෙන් ප්‍රකාශ කරමි.

මහින්ද රාජපක්ෂ,
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍ය.

2010 ජුනි මස 08 වැනි දින,
කොළඹ 01,
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ දී.

**උපලේඛනය**

"ජගද්දලා සමාජ සුභ සාධක ආයතනයේ ජගද්දලා ළමා සංවර්ධන මධ්‍යස්ථානය."

06-548

---

**ඔඩ්ඩුසුඩ්ඩාන් තාන්තෝන්රි ඊස්වරර් කෝවිල් උත්සවය - 2010**

මුලතිව් දිස්ත්‍රික්කය

ඉහත සඳහන් උත්සවය 2010 ජුනි මස 11 වැනි දින පෙරවරු 6.00ට ආරම්භ කොට 2010 ජුනි මස 27 වැනි දින පෙරවරු 6.00ට අවසන් වන

බව පොදු මහජනතාවගේ දැනගැනීම සඳහා මෙයින් නිවේදනය කරනු ලැබේ.

02. මේ පිළිබඳව 1949 මැයි මස 27 වැනි දින, අංක 9978 හා 1950 මැයි මස 26 වැනි දිනැති අංක 10105 දරන රෙගුලාසිවලට පොදු ජනතාවගේ අවධානය යොමු කරවනු ලැබේ.

03. ප්‍රසිද්ධියට පත් කරන ලද මෙම නිත්‍ය රෙගුලාසි මෙම උත්සවය පැවැත්වෙන කාල සීමාව තුළ වලංගුවනවා ඇත.

ඉමෙල්ඩා සුකුමාර්,
දිස්ත්‍රික් ලේකම්/දිසාපති,
මුලතිව් දිස්ත්‍රික්කය.

2010 ජුනි මස 01 වැනි දින.

06-480

---

මගේ අංකය : DS/MN/SS/Cul/04.

**වන්දනා ගමන් ආඥාපනත ශ්‍රී මාමාංග පිල්ලයාර් කෝවිල් වාර්ෂික උත්සවය - 2010**

මඩකලපුව දිස්ත්‍රික්කය

යථෝක්ත උත්සවය 2010 ජූලි මස 31 වැනි දින පටන් ගෙන 2010 අගෝස්තු මස 09 වැනි දින දක්වා පවත්වනු ලබන බව මෙකී උත්සවයට වන්දනා සඳහා පැමිණෙන අයගේ සහ අනෙකුත් සියලු දෙනාගේම දැන ගැනීම සඳහා මෙයින් ප්‍රකාශ කරමි.

1948.07.16 වැනි දින අංක 9886 දරන ආණ්ඩුවේ *ගැසට් නිවේදනය* සඳහන් නිත්‍ය නියෝගයන් කෙරෙහි මෙම උත්සව සමයේ දී එකී උත්සවයට පැමිණෙන සියල්ලන්ගෙන් හා අනෙකුත් අයගෙන් අවධානය මෙයින් යොමු කරවමි.

කේ. පද්මරාජා මිය.,
ප්‍රාදේශීය ලේකම්,
මන්මුනේ උතුර, මඩකලපුව

2010 ජුනි මස 07 වැනි දින.

06-469

---

**මාතර තොටමුණ පොසොන් මහ පෙරහැර**

දකුණු පළාතේ මාතර දිස්ත්‍රික්කයේ පවත්වනු ලබන 2010 පොසොන් මහ පෙරහැර 2010 ජුනි මස 25 වැනි දින පවත්වනු ලබන බව වන්දනා ගමන් ආඥාපනත යටතේ (175 පරිච්ඡේදය) 1959 නොවැම්බර් මස 20 වැනි දින නිකුත් කරන ලද 11959 දරන ලංකාණ්ඩුවේ *ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද රෙගුලාසිවල 10 වැනි වගන්තිය යටතේ මෙයින් දන්වමි.

තුසිත පී. වනිගසිංහ,
ප්‍රාදේශීය ලේකම්,
මාතර.

2010 ජුනි මස 07 වැනි දින,
මාතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

06-528

---

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

**සෙලාන් බැංකුව පීඑල්සී - ප්‍රයිවට් බැන්කිං යුනිට් ශාඛාව**

2007 අංක 07 දරන සමාගම් පනත අනුව යොමුව පීකිව් 9 යටතේ ලියාපදිංචි කර ඇත

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2010.02.16 දින පවත්වන්නට යෙදුනු රැස්වීමේ දී, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ :

ගිණුම් අංකය : 9957-330430-001.

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යොමු අංක පීකිව් 9 යටතේ ලියාපදිංචි කර ඇත) ප්‍රසිද්ධ නොතාරිස් එස්. කේ. තෙපුලන්ගොඩ විසින් තුනම සහතික කරන ලද 2003 නොවැම්බර් මස 03 දිනැති අංක 611, 2004 සැප්තැම්බර් මස 08 දිනැති අංක 766 සහ 2005 දෙසැම්බර් මස 16 දිනැති අංක 869 සහ ප්‍රසිද්ධ නොතාරිස් පී. ජී. ඉඳිගහවෙල විසින් දෙකම සහතික කරන ලද 2005 ජූලි මස 29 දිනැති අංක 09 සහ 2005 දෙසැම්බර් මස 16 දිනැති අංක 43 දරන බැඳුම්කර මත අයවිය යුතු මුදල් ගෙවීම නුගේගොඩ පදිංචි රනිල් චින්තන් වාගීස්වර යන අය බන්ධනදායී වශයෙන් පැහැර හැර ඇතිහෙයින් එකී බැඳුම්කර යටතේ රුපියල් තුන්කෝටි අසූහත්ලක්ෂ එක්දහස් පන්සිය පහයි ශත අනූ දෙකක (රු. 3,87,01,505.92) මුදලක්, 2009 අගෝස්තු මස 14 වැනි දින වන විට සෙලාන් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රු. 3,87,01,505.92 මුදල ද, 2009 අගෝස්තු මස 15 දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට තිස් දෙක (32%) බැගින් වූ පොළිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුනු වෙනත් ගාස්තුද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම් එම මුදල) අඩුකර අයකර ගැනීම පිණිස ඉහත කී අංක 611, 766 සහ 869 දරන බැඳුම්කර මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස් කර ඇත්තාවූ මෙහි පහත සඳහන් 1 වැනි උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ සහ පරිශ්‍රය සහ එකී අංක 09 සහ 43 දරන බැඳුම්කර මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස්කර ඇත්තාවූ මෙහි පහත සඳහන් 2 වැනි උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ බලයලත් වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

**1 වැනි උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සහ මහ නගර සභා සීමාව තුළ කොල්ලුපිටිය පිහිටි බලයලත් මිනින්දෝරු අයි. ඒ. සී. සේනාරත්න විසින් සාදන ලද 2003.10.20 දිනැති අංක 3943 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන ලොට් 1 ලකුණු කළ ඩීන්ස්ටන් පෙදෙස වරිපනම් අංක 39 දරන ගොඩනැගිලි ගස්, වගා, බිම සහ එහි පිහිටි සියලු දේ සමග (බලයලත් මිනින්දෝරු ජේ. ජී. මැලනි විසින් සාදන ලද 1946.11.28 දිනැති අංක 1515 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන ඩීන්ස්ටන් පෙදෙස වරිපනම් අංක 39හි නැවත මැනීමක් වන) බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට

මායිම්, උතුරට : ඩීල් ප්ලේස් ඒ පරිශ්‍ර අංක 16 ද, නැගෙනහිරට : ඩීන්ස්ටන් පෙදෙස පරිශ්‍ර අංක 45 ද, දකුණට : ඩීන්ස්ටන් ප්ලේස් සහ බස්නාහිරට : ඩීන්ස්ටන් ප්ලේස් පරිශ්‍ර අංක 37 ද යන මායිම් තුළ එකී අංක 3943 දරන සැලැස්ම අනුව පර්චස් දහතුනයි දශම දෙකයි පහක් (අ. 0, රූ. 0, පර්. 13.25) නොහොත් හෙක්ටයාර් 0.03351 ක් විශාල ඉඩම. මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ 1032/57 යටතේ ලියාපදිංචි කර ඇත.

### 2 වැනි උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළයේ, පල්ලේ පත්තුවේ, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභා සීමාව තුළ ගංගොඩවිල පිහිටි බලයලත් මිනින්දෝරු ඒ. ජී. ඒ. ගුණවර්ධන විසින් සාදන ලද 1970 ජුනි මස 13 වැනි දිනැති අංක 1204 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන කටහගහවත්ත නමැති ජම්බුගස්මුල්ල පාර වරිපනම් අංක 85, 85 1/1 දරන ගොඩනැගිලි, ගස්, වගා, බිම සහ එහි පිහිටි සියලු දේ සමග ඉඩමේ ලොට් 75ඒ2 ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් 75ඒ1 ද, නැගෙනහිරට : නිවෙස්වලට යන පාර ද, දකුණට : ජම්බුගස්මුල්ල පාර සහ බස්නාහිරට : ජම්බුගස්මුල්ල පාර වරිපනම් අංක 83 දරන පරිශ්‍රය යන මායිම් තුළ එකී අංක 1204 දරන සැලැස්ම අනුව පර්චස් විසිපහයි දශම අටයි පහක් (අ. 0, රූ. 0, පර්. 25.85) ක් විශාල ඉඩම. මෙය ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත්‍රිරුව එම් 1424/252 හි ලියාපදිංචි කර ඇත.

එකී ලොට් 75ඒ2 වඩාත් මෑතක මැනීමක් අනුව බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. ඩී. බෙල්ලන විසින් සාදන ලද 2004 නොවැම්බර් මස 01 දිනැති අංක 992/2004 දරන සැලැස්මේ ලොට් ඒ ලකුණු කර නිරූපණය කර පහත සඳහන් පරිදි විස්තර කර ඇත :

පෙර කී ගංගොඩවිල පිහිටි බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. ඩී. බෙල්ලන විසින් සාදන ලද 2004 නොවැම්බර් මස 01 දිනැති අංක 992/2004 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන කහටගහවත්ත නමැති ජම්බුගස්මුල්ල පාර වරිපනම් අංක 85 සහ 85 1/1 දරන ගොඩනැගිලි, ගස්, වගා, බිම සහ එහි පිහිටි සියලු දේ සමග ඉඩමේ ලොට් ඒ ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : ජම්බුගස්මුල්ල පාර වරිපනම් අංක 85/1ඒ පරිශ්‍රය ද, නැගෙනහිරට : පාර ද, දකුණට : ජම්බුගස්මුල්ල පාර සහ බස්නාහිරට : ජම්බුගස්මුල්ල පාර වරිපනම් අංක 83 දරන පරිශ්‍රය යන මායිම් තුළ එකී අංක 992/2004 දරන සැලැස්ම අනුව පර්චස් විසිපහයි දශම අටයි පහක් (අ. 0, රූ. 0, පර්. 25.85)ක් විශාල ඉඩම.

අධ්‍යක්‍ෂ මණ්ඩලයේ අණ පරිදි,

සී. කොටිගල,
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී-නීති.

06-619

---

**සෙලාන් බැංකුව පීඑල්සී - නුගේගොඩ ශාඛාව**

2007 අංක 07 දරන සමාගම් පනත අනුව යොමුව පීකිව් 9 යටතේ ලියාපදිංචි කර ඇත

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් 2010.03.15 දින පවත්වන්නට යෙදුනු රැස්වීමේ දී, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ :

ගිණුම් අංකය : 0120-01571083-001.

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යොමු අංක පීකිව් 9 යටතේ ලියාපදිංචි කර ඇත) ප්‍රසිද්ධ නොතාරිස් තිලිනි පී. කරුණාසේකර විසින් තුනම සහතික කරන ලද 2004 දෙසැම්බර් මස 15 දිනැති අංක 976, 977 සහ 978 දරන බැඳුම්කරයන් මත අයවිය යුතු මුදල් ගෙවීම නුගේගොඩ ව්‍යාපාර ලියාපදිංචි අංක එන්(පීවීඑස්) 20493 දරන 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ යථා පරිදි සංස්ථාපිත සමාගමක් වන සීකෝ ගෑසස් (ප්‍රයිවට්) ලිමිටඩ් සහ නුගේගොඩ පදිංචි ස්මිත් නිමලසිරි විජේසිංහ ඒකනායක යන අය බන්ධනදායී වශයෙන් පැහැර හැර ඇතිහෙයින් එකී බැඳුම්කර යටතේ රුපියල් පන්කෝටි හැත්තෑපන්ලක්ෂ පනස්නවදහස් එකසිය හතලිස් අටයි ශත පනස් නවයක (රු. 5,75,59,148.59) මුදලක්, 2009 සැප්තැම්බර් මස 16 වැනි දින වන විට සෙලාන් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රු. 5,75,59,148.59 මුදල ද, 2009 සැප්තැම්බර් මස 17 දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට විසිනවය (29%) බැගින් වූ පොළිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුනු වෙනත් ගාස්තු ද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම් එම මුදල) අඩුකර අයකර ගැනීම පිණිස ඉහත කී අංක 976, 977 සහ 978 දරන බැඳුම්කර මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස් කර ඇත්තාවූ මෙහි පහත සඳහන් පළමුවැනි, දෙවැනි සහ තුන්වැනි උපලේඛනවල සවිස්තරව විස්තර කර ඇති දේපළ සහ පරිශ්‍රය බලයලත් වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### ඉහත සඳහන් පළමුවැනි උපලේඛනය

වයඹ පළාතේ, හලාවත දිස්ත්‍රික්කයේ, උතුරු පිටිගල් කෝරළයේ, මුන්නේස්වරම් පත්තුවේ, මාදම්පේ දෙමටපිටිය සහ කීනගස්විල ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු ඒ. එම්. පෙරේරා විසින් සාදන ලද 1959.04.27 දිනැති අංක 5533 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන කීණගස්විල එස්ටේට් නමැති ගොඩනැගිලි, ගස්, වගා, බිම සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩමේ ලොට් ඒ ලකුණු කළ ඉඩම් කොටසට මායිම්, උතුරට : දැන් නිකලස් ප්‍රනාන්දුට අයිති සිරිල් රත්නායකගේ ඉඩම ද, නැගෙනහිරට : කලින් බලයලත් මිනින්දෝරු ඒ. එම්. පෙරේරා විසින් සාදන ලද 1952.07.17 දිනැති අංක 4168 දරන සැලැස්මේ සඳහන් ලොට් බී ෂෙල්ටන් වික්‍රමනායක සහ ඔගස්ටින් ප්‍රනාන්දුගේ උරුමක්කරුවන්ට අයිති ඉඩම් ද, දකුණට : කාක්කපල්ලියේ සිට පාලු බිංගිරියට යන ප්‍රධාන පාර සහ බස්නාහිරට : එන් එම්. පාරුක්ට අයිති කලින් අංක 4168 දරන සැලැස්මේ ලොට් ඒ ද, යන මායිම් තුළ අක්කර තිහක් (අ. 30, රූ. 0, පර්. 0)ක් විශාල ඉඩම. මෙය හලාවත ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත්‍රිරුව සී 151/27හි ලියාපදිංචි කර ඇත.

එකී ලොට් ඒ බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. ඒ. සිරිසේන විසින් දැන නැවත මැන ඇති අතර 2004.10.24 දිනැති අංක 3067 දරන සැලැස්ම අනුව පහත සඳහන් පරිදි සවිස්තරව විස්තර කර ඇත :

පුත්තලම දිස්ත්‍රික්කයේ, උතුරු පිටිගල් කෝරළයේ, හලාවත ලියාපදිංචි කිරීමේ කාර්යාලය තුළ මැදගම දෙමටපිටිය ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. ඒ. සිරිසේන විසින් සාදන ලද 2004.10.24 දිනැති අංක 3067 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන කීණගස්විල එස්ටේට් නමැති ගොඩනැගිලි, ගස්, වගා, බිම සහ එහි පිහිටි වෙනත් සියලු දේ

සමග ඉඩමේ ලොට් 1 ලකුණු කළ ඉඩම් කොටසට මායිම්, උතුරට : මියගිය නිකලස් ප්‍රනාන්දුගේ උරුමක්කරුවන්ට අයිති ඉඩම ද, නැගෙනහිරට : මියගිය ෂෙල්ටන් වික්‍රමනායකගේ උරුමක්කරුවන්ට අයිති ඉඩම සහ අංක 4168 දරන සැලැස්මේ සඳහන් ලොට් බී සහ මහින්ද ජයතිලකගේ ඉඩම ද, දකුණට : පාර (මාර්ග සංවර්ධන අධිකාරිය) කාක්කපල්ලියේ සිට පාලු බිංගිරියට යන සහ බස්නාහිරට : අංක 4168 දරන සැලැස්මේ ලොට් ඒ සහ හියු ප්‍රනාන්දුට අයිති ඉඩම ද යන මායිම් තුළ එකී අංක 3067 දරන සැලැස්ම අනුව අක්කර තිහක් (අ. 30, රූ. 0, පර්. 0) විශාල ඉඩම.

### 2 වැනි උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හෝමාගම ප්‍රාදේශීය ලේකම් කාර්යාල කොට්ඨාසයේ, පල්ලේ පත්තුවේ, පනාගොඩ ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු කේ. ඩබ්ලිව්. ඩී චන්ද්‍රානි විසින් සාදන ලද 2003.09.03 දිනැති අංක 569 දරන මිනුම් සැලැස්මේ පෙන්නුම් කරනු ලබන ටෙම්පලර්ස්බර්ග් එස්ටේට් නමැති ගොඩනැගිලි, ගස්, වගා බිම සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩමේ ලොට් 1 ලකුණු කළ (මිනුම්පති විසින් සාදන ලද අංක 7919 දරන මූලික සැලැස්මේ නැවත මැනීමක් වන) ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් 8හි කොටසක් (පාර) සහ පී. පී. කො. 7919හි සඳහන් ලොට් 9 ද, නැගෙනහිරට : ලොට් 8හි කොටසක් (පාර) සහ පී. පී. කො. 7919 හි සඳහන් ලොට් 7 ද, දකුණට : ලොට් 8හි කොටසක් (පාර) සහ පී. පී. කො. 7919 හි සඳහන් ලොට් 9 සහ බස්නාහිරට : ලොට් 8හි කොටසක් (පාර) සහ පී. පී. කො. 7919 හි සඳහන් ලොට් 9 යන මායිම් තුළ එකී අංක 569 දරන සැලැස්ම අනුව අක්කර එකයි පර්චස් තිස් හතරයි දශම හයයි බිංදුවක් (අ. 1, රූ. 0, පර්. 34.60) ක් විශාල ඉඩම. මෙය හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත්‍රිරුව පී 1495/61හි ලියාපදිංචි කර ඇත.

### තුන්වැනි උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, කෝට්ටේ නගර සභා සීමාව තුළ නුගේගොඩ (කලින් ස්ටේෂන් රෝඩ්) ස්ටැන්ලි තිලකරත්න මාවත මායිම් ව පිහිටි බලයලත් මිනින්දෝරු ඒ. ඊ. විජේසූරිය විසින් සාදන ලද 1973.01.27 දිනැති අංක 415 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන කොට්ටනුවේ කුඹුර නමැති ගොඩනැගිලි, ගස්, වගා බිම සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩමේ ලොට් 4ඒ ලකුණු කළ ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් 4බී ද, නැගෙනහිරට : අංක 3130ඒ දරන සැලැස්මේ සඳහන් ලොට් ඒ ද, දකුණට : නුගේගොඩ සිට බොරැල්ලට යන ප්‍රධාන පාර ද, බස්නාහිරට : අංක 3130ඒ දරන සැලැස්මේ සඳහන් ලොට් 3 ද යන මායිම් තුළ පර්චස් විසිපහක් (අ. 0, රූ. 0, පර්. 25)ක් විශාල ඉඩම. මෙය ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත්‍රිරුව එම් 1038/286හි ලියාපදිංචි කර ඇත.

එකී ලොට් 4ඒ දැන් නැවත මැන (ලොට් 4ඒ ප්‍රදේශය පාර පළල් කිරීම සඳහා අත්පත් කර ගැනීමෙන් පසු) බලයලත් මිනින්දෝරු පී. එල්. බී. නානායක්කාර විසින් සාදන ලද 1979.09.02 දිනැති අංක 1507 දරන සැලැස්මේ පෙන්නුම් කර ඇති අතර පහත සඳහන් සවිස්තරව විස්තර කර ඇත :-

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, කෝට්ටේ පාර, නගර සභා සීමාව තුළ නුගේගොඩ (කලින් ස්ටේෂන් රෝඩ්) ස්ටැන්ලි තිලකරත්න මාවත මායිම් ව පිහිටි බලයලත් මිනින්දෝරු පී. එල්. බී. නානායක්කාර විසින් සාදන ලද 1979.09.02 දිනැති අංක 1507 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන කොට්ටනුවේ කුඹුර නමැති ගොඩනැගිලි, ගස්, වගා, බිම සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩමේ ලොට් 4ඒ1 ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, ඊසාණට : දැන් කේ. ඩී. ලීලාවතීගේ උරුමක්කරුවන්ට හිමි බලයලත් මිනින්දෝරු එච් ඊ. විජේසූරිය විසින් සාදන ලද 1973.01.27 දිනැති අංක 415 දරන සැලැස්මේ සඳහන් ලොට් 4හි ලොට් 4බී ද, ගිණිකොණට : බලයලත් මිනින්දෝරු වී. ඒ. එල්. සේනාරත්න විසින් සාදන ලද 1966.11.29 දිනැති අංක 3130ඒ දරන සැලැස්මේ සඳහන් ලොට් ඒ (පාරක් සඳහා වෙන් කිරීම) නිරිතට : ස්ටැන්ලි තිලකරත්න මාවත (කලින් ස්ටේෂන් රෝඩ්) සහ වයඹට : දැන් කේ. ඩී. ජයසේනට හිමි බලයලත් මිනින්දෝරු වී. එල්. සේනාරත්න විසින් සාදන ලද 1966.11.29 දිනැති අංක 3130ඒ දරන සැලැස්මේ සඳහන් ලොට් 3 ද යන මායිම් තුළ එකී අංක 1507 දරන සැලැස්ම අනුව පර්චස් විසිතුනක් (අ. 0, රූ. 0, පර්. 23)ක් විශාල ඉඩම.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සී. කොරිගල,
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී-නීති.

06-620/1

---

### හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී - දෙල්ගොඩ ශාඛාව

(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව නමින් හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

මල්මාල ආරච්චිගේ ප්‍රේමසිරි.

2010.03.01 දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී හි අධ්‍යක්ෂක මණ්ඩලයේ රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් ආර්. එම්. එන්. ඩබ්. රාජකරුණා විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි නමට ලියන ලද්දාවූ ද 2007.07.20 දින හා අංක 25133 දරන උකස් බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම මල්මාල ආරච්චිගේ ප්‍රේමසිරි යන අය ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් අටලක්ෂ පනස්අටදහස් පන්සිය තිස්එකයි ශත අසූහතර (රු. 8,58,531.84) ක මුදලක් 2009.08.31 වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 8,58,531.84ක මුදලට 2010.09.01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළිය ද ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන් ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 25133 දරන උකස් බැඳුම්කරය මගින් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී වෙත උකස් කොට ඇත්තා වූද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තාවූ ද, දේපළ හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු එච්. දළුවත්ත මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂක මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, අදිකාරි පත්තුවේ, බියගම ප්‍රාදේශීය සභා සීමාව තුළ ගෝනවල ගමෙහි පිහිටි "කැකුණගහවත්ත" නමැති ඉඩමට බලයලත් මානක කේ. ඒ. රූපසිංහ විසින් 2006 සැප්තැම්බර් මස 08 වැනි දින සහ අංක 999/2006 දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද ලොට් "බී1" ලෙස ලකුණු කර ඇති ඉඩම් කොටස වන උතුරට : ජයසේන හිමිකම් කියන ඉඩමෙන් ද, නැගෙනහිරට : එන්. ජෝශප් බෙනඩික්ට් හිමිකම් කියන ඉඩමෙන් ද, දකුණට : ලොට් ඩී වලින් ද සහ බස්නාහිරට : ලොට් ඒ වලින් ද, (අඩි 10 ක් පළලැති පාරක් සඳහා වෙන් කරන ලද කොටස) මායිම් වූ පිඹුර ප්‍රකාරව පර්චස් හත (අ. 0, රූ. 0, පර්. 07) හෝ හෙක්ටයාර් බිංදුවයි දශම බිංදුවයි එකයි හත (හෙක්. 0.017)ක් විශාල ඉඩම තුළ ඇති ගොඩනැගිලි, ගහකොළ, වැවිලි සහ අනෙකුත් සියලු දේත් සමග පිහිටි ඉඩම වේ.

ලොට් සී1ට අයත් 999/2006 දරන පිඹුරේ වැඩිදුරටත් විස්තර වන මාර්ග අයිතිය ද සමග වේ.

ඉහත විස්තර කරන ලද ලොට් "බී1" දරන ඉඩම පහත දැක්වෙන ඉඩමේ නැවත මැනීමකි.

ඉහත කී ගෝනවල ගමෙහි පිහිටි "කැකුණගහවත්ත" නමැති ඉඩමට බලයලත් මානක කේ. ඒ. රූපසිංහ විසින් 1995 සැප්තැම්බර් මස 18 වැනි දින සහ අංක 663/1995 දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද ලොට් "බී" ලෙස ලකුණු කර ඇති ඉඩම් කොටස වන උතුරට : චන්ද්‍රාවතී හෙට්ටිආරච්චි හිමිකම් කියන ඉඩමෙන් ද, නැගෙනහිරට : ජෝසප් බෙනඩික් හිමිකම් කියන ඉඩමෙන් ද, දකුණට : ලොට් ඩී වලින් ද සහ බස්නාහිරට : ලොට් ඒ, සී සහ ඩී වලින් ද මායිම් වූ පිඹුර ප්‍රකාරව පර්චස් හත (අ. 0, රූ. 0, පර්. 07) ක් විශාල ඉඩම තුළ ඇති ගොඩනැගිලි, ගහකොළ, වැවිලි සහ අනෙකුත් සියලු දේත් සමග මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්‍රිරුව සී 557/242 හි ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රානි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිනි (නීති),
මාණ්ඩලික ලේකම්.

06-587/2

---

### හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී - අනුරාධපුර ශාඛාව

(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව නමින් හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

දොන් සිමන් පටබැඳිගේ මර්සි ද සිල්වා.

2010.03.31 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී හි අධ්‍යක්ෂක මණ්ඩලයේ රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී :

අනුරාධපුර ප්‍රසිද්ධ නොතාරිස් ඒ. වී. ඒ. දිසානායක විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි නමට ලියන ලද්දාවූ ද 2006.02.28 දින හා අංක 4149 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම දොන් සිමන් පටබැඳිගේ මර්සි ද සිල්වා යන අය ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් එක්ලක්ෂ පනස්තුන්දහස් පන්සිය හැත්තෑහයයි ශත පනස්දෙක (රු. 1,53,576.52) ක මුදලක් 2009.10.31 වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 1,53,576.52ක මුදලට 2009.11.01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළියද ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන්ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 4149 දරන උකස් බැඳුම්කරය මගින් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී වෙත උකස් කොට ඇත්තා වූ ද දේපළ හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු අයි. ඩබ්. ජයසූරිය මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂක මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

### උපලේඛනය

උතුරු මැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, නැගෙනහිර නුවරගම් පළාතේ, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස කාර්යාලයට අයත් කනදරා කෝරළේ, කලින් වන්නිතම්මෙන්නාව නමින් හඳුන්වනු ලැබූ තම්මෙන්නාව ගමෙහි (එෆ් වී. පී. 246) පිහිටි "තම්මෙන්නාව මූකලාන" නමැති ඉඩමට බලයලත් මානක කේ. කේ. චින්නායි විසින් මැන සාදන ලද අංක 292 සහ 2004 ඔක්තෝම්බර් මස 01 වැනි දින දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද "ලොට් 2" ලෙස ලකුණු කර ඇති ඉඩම් කොටස (1998.08.06 දින දරන අනු/නෙනුප/ප්‍රා/4272එල්. ඩී. ඕ. 19(4) වගන්තිය යටතේ ප්‍රදානය කරන ලද ඉඩමේ බෙදා වෙන් කළ කොටසකි) වන උතුරට : පිඹුරු අංක 292ට අයත් ලොට් 1න් ද, නැගෙනහිරට : පාරේන් ද (ආර්. ඩී. ඒ.), දකුණට : ඩී. එස්. පී. නීලමනි ද සිල්වා හිමිකම් කියන ඉඩමෙන් ද සහ බස්නාහිරට : ඩී. එස්. පී. සරත් හිමිකම් කියන ඉඩමෙන් ද මායිම් වූ හෙක්ටයාර් බිංදුවයි දශම බිංදුවයි හතයි බිංදුවයි අට (හෙක්. 0.0708) හෝ පර්චස් විසිඅට (අ. 0, රූ. 0, පර්. 28) ක විශාල ඉඩම තුළ පිහිටි ගොඩනැගිලි, ගහකොළ, වැවිලි සහ අනෙකුත් සියලුම දේත් සමග මෙය අනුරාධපුර දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එල්. ඩී. ඕ. 594/84 ශීර්ෂය යටතේ ලියාපදිංචි කර ඇත.

මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රානි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිනි (නීති),
මාණ්ඩලික ලේකම්.

06-587/4

---

### මහජන බැංකුව - ලිබර්ටි ප්ලාසා

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය

විසින් පහත සඳහන් යෝජනාව 2009.10.30 වැනි දින ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් මිරිස්සගේ නන්දනී පෙරේරා විසින් මහජන බැංකුවේ නමට ලියා සහතික කරන ලද 2007.02.21 දිනැති අංක 3985 දරන උකස්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, අනෝමා සමන්ති කොළොන්ගොඩ විවාහයට පෙර ගුණසේකර විසින් පැහැර ඇති බැවින් ද, එකී අංක 3985 දරන උකස්කරය මත රුපියල් එක්කෝටි හත්ලක්ෂ විසිපන්දහසක (රු. 1,07,25,000) ක මුදලක් මහජන බැංකුවට දැනට අයවීමට ඇති බැවින් ද, 2009.03.28 දින සිට වර්ෂයකට සියයට 22% (සියයට විසිදෙක) බැගින් රුපියල් එක්කෝටි හත්ලක්ෂ විසිපන්දහසක (රු. 1,07,25,000) ක මුදල සඳහා දේපළ විකිණීමේ දිනය තෙක් තවදුරටත් පොළිය සහ වෙන්දේසි ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී රුපියල් එක්කෝටි හත්ලක්ෂ විසිපන්දහසක (රු. 1,07,25,000) ක මුදල අයකර ගැනීම සඳහා කොළඹ බලයලත් වෙන්දේසිකාර ටී සහ එච්. වෙන්දේසිකරුවන් විසින් එකී 2007.02.21 දිනැති අංක 3985 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස්කර ඇති දේපළ සහ පරිශ්‍රය ප්‍රසිද්ධ වෙන්දේසියකදී විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකුව පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

### ඉහත කී උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, කොළඹ මහ නගර සභා සීමාව තුළ කොල්ලුපිටිය ඡන්ද කොට්ඨාස අංක 37හි කොල්ලුපිටියේ පිහිටා ඇති ෆාර්ම් ග්‍රොරොව් ඇවනිව් හි දැනට වරිපනම් අංක 25 දරන (බලයලත් මිනින්දෝරු ඒ. එෆ්. සමීර් විසින් 1996 අප්‍රේල් 6 වැනි දින සාදන ලද අංක 3806 දරන පිඹුරේ නිරූපිත ලොට් 1A සහ 1B එකට බද්ධ කරන ලද නැවත මිනුමක් සහ උපබෙදීමක් වශයෙන් පවතින) බලයලත් මිනින්දෝරු එන්. එම්. ආර් ප්‍රේමරත්න විසින් 1998 මැයි මස 14 වැනි දින මැන සාදන ලද අංක 423 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන් කරන ලද “ලොට් B” දරන ඉඩම් කොටසට මායිම්, උතුරට : ෆර්ම් ග්‍රොරොව්, නැගෙනහිරට : පාර්ම් ග්‍රොරොව්හි වරිපනම් අංක 21 දරන පරිශ්‍රය සහ වරිපනම් අංක 30/1 සහ කර්නල් ටී. ජී. ජයවර්ධන මාවත, දකුණට : වරිපනම් අංක 265/4 දරන පරිශ්‍රය, ආර්. ඒ. ද මෙල් මාවත සහ බටහිරට : එම ඉඩමේ ලොට් A ද යන මෙකී මායිම් තුළ පිහිටි පර්චස් දහහතරයි දශම තුනයි පහක් (අ. 0, රූ. 0, පර්. 14.35) විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි, වැව්ලි ආදී සියලු දේ ද වේ. මෙම ඉඩම කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ A935/274 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකරු,
(කොළඹ උතුර) .

මහජන බැංකුව,
කලාප ප්‍රධාන කාර්යාලය,
(බටහිර කලාපය 01),
අංක 11, ඩියුක් වීදිය,
කොළඹ 01

06-579

---

### හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී - වෙන්නප්පුව ශාඛාව

(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව නමින් හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

වර්ණකුලසූරිය අජිත් ප්‍රනාන්දු.

2010.03.31 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී හි අධ්‍යක්ෂක මණ්ඩලයේ රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී :

වෙන්නප්පු ප්‍රසිද්ධ නොතාරිස් එච්. ජේ. ඩී. ෆොන්සේකා විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි නමට ලියන ලද්දාවූ ද 2005.03.28 දින හා අංක 26299 සහ 2007.09.11 දින අංක 31329 දරන බැඳුම්කර යටතේ අයවිය යුතු මුදල් ගෙවීම වර්ණකුලසූරිය අජිත් ප්‍රනාන්දු යන අය ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කර යටතේ රුපියල් දසලක්ෂ අනූදහස් අටසිය අසූවයි ශත අසූනවය (රු. 10,90,880.89) ක මුදලක් 2009.12.31 වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 10,90,880.89ක මුදලට 2010.01.01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළියද ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන්ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 26299 සහ 31329 දරන උකස් බැඳුම්කර මගින් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී වෙත උකස් කොට ඇත්තා වූද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තාවූ ද, දේපළ හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු ඊ. එස්. රාමනායක මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂක මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

### උපලේඛනය

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, මාරවිල කොට්ඨාසයෙහි ලියාපදිංචි වී ඇති, දකුණු පිටිගල් කෝරළේ, කම්මල් පත්තුවේ, දුම්මලදෙනිය බටහිරෙහි පිහිටි “දමින්නගහවත්ත” නමැති ඉඩමට බලයලත් මානක වයි. එම්. රංජිත් යාපා විසින් 2004 නොවැම්බර් මස 09 වැනි දින අංක 9058බී දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද ලොට් “1ඒ2” ලෙස ලකුණු කර ඇති ඉඩම් කොටස වන උතුරට : ටී. ඩී. කරොලිස් පීරිස් හිමිකම් කියන ඉඩමෙන් ද සහ ලාල් ප්‍රනාන්දු හිමිකම් කියන ඉඩමෙන් ද, නැගෙනහිරට : පිඹුරු අංක 9058ඒට අයත් ලොට් 2න් ද, දකුණට : පිඹුරු අංක 9058ඒ ට අයත් ලොට් 01බී වලින් ද, සහ බස්නාහිරට : ලොට් 1ඒ3 න්ද (අඩි 12ක පළලැති පාර) සහ පිඹුරු අංක 9058බී ට අයත් ලොට් 1ඒ1න් ද, මායිම් වූ ඉඩම ප්‍රකාරව පර්චස් විසිහතරයි දශම හතයි පහ (අ. 0, රූ. 0, පර්. 24.75) ක විශාල ඉඩම ප්‍රකාර අංක 9058බී දරන පිඹුරට අයත් සියලුම දේත් සමග මාරවිල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ජී 114/123 ශීර්ෂය යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රානි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
මාණ්ඩලික ලේකම්.

06-587/3

### හැටන් නැෂනල් බෑන්ක් පී.එල්.සී - නිට්ටඹුව ශාඛාව

(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව නමින් හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ හැටන් නැෂනල් බෑන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

ලොකු එදිරිසිංහ ආරච්චිගේ රෝහණ එදිරිසිංහ.

2010.04.29 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බෑන්ක් පී.එල්.සී හි අධ්‍යක්ෂක මණ්ඩලයේ රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී :

ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් පී. එන්. ඒකනායක විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බෑන්ක් පී.එල්.සී. හි නමට ලියන ලද්දාවූ ද 2007.02.12 වැනි දින හා අංක 5935 දරන බැඳුම්කර යටතේ අයවිය යුතු මුදල් ගෙවීම ලොකු එදිරිසිංහ ආරච්චිගේ රෝහණ එදිරිසිංහ යන අය ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැදුම්කරය යටතේ රුපියල් පන්ලක්ෂ හැත්තෑතුන්දහස් පන්සිය අසූඑකයි ශත තිස්හතර (රු. 5,73,581.34) ක මුදලක් 2010.02.28 වැනි දින වන විට හැටන් නැෂනල් බෑන්ක් පී.එල්.සී ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 5,73,581.34ක මුදලට 2010.03.01 වන දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළියද ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන්ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 5935 දරන උකස් බැඳුම්කර මගින් හැටන් නැෂනල් බෑන්ක් පී.එල්.සී වෙත උකස් කොට ඇත්තා වූද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තාවූ ද, දේපල හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු ඊ. එස්. රාමනායක මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බෑන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂක මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

#### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, මැද පත්තුවේ, අත්තනගල්ල ප්‍රාදේශීය සභා සීමාවේ, බෙම්මුල්ල උප කාර්යාල සීමාවේ, තිරිවානේගම, "දෙල්ගහවත්ත" නමැති ඉඩමට බලයලත් මානක ඩබ්. ඒ. යූ. සෙනරත් විසින් පිළියෙල කරන ලද 2000.03.17 දිනැති අංක 944 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් අංක 1 නමැති ඉඩමේ කොටස වන උතුරට : පාර සහ ඒ ලිසිනෝනාට අයිති ඉඩමෙන් ද, නැගෙනහිරට : ඒ. ලිසිනෝනාට අයිති ඉඩමෙන් ද, දකුණට : ඒ. ලිසිනෝනාට අයිති ඉඩමෙන් සහ ලොට් අංක 2න් ද සහ බස්නාහිරට : ලොට් 2න් සහ පාරෙන් ද මායිම් එකී අංක 944 දරන පිඹුර ප්‍රකාරව පර්චස් විස්සයි දශම දෙකයි බින්දුව (අ. 0, රූ. 0, පර්. 20.20)ක් විශාල ඉඩම ගොඩනැගිලි සහ සියළුදේත් සමග වන මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරිමේ කාර්යාලයේ ඊ 660/103 යටතේ ලියාපදිංචි කර ඇත.

මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රානි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්.

06-587/5

### හැටන් නැෂනල් බෑන්ක් පී.එල්.සී - දංකොටුව ශාඛාව

(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව නමින් හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ හැටන් නැෂනල් බෑන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

හෙට්ටිපතිරැන්නැහෙලාගේ වසන්ත කුමාර ගුණවර්ධන.

2010.03.31 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බෑන්ක් පී.එල්.සී හි අධ්‍යක්ෂක මණ්ඩලයේ රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

මීගමුව ප්‍රසිද්ධ නොතාරිස් ජී. එම්. එම්. ප්‍රනාන්දු විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බෑන්ක් පී.එල්.සී. හි නමට ලියන ලද්දාවූ ද 2004.04.07 දින අංක 810 සහ 2006.06.26 දින අංක 1587 දරන බැඳුම්කර යටතේ අයවිය යුතු මුදල් ගෙවීම හෙට්ටිපතිරැන්නැහෙලාගේ වසන්ත කුමාර ගුණවර්ධන යන අය ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කර යටතේ රුපියල් දෙලක්ෂ විසිහතරදහස් හයසිය හතරයි ශත හතලිහ (රු. 2,24,604.40) ක මුදලක් 2009.07.31 වන දින වන විට හැටන් නැෂනල් බෑන්ක් පී.එල්.සී ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 2,24,604.40ක මුදලට 2009.08.01 වන දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළියද ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන්ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 810 සහ 1587 දරන උකස් බැඳුම්කර මගින් හැටන් නැෂනල් බෑන්ක් පී.එල්.සී වෙත උකස් කොට ඇත්තා වූද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තාවූ ද, දේපල හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු අයි. ඩබ්. ජයසූරිය මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බෑන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂක මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

#### උපලේඛනය

වයඹ පළාතේ, (කුලියාපිටිය කොට්ඨාසයෙහි ලියාපදිංචි) කුරුණෑගල දිස්ත්‍රික්කයේ, පිටිගල් කෝරළේ, කටුගම්පොල හත්පත්තුවේ, ගෝනවිල මාකඳුර උප කාර්යාලය තුළ හෙට්ටිරිප්පුවහි පිහිටි "ගලගාවවත්ත" නමැති ඉඩමට බලයලත් මානක පී. එච් ඊ. මෙන්ඩිස් විසින් 1987.07.21 වැනි දින අංක 5142 දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද ලොට් "1" ලෙස ලකුණු කර ඇති ඉඩම් කොටස වන උතුරට : ඒ. එම්. බේබි නෝනා සහ එන්. ඒ. විනිෆර්ඩ් පෙරේරා හිමිකම් කියන බලයලත් මානක ඩබ්. ආර්. එස්. ප්‍රනාන්දු විසින් 1936.08.24 වැනි දින අංක 2756 දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද ලොට් " ඒ " ලෙස ලකුණු කර ඇති ඉඩමෙන් ද, නැගෙනහිරට : කලින් හේරත්හාමි හිමිකම් කියූ දැන් එම්. කේ. ඩී. නන්දසිරි හිමිකම් කියන ඉඩමෙන් ද, දකුණට : ඒ. එම්. පොඩිනෝනා, එච්. ජී. ගුණවර්ධන, ඒ. එම්. පී. ගුණවර්ධන හිමිකම් කියන ඉඩම් වලට පිවිසීමට වෙන් කරන ලද අඩි 8ක් පළලැති පාරෙන් ද සහ බස්නාහිරට : කලින් අප්පුරාළ හිමිකම් කියූ දැන් ඒ. එම්. සෝමසිරි හිමිකම් කියන ඉඩමෙන් ද මායිම් වූ ඉඩම ප්‍රකාරව රූඩ් තුනයි පර්චස් විසිහතර (අ. 0, රූ. 3, පර්. 24) විශාල ඉඩම තුළ පිහිටි ගොඩනැගිලි සහ සියළුම දේත් සමග. කුලියාපිටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එස්. 95/71 ශීර්ෂය යටතේ ලියාපදිංචි කර ඇත.

එකී අංක 810 සහ 1587 දරන බැඳුම්කරයන්හි දෙවන උපලේඛනයට අයත් ලොට් ඒ ලෙස ලකුණු කර ඇති පිඹුරේ මාර්ග අයිතියද සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රානි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණි (නීති),
මාණ්ඩලික ලේකම්.

06-587/6

---

### හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී - වැලිමඩ ශාඛාව

(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව නමින් හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

නන්දන බේකර්ස් ඇන්ඩ් රෙස්ටුරන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්.

2009.12.02 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී හි අධ්‍යක්ෂක මණ්ඩලයේ රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී :

බදුල්ල ප්‍රසිද්ධ නොතාරිස් එච්. රාජපක්ෂ විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි නමට ලියන ලද්දාවූ ද 2007.10.01 වැනි දින හා අංක 577 දරන බැඳුම්කර යටතේ පහත පළවන උපලේඛනයේ සඳහන් දේපළ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. විසින් නන්දන බේකර්ස් ඇන්ඩ් රෙස්ටුරන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ් වෙත ප්‍රදානය කරන ලද ණය සඳහා සුරැකුමක් වශයෙන් හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. වෙත නන්දන බේකර්ස් ඇන්ඩ් රෙස්ටුරන්ට් (ප්‍රයිවට්) ලිමටඩ් ණයකරු හැටියට සහ නම්බිකලු ආරච්චිගේ දොන් සුමිත් රම්‍යා ගුණසේකර නොහොත් සුමිත් රම්‍යා ගුණසේකර උකස්කරු හැටියට උකස්කර බැඳ තබා ඇති හෙයින් ද,

ඉහත සඳහන් නම්බිකලු ආරච්චිගේ දොන් සුමිත් රම්‍යා ගුණසේකර නොහොත් සුමිත් රම්‍යා ගුණසේකර යන අය එකී නන්දන බේකර්ස් ඇන්ඩ් රෙස්ටුරන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්හි කොටස් සියල්ලම පාහේ දැරීම නිසා සහ නන්දන බේකර්ස් ඇන්ඩ් රෙස්ටුරන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගමේ අධ්‍යක්ෂවරයකු වශයෙන් එම සමාගමේ පාලනය සහ කළමණාකරණය දරන නිසාත් එකී නන්දන බේකර්ස් ඇන්ඩ් රෙස්ටුරන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගමේ අත්‍යා අයිතිකරු සහ පාලනය දරන තැනැත්තා වන එකී නම්බිකලු ආරච්චිගේ දොන් සුමිත් රම්‍යා ගුණසේකර නොහොත් සුමිත් රම්‍යා ගුණසේකර යන අය ඒ අනුව, එකී නන්දන බේකර්ස් ඇන්ඩ් රෙස්ටුරන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගමට සීමාසහිත හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි බැංකුව ප්‍රදානය කළ මූල්‍ය පිළිසරණවල අත්‍යා ප්‍රතිලාභියා වන හෙයින් ද,

හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී ට අයවිය යුතු ඉතිරි මුදල් ආපසු ගෙවීම ඉහත සඳහන් නන්දන බේකර්ස් ඇන්ඩ් රෙස්ටුරන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ් සහ නම්බිකලු ආරච්චිගේ දොන් සුමිත් රම්‍යා ගුණසේකර නොහොත් සුමිත් රම්‍යා ගුණසේකර යන අයවළුන් පැහැර හැර ඇති හෙයින් සහ 2009.08.31 වැනි දිනට එකී බැඳුම්කරය යටතේ රුපියල් හතලිස්හයලක්ෂ පනස්හත්දහස් අටසිය පනස්පහයි ශත නමය (රු. 46,57,855.09) ක මුදලක් හා ඒ සඳහා 2009.09.01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළියද ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන්ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 577 දරන උකස් බැඳුම්කර මගින් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී වෙත උකස් කොට ඇත්තා වූද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තාවූ ද, දේපල හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු අයි. ඩබ්. ජයසූරිය මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂක මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

#### උපලේඛනය

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, වැලිමඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, දෙහිවිනි පළාත කෝරළේ, වැලිමඩ නාගරික සභා සීමාවේ, පල්ලේගම කොටවෙර, හේමපාල මුණසිංහ මාවතේ, වරිපනම් අංක 104හි පට්ටියමැදවත්ත නමැති ඉඩමට බලයලත් මානක පී. වික්‍රමසිංහ විසින් 2000.05.03 වැනි දින මැන සාදන ලද අංක 3897 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් අංක 01 දරන ඉඩම් කොටසට මායිම්, උතුරට : මොරගොල්ල පාරේ, වරිපනම් අංක 2/2 දරන කොටසින් ද, නැගෙනහිරට : බුහාරි හෝටලය (එච්. එම්. මාවතේ, වරිපනම් අංක 100)න් ද, දකුණට : හේමපාල මුනිදාස මාවතෙන් ද සහ බටහිරට : කොලම්බු ස්ටෝර්ස් (එච්. එම්. මාවතේ වරිපනම් අංක 106)න් ද මායිම් වූ පර්චස් තුනයි දශම එකයි හතර (අ. 0, රූ. 0. පර්. 3.14) ක් විශාලත්වය ඇති ඉඩම ඒ තුළ පිහිටි ගොඩනැගිලි, සහ සියළු දේත් සමග වන මෙය බදුල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී 520/259 යටතේ ලියාපදිංචි කර ඇත.

මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රානි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණි (නීති),
අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්.

06-587/1

---

### රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

1981හි අංක 62 දරන පනතින් හා 1984හි අංක 29 දරන පනතින් සංශෝධිත පරිදි 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැණුනු යෝජනාව

ණය අංකය : 12/61942/ඩී12/252.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2003.03.07 වැනි දින පැවැත්වුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කරන ලදී :-

1. බදුල්ල ප්‍රසිද්ධ නොතාරිස් අයි. එම්. පී. ආනන්ද විසින් සහතික කරන ලද 1998.06.15 දින හා අංක 5920 දරන උකස් බැඳුම්කර මත

අයවිය යුතු මුදල් ගෙවීම, උඩුකිඳ පදිංචි කරුණාවත්ත දිසානායක මුදියන්සේලාගේ නිමල් කීර්ති පියසිරි සහ කරුණාවත්ත දිසානායක මුදියන්සේලාගේ පුංචි බණ්ඩා යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, 2003.02.09 දිනට මුල් ණය මුදල හා එය මත පොළී වශයෙන් රුපියල් එක්ලක්ෂ හැත්තෑ හතර දහස් අසූහයයි ශත අසූතුන (රු. 1,74,086.83)ක මුදලක් ද, පූර්වෝක්ත බැඳුම්කර අංක 5920 ප්‍රකාර ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිම කරන දිනය වනතුරු දිනකට රුපියල් අසූ දෙකයි ශත හැට (රු. 82.60) බැගින් වැඩිපුර පොළිය ද අයවිය යුතුව ඇති බැවින් ද, (මෙදිනට පසු කරන ලද ගෙවීම් අඩු කරන්න)

2. මෙම දැන්වීමේ පළමුවැනි ඡේදයේ දක්වා ඇති එකී මුදල සහ 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 57 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතුව ඇති වියදම් හා මුදල් ආපසු අයකර ගැනීම උදෙසා මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට උකස්කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා සංශෝධන සහිත 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය ප්‍රකාර බදුල්ල, කළුගල්පිටිය, අංක 48/1හි බලයලත් වෙන්දේසිකාර ඩබ්. ජයතිලක මහතාට බලය පැවරිය යුතු වන්නේ ය.

### උපලේඛනය

බදුල්ල දිස්ත්‍රික්කයේ, ඌව පරණගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කැටගොඩ පිහිටි පරදෙහිඅරාවේවත්ත නමැති ඉඩමට 1997.02.16 දින බලයලත් මිනින්දෝරු එස්. පී. රත්නායක විසින් මැන සකසන ලද අංක 1093 දරන පිඹුරේ කැබලි අංක 1 ලෙස බෙදා වෙන් කර දක්වා ඇති ප්‍රමාණයෙන් රූඩ් එකයි, පර්චස් තිස් පහයි දශම බිංදුවයි අටක් (අ. 0, රූ. 0, පර්. 35.08)ක් වූ බිම් කොටස සමග සියළු දේත් සමග වේ.

අයි. විමලසේන,
*වැඩබලන සාමාන්‍යාධිකාරී.*

2010 ජුනි මස 11 වැනි දින,
අංක 269,
ගාලු පාර, කොළඹ 03.

06-608/8

---

### රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

1981හි අංක 62 දරන පනතින් හා 1984හි අංක 29 දරන පනතින් සංශෝධිත පරිදි 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැණුනු යෝජනාව

ණය අංකය : 1/45086/සීඩී8/360.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2008.10.20 වැනි දින පැවැත්වුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කරන ලදී :-

1. කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එන්. එච්. කේ. ජී. පී. ද සිල්වා විසින් සහතික කරන ලද 2004.01.01 දින හා අංක 2691 දරන උකස් බැඳුම්කර මත අයවිය යුතු මුදල් ගෙවීම, බත්තරමුල්ල පදිංචි සැන්ඩ්‍රා ප්‍රියංජලී වීරසිංහ නොහොත් වැලිගම පල්ලිය ගුරුගේ සැන්ඩ්‍රා ප්‍රියංජලී නානායක්කාර සහ නිමල් වීරසිංහ යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, 2008.09.25 දිනට මුල් ණය මුදල හා එය මත පොළී වශයෙන් රුපියල් හාරලක්ෂ හැත්තෑ නවදහස් හාරසිය තිස්හයයි ශත හතලිස් දෙක (රු. 4,79,436.72)ක මුදලක් ද, පූර්වෝක්ත බැඳුම්කර අංක 2691 ප්‍රකාර ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිම කරන දිනය වනතුරු දිනකට රුපියල් දෙසීය හයයි ශත අසූඅට (රු. 206.88) බැගින් වැඩිපුර පොළිය ද අයවිය යුතුව ඇති බැවින් ද, (මෙදිනට පසු කරන ලද ගෙවීම් අඩු කරන්න)

2. මෙම දැන්වීමේ පළමුවැනි ඡේදයේ දක්වා ඇති එකී මුදල සහ 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 57 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතුව ඇති වියදම් හා මුදල් ආපසු අයකර ගැනීම උදෙසා මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට උකස්කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා සංශෝධන සහිත 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය ප්‍රකාර කොළඹ 12, උසාවිය පාර, අංක 186/2හි බලයලත් වෙන්දේසිකාර කේ. පී. එන්. සිල්වා මහතාට බලය පැවරිය යුතු වන්නේ ය.

### උපලේඛනය

කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, කඩුවෙල ප්‍රාදේශීය සභා සීමාවේ බත්තරමුල්ල ඒකකය තුළ බත්තරමුල්ල පිහිටි දෙල්ගහවත්ත නමැති ඉඩමට 1992.08.11 දින බලයලත් මිනින්දෝරු ඩී. ටී. ඒ. දිසානායක විසින් බෙදා වෙන් කර සකසන ලද අංක 148 දරන පිඹුරේ කැබලි අංක 06 ලෙස සඳහන් ප්‍රමාණයෙන් පර්චස් දහයයි දශම හයක් (අ. 0, රූ. 0, පර්. 10.6) වූ බිම් කොටස.

මෙය හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ජී 976/77 යටතේ ලියාපදිංචි කර ඇත.

අයි. විමලසේන,
*වැඩබලන සාමාන්‍යාධිකාරී.*

2010 ජුනි මස 11 වැනි දින,
අංක 269,
ගාලු පාර, කොළඹ 03.

06-608/7

---

### රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

1981හි අංක 62 දරන පනතින් හා 1984හි අංක 29 දරන පනතින් සංශෝධිත පරිදි 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැණුනු යෝජනාව

ණය අංකය : 2/76944/එක්ස්2/138.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය 2010.03.01 වැනි දින පැවැත්වුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කරන ලදී :-

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එච්. එම්. කුලතිලක විසින් සහතික කරන ලද 2006.09.14 දින හා අංක 685 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, වැබොඩ පදිංචි සුදේශ් ජයනාත් ජයසූරිය යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, 2010.02.26 දිනට මුල් ණය

මුදල හා එය මත පොළී වශයෙන් රුපියල් පන්ලක්ෂ හැත්තෑ හතර දහස් පන්සිය හතලිස් අටයි ශත පනස්එක (රු. 5,74,548.51)ක මුදලක් ද, පූර්වෝක්ත බැඳුම්කර අංක 685 ප්‍රකාර ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිම කරන දිනය වනතුරු දිනකට රුපියල් දෙසිය හැත්තෑ නවයයි ශත හතලිහ (රු. 279.40) බැගින් වැඩිපුර පොළිය ද අයවිය යුතුව ඇති බැවින් ද, (මෙදිනට පසු කරන ලද ගෙවීම් අඩු කරන්න).

2. මෙම දැන්වීමේ පළමුවැනි ඡේදයේ දක්වා ඇති එකී මුදල සහ 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 57 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතුව ඇති වියදම් හා මුදල් ආපසු අයකර ගැනීම උදෙසා මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට උකස්කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා සංශෝධන සහිත 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය ප්‍රකාර කොළඹ 12, බෙල්මන්ට් වීදිය, අංක 09හි බලයලත් වෙන්දේසිකාර එස්. මනම්පේරි මෙනවියට බලය පැවරිය යුතු වන්නේ ය.

### උපලේඛනය

ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, (අධිකාරි පත්තුවේ ලෙස ලියාපදිංචි වී ඇති) මහර මැද පත්තු මහර ප්‍රාදේශීය සභා සීමාව තුළ වැබොඩ ගමේ පිහිටි මිල්ලගහවත්ත ඉඩමට 1995.05.09 දින බලයලත් මිනින්දෝරු එල්. ජී. සි. පෙරේරා විසින් මැන සකසන ලද අංක 721 දරන පිඹුරේ කැබලි අංක (4බී ලෙස බෙදා වෙන් කර දක්වා ඇති ප්‍රමාණයෙන් අ. 0, රූ. 0, පර්. 14.5ක් වූ බිම් කොටස

මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී 536/196 යටතේ ලියාපදිංචි වී ඇත.

මෙම ඉඩමට ප්‍රවේශ මාර්ගය ලෙස බලයලත් මිනින්දෝරු එල්. ජේ. ලියනගේ විසින් අංක 6558 දරන පිඹුරේ කැබලි අංක 1ජී සහ 1995.02.08 දින බලයලත් මිනින්දෝරු එල්. ඒ. ජී, පෙරේරා විසින් අංක 664 දරන පිඹුරේ කැබලි අංක ආර් 1 සහ ආර්2 සහිත වේ.

අයි. විමලසේන,
*වැඩබලන සාමාන්‍යාධිකාරී.*

2010 ජූනි මස 11 වැනි දින,
අංක 269,
ගාලු පාර, කොළඹ 03.

06-608/6

---

### රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

ලංකා සංවර්ධන මුදල් සංස්ථාව යනුවෙන් කලින් හැඳින්වුණු ඩීඑෆ්සීසි බැංකුව නමට කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ආර්. එස්. විජේසේකර ලියා සහතික කළ අංක 939 හා 1997 ඔක්තෝබර් මස 22 වන දින දරන උකස් බැඳුම්කරය මත සහ අංක 1007 හා 1998 අප්‍රේල් 01 දින දරන උකස් බැඳුම්කරය මතද, ප්‍රසිද්ධ නොතාරිස් එස්. එම්. ගුණරත්න ලියා සහතික කළ අංක 1187 හා 2001 ජනවාරි මස 12 වැනි දින දරන උකස් බැදුම්කරය මතද අයවිය යුතු මුදල් ගෙවීම් 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ යථා පරිදි සංස්ථාගත කර ඇති හා ලියාපදිංචි කාර්යාලය ගම්පොල පිහිටා ඇති සමාගමක් වන (මෙහි මින්මතු "සමාගම"

යනුවෙන් සඳහන් කරනු ලබන) ෂෙරිනා පෝල්ට්‍රි ෆාම් (ප්‍රයිවෙට්) ලිමිටඩ් සමාගම විසින් සහ ගලප්පතුගේ සංක ලසංග ජිනදාස යන අය විසින් පැහැර හැර ඇති හෙයින්ද, කොළඹ, ප්‍රසිද්ධ නොතාරිස් එස්. එම්. ගුණරත්න ලියා සහතික කළ අංක 1188 හා 2001 ජනවාරි මස 12 වැනි දින දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම සමාගම විසින් සහ ගලප්පතුගේ සංක ලසංග ජිනදාස, හෙට්ටිහේවගේ ඉන්ද්‍රා ජිනදාස සහ ගලප්පතුගේ ජිනදාස යන අය විසින් පැහැර ඇති හෙයින්ද,

ඉහත සඳහන් අංක 1188 දරන උකස් බැඳුම්කරය මත 2008 අප්‍රේල් මස 01 වැනි දින ඉහත කී සමාගමෙන් සහ ගලප්පතුගේ සංක ලසංග ජිනදාස, හෙට්ටිහේවගේ ඉන්ද්‍රා ජිනදාස හා ගලප්පතුගේ ජිනදාස යන අයගෙන් ඩීඑෆ්සීසී බැංකුවට රුපියල් එක්කෝටි හැටහත් ලක්‍ෂ විසිහතර දහස් තුන්සිය පණස් නවයක (රු. 1,67,24,359) මුදලක් සහ 2008 අප්‍රේල් 02 වන දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් අසූතුන් ලක්‍ෂ තිස්තුන් දහස් තුන්සියයක් (රු. 83,33,300) සඳහා එක් එක් වර්ෂයේ අප්‍රේල් 01, සහ ඔක්තෝබර් මස 01 යන දිනවලදී ප්‍රතිශෝධනය කර, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සතිපතා පදනම මත පළකරනු ලබන බරතැබූ මධ්‍යක තැන්පතු පොලී අනුපාතිකයට (ඒ. ඩබ්ලිව්. ඩී. ආර්.) වර්ෂයකට සියයට එකොළහක් (11%) ඉහල අනුපාතිකයක් මත ගණන් බලනු ලබන, ආසන්නතම ඉහල 0.5%ට තීන්දු කරන අනුපාතිකය මත පොලිය ද, ඉහත සඳහන් අංක 939, 1007 සහ 1187 දරන උකස් බැඳුම්කර මත, ඉහත කී සමාගමෙන් හා ගලප්පතුගේ සංක ලසංග ජිනදාස යන අයගෙන් ඩීඑෆ්සීසී බැංකුවට රුපියල් හාරකෝටි හැට ලක්‍ෂ හතළිස් නව දහස් අටසිය පණස් අටකුත් ශත තුනක (රු. 4,60,49,858.03) මුදලක් සහ 2008 අප්‍රේල් 02 දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් තිස් හය ලක්‍ෂ තිස් හතර දහස් එකසිය දොළහක් (රු. 36, 34,112) සඳහා, එක් එක් වර්ෂයේ අප්‍රේල් 01 සහ ඔක්තෝබර් මස 01 යන දින වලදී ප්‍රතිශෝධනය කර ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සතිපතා පදනම මත පළකරනු ලබන බරතැබූ මධ්‍යක මූලික ණය පොලී අනුපාතිකයට (ඒ. ඩබ්ලිව්. පී. ආර්.) සියයට හයක් (6%) ඉහල අනුපාතිකයක් මත ගණන් බලනු ලබන, ආසන්නතම ඉහල 0.5%ට තීන්දු කරන අනුපාතිකය මත පොලිය සහ රුපියල් එක්කෝටි අනූඑක් ලක්‍ෂ හැට හය දහස් පන්සිය පණහක් (රු. 1,91,66,550) සඳහා එක් එක් වර්ෂයේ අප්‍රේල් 01 සහ ඔක්තෝබර් 01 යන දිනවලදී ප්‍රතිශෝධනය කර ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සතිපතා පදනම මත පළකරනු ලබන බරතැබූ මධ්‍යක මූලික තැන්පතු පොලී අනුපාතිකයට (ඒ. ඩබ්ලිව්. ඩී. ආර්.) වර්ෂයකට සියයට එකොළහක් (11%) ඉහල අනුපාතිකයක් මත ගණන් බලනු ලබන ආසන්නතම ඉහල 0.5%ට තීන්දු කරන අනුපාතිකය මත පොලියද ලැබිය යුතු හා අයවිය යුතුව ඇති හෙයින් ද,

ඉහත සඳහන් උකස් බැඳුම්කර මත අයවිය යුතු මුළු මුදල වන රුපියල් හයකෝටි විසිහත් ලක්‍ෂ හැත්තෑ හතර දහස් දෙසිය දහහතකුත් ශත තුනක (රු. 6,27,74,217.03) මුදල සහ 2008 අප්‍රේල් 02 දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් තිස් හය ලක්‍ෂ තිස්හතර දහස් එකසිය දොළහක් (රු. 36,34,112) සඳහා එක් එක් වර්ෂයේ අප්‍රේල් 01 සහ ඔක්තෝබර් මස 01 යන දිනවලදී ප්‍රතිශෝධනය කර ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සතිපතා පදනම මත පළකරනු ලබන බරතැබූ මධ්‍යක මූලික ණය පොලී අනුපාතිකයට වර්ෂයකට සියයට හයක් ඉහල අනුපාතිකය මත ගණන් බලනු ලබන, ආසන්නතම ඉහල 0.5%ට තීන්දු කරන අනුපාතිකය මත පොලියද, රුපියල් දෙකෝටි හැත්තෑ හතර ලක්‍ෂ අනූනව දහස් අටසිය පනහක් (රු. 2,74,99,850) සඳහා එක් එක් වර්ෂයේ අප්‍රේල් 1 සහ ඔක්තෝබර් 01 යන දිනවලදී ප්‍රතිශෝධනය කර ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සතිපතා පදනම මත පළකරනු ලබන බරතැබූ මධ්‍යක තැන්පතු පොලී අනුපාතිකය (ඒ. ඩබ්ලිව්. ඩී. ආර්.) වර්ෂයකට සියයට එකොළහක් (11%) ඉහල අනුපාතිකය මත ගණන් බලනු ලබන ආසන්නතම ඉහල 0.5% වාර්ෂික අනුපාතිකයට තීන්දු කරන අනුපාතිකය මත පොලිය හෝ විකිණීමේ දිනට එයින් නොගෙවා ඉතිරිව ඇති යම් කොටසක් මීට අදාල ඉඩම හා පරිශ්‍රය සහ එහි පිහිටි පිරියත, යන්ත්‍ර සූත්‍ර හා උපකරණ විකිණීම පිළිබඳ ප්‍රචාරක ගාස්තු හා විකිණීමේ ගාස්තු 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වන වගන්තියට අනුව හා එකී උකස් බැඳුම්කර වල ප්‍රතිඥප්ති අනුව ඩීඑෆ්සීසී බැංකුව වැය කර ඇති සියලු මුදල් හා දරා ඇති සියලු වියදම් හා ගාස්තුද සමග අයකර ගැනීම සඳහා ඉහත කී අංක 939, 1007, 1188 හා 1187 දරන උකස් බැඳුම්කර මගින් ඩීඑෆ්සීසී බැංකුව වෙත උකස් කර ඇති මෙහි පහත විස්තර කරන ඉඩම සහ පරිශ්‍රය හා එහි පිහිටි පිරියත, යන්ත්‍රසූත්‍ර හා උපකරණ කොළඹ බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහතුන් ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් සහ සංශෝධිත පරිදිවූ 1955 අංක 35 දරන ලංකා සංවර්ධන මුදල් සංස්ථා පනතින් පැවරී ඇති බලතල යටතේ ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්‍ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කරයි.

**අංක 939, 1007 හා 1187 දරන උකස් බැඳුම්කර මගින් උකස් කරන ලද දේපළ විස්තරය**

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, ගම්පොල ලියාපදිංචි කිරීමේ දිස්ත්‍රික්කයේ, උඩ පළාත, ගඟ ඉහළ කෝරළේ ගම්පොළවෙල පිහිටි "මාරියාවත්ත එස්ටේට්" නමැති වත්තේ, මාරියාවත්ත ඩිවිෂන් යනුවෙන් හැඳින්වෙන කොටසෙන් බෙදා වෙන්කළ කොටස් වන, (ඒ) බලයලත් මිනින්දෝරු එස්. එම්. තල්වත්ත විසින් මැන සාදන ලද අංක 1676 හා 1966 ජනවාරි මස 7 වැනි දින සහ මාර්තු 21 දින දරන පිඹුරේ ලොට් අංක 1 ලෙස ලකුණු කළ අ. 2. රූ. 0, ප. 0 බිම් ප්‍රමාණයෙන් යුත් බිම් කට්ටියද (බී) එකී අංක 1676 දරන පිඹුරේ ලොට් අංක 2 ලෙස ලකුණු කළ අ. 3, රූ. 0, ප. 0 බිම් ප්‍රමාණයෙන් යුත් බිම් කට්ටියද (සී) එකී බලයලත් මිනින්දෝරු එස්. එම්. තල්වත්ත විසින් මැන සාදන ලද අංක 1706 හා 1966 මාර්තු 16 දින දරන පිඹුරේ ලොට් අංක 1, 2 සහ 3 ලෙස ලකුණු කළ අ. 11, රූ. 0, ප. 23 බිම් ප්‍රමාණයකින් යුතු බිම් කට්ටිද, (ඩී) එකී බලයලත් මිනින්දෝරු එම්. එස්. තල්වත්ත විසින් මැන සාදන ලද අංක 1707 හා 1966 මාර්තු 18 දින දරන පිඹුරේ ලොට් අංක 1, 2 හා 3 ලෙස ලකුණු කළ අ. 5, රූ. 3, ප. 02 බිම් ප්‍රමාණයකින් යුත් බිම් කට්ටිද (ඊ) එකී බලයලත් මිනින්දෝරු තල්වත්ත විසින් මැන සාදන ලද අංක 1736 හා 1966 මැයි 13 හා 25 දින දරන පිඹුරේ ලොට් අංක 1, 2 සහ 3 ලෙස ලකුණු කල අ. 13, රූ. 0, ප. 26 බිම් ප්‍රමාණයකින් යුත් බිම් කට්ටිද යන බෙදා වෙන්කළ එකට යාවූ ඒකාබද්ධ බිම් කට්ටිවලින් සමන්විත හා සංයුක්ත, බලයලත් මිනින්දෝරු ඩී. ඒ. ජයගොඩ විසින් මැන සාදන ලද අංක 1341 හා 1976 මාර්තු 01 සිට 14 දක්වා දින දරන පිඹුරේ ලොට් අංක 1, 2, 4, 5, 6, 7, 8, 9, 10, 11 සහ 12 ලෙස දැක්වෙන බෙදා වෙන්කළ සහ එකට යාවූ තනි දේපළක් සංයුක්ත වන ඉහත කී අංක 1341 දරන පිඹුරේ පෙන්නුම් කර තිබෙන ඒකාබද්ධ දේපළට එකී අංක 1341 දරන පිඹුර ප්‍රකාර මායිම් උතුරට : රජයට අයත් මෙම ඉඩමේ ඉතිරි කොටස සහ ලොට් අංක 3 වෙන් වන පාර ද, නැගෙනහිරට: මහවැලි ගඟ ද දකුණට : මෙම ඉඩමේ ඉතිරි කොටස සහ පාර ද, බස්නාහිරට : රජ ඇළ සහ මෙම ඉඩමේ ඉතිරි කොටස ද යන මායිම් ඇතුළත් මුළු බිම් ප්‍රමාණය අක්කර තිස් පහකුත් පර්චස් එකොළහක් (අ. 35, රූ. 0, ප. 11) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම සහ එහි පිහිටි "ෂෙරිනා පෝල්ට්‍රි ෆාම්" යනුවෙන් හැඳින්වෙන හා ප්‍රකට කුකුළු ගොවිපළ, කුකුළු මඩු, බිත්තර රක්කවීමේ ගොඩනැගිලි, ෆීඩ් මික්සිං ඇන්ඩ් එග් රූම්, කාර්යාල ගොඩනැගිලි, නිවාස, ගරාජය, වඩුමඩු, ටැංකි, ට්‍රාන්ස්ෆෝමර්, ළිඳ, ගසකොළ, වැවිලි සහ වෙනත් සියලු දේ. මෙම ඉඩම ගම්පොළ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර ඇත.

| *විස්තර* | *ප්‍රමාණය* |
|---|---|
| ඉන්කියුබේටර් ඇන්ඩ් සෙටර් ජේම්ස් වේ (කැනඩා) ධාරිතාව එකක් පැටවුන් 15120/හැචර් | 04 |
| වර්ටිකල් ෆීඩ් මික්සර් ප්‍රිසිෂන් (ඉන්දියාව) ධාරිතාව පැයට ටොන් 3 | 02 |
| ජෙනරේටරය ඩේල් (කැනඩා) | 01 |
| ග්‍රේන් සිස්ටම් ඉන්කොර්පරේටඩ් Usi Silo සිස්ටම් මොඩ්ල් NCL 24-14 UO | 01 |
| චේන් ෆීඩර් හවුසිං සිස්ටම් | 02 |

**අංක 1188 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කරන ලද දේපළ විස්තරය**

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, ගම්පොල ලියාපදිංචි කිරීමේ කොට්ඨාසයේ, උඩ පළාත, ගඟ ඉහළ කෝරළේ ගම්පොළවෙල පිහිටි "මාරියාවත්ත එස්ටේට්" නැමති වත්තේ "මාරියාවත්ත ඩිවිෂන් " යනුවෙන් හැඳින්වෙන කොටසෙන් බෙදා වෙන්කළ බලයලත් මිනින්දෝරු එස්. එම්. තල්වත්ත විසින් මැන සාදන ලද අංක 1704 හා 1966 මාර්තු මස 18 සහ 21 වැනි දින දරන පිඹුරේ දැක්වෙන අක්කර පහක (අ. 5, රූ. 0, ප. 0) බිම් ප්‍රමාණයෙන් යුක්ත නිශ්චිත හා බෙදා වෙන් කළ බිම් කට්ටියට එකී පිඹුරට අනුව මායිම් උතුරු-නැගෙනහිරට : මෙම ඉඩමේ ඉතිරි කොටසට යාබද පාර ද, දකුණු -නැගෙනහිරට : බලයලත් මිනින්දෝරු එස්. එම්. තල්වත්ත විසින් මැන සාදන ලද අංක 1707 දරන පිඹුරේ දැක්වෙන මෙම ඉඩමේ ඉතිරි කොටස ද, දකුණු-බස්නාහිරට : ඇළේ රිසවේසම සහ බලයලත් මිනින්දෝරු එස්. එම්. තල්වත්ත විසින් මැන සාදන ලද අංක 1676 දරන පිඹුරේ දැක්වෙන මෙම ඉඩමේ ඉතිරි කොටසට යාබද පාර ද, බස්නාහිරටඃ මෙම වත්තේ වතු පාරද යන මායිම් ඇතුළත පිහිටි ඉඩම වේ. මෙම ඉඩම ගම්පොළ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර ඇත.

| *විස්තරය* | *ප්‍රමාණය* |
|---|---|
| බ්‍රීඩර් හවුස් චේන් ෆීඩර් සිස්ටම් | 4 |
| පැලට් හවුස් චේන් ෆීඩර් සිස්ටම් | 2 |
| කේ. වී. ඒ. 200 ජෙනරේටර් (එෆ්. ජී. විල්සන්) | 1 |

ඒ. එන්. ෆොන්සේකා,
අධ්‍යක්‍ෂ/සාමාන්‍යාධිකාරී.

ඩීඑෆ්සීසී බැංකුව,
73/5, ගාලුපාර,
කොළඹ 3

06-617

---

**රුහුණ සංවර්ධන බැංකුව - තිස්සමහාරාම ශාඛාව**

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ රුහුණු සංවර්ධන බැංකුවේ අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැණුනු යෝජනාව

1997 අංක 06 දරන ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනත යටතේ සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ මුල්‍ය මණ්ඩලය විසින් නිකුත් කරන ලද 1998.04.24 දින දරන අති විශේෂ ගැසට් නිවේදනයට අනුව පිහිටුවනු ලැබූ රුහුණ සංවර්ධන බැංකුව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, 2009 ඔක්තෝබර් මස 28 වැනි දින පවත්වන ලද රුහුණ සංවර්ධන බැංකුවේ අධ්‍යක්‍ෂ මණ්ඩල රැස්වීමේදී පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලදී.

රුහුණ සංවර්ධන බැංකුව නමට නීතිඥ සහ ප්‍රසිද්ධ නොතාරිස් ක. ද. හේ. පියසේන මහතා විසින් සහතික කරන ලද 2007.07.23 දිනැති අංක 2244 උකස්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම තිස්සමහාරාම, බෙලිගාල, කු. ග. 03, අංක 669 ලිපිනයේ පදිංචි සමරවික්‍රම කංකානම්ගේ චිත්‍රසේන යන අය විසින් පැහැර හැර ඇති බැවින්ද, එකී උකස්කරය යටතේ රුපියල් දෙලක්‍ෂ අටදහස් නවසිය විස්සක (රු. 208,920) මුදලක් රුහුණ සංවර්ධන බැංකුව වෙත ගෙවීමට ඇති බැවින්ද, 2009.06.24 දින සිට වර්ෂයකට 24% බැගින් රුපියල් දෙලක්‍ෂ අටදහස් නවසිය විස්සක (රු. 208,920) ක මුදලක් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොලිය හා වෙන්දේසි වියදම් ද සමඟ අනතුරුව කිසියම් මුදලක් ලැබීමට ඇත්නම් ඒවාද ඇතුළුව එකී මුදල අයකර ගැනීම සඳහා මාතර බලයලත් වෙන්දේසිකාර ජී. පී. ආනන්ද මහතා විසින් එකී අංක 2244 දරන උකස්කරය යටතේ බැංකුවට උකස්කර ඇති දේපල සහ පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි එකී බැංකුවේ අධ්‍යක්‍ෂ මණ්ඩලය මෙයින් තීරණය කරනු ලැබේ.

**උකස්කර ඇති දේපල පිළිබඳ විස්තර**

දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, මාගම්පත්තුවේ, ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පරාක්‍රමපුර ග්‍රාම නිලධාරී වසමේ වම් ඉවුර - කුඩා ගම් 03 නැමති ගමේ පිහිටා ඇත්තාවූද, සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අංක 54 දරන ක්ෂේත්‍ර පත්‍රයෙහි අංක 02 දරන පිඹුරෙහි අංක 2749 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තාවූ ඉඩමට මායිම් උතුරට : අංක 2748, 2747, 2746 දරන ඉඩම් ද, නැගෙනහිරට : අංක 2746 දරන බිම් කැබැල්ල ද, දකුණට : අංක 2750, 2756 දරන බිම් කැබැලි ද, බස්නාහිරට : අංක 2756 දරණ බිම් කැබැල්ල ද, යන සතර මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් හෙක්ටයාර් දෙකක් විශාලත්වය ඇති ඉඩම සහ එහි තුළ පිහිටි ගහකොළ, පළතුරු, ගොඩනැගිලි ආදී සියළු දේද වේ. (හෙක්ටයාර් 0.2).

එකී ඉඩම හම්බන්තොට ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ 314/417/2000 වංවල 17/166හි 2007.07.23 දින ලියාපදිංචි වී ඇත.

අධ්‍යක්‍ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඒ. ප්‍රතාපසිංහ,
සාමාන්‍යාධිකාරී.

රුහුණ සංවර්ධන බැංකුව,
ප්‍රධාන කාර්යාලය, පඹුරන, මාතර.

06-485/1

---

**රුහුණ සංවර්ධන බැංකුව - ඇල්පිටිය ශාඛාව**

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ රුහුණ සංවර්ධන බැංකුවේ අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැණුනු යෝජනාව

1997 අංක 06 දරන ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනත යටතේ සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ මුල්‍ය මණ්ඩලය විසින් නිකුත් කරන ලද 1998.04.24 දින දරන අති විශෙෂ ගැසට් නිවේදනයට අනුව පිහිටුවනු ලැබූ රුහුණ සංවර්ධන බැංකුව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර,

2009 දෙසැම්බර් මස 11 දින පවත්වන ලද රුහුණ සංවර්ධන බැංකුවේ අධ්‍යක්‍ෂ මණ්ඩල රැස්වීමේදී පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලදී.

රුහුණ සංවර්ධන බැංකුව නමට නීතිඥ සහ ප්‍රසිද්ධ නොතාරිස් එස්. එම්. පී. සිල්වා මහතා විසින් සහතික කරන ලද 2005.03.03 දිනැති අංක 180 උකස්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම "බණ්ඩාර", අම්බන (උතුර), කහදූව ලිපිනයේ පදිංචි ජයලත් තන්ත්‍රිගේ ලලිත් ලසන්ත ජයලත් සහ බණ්ඩාරිගොඩ චතුරානි ශාන්ති කුමාරි යන අය

විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කරය යටතේ රුපියල් එක්ලක්ෂ පනස්තුන්දහස් පන්සිය හත්ලිස් පහයි ශත පනස් දෙකක (රු. 1,53,545.52) මුදලක් රුහුණ සංවර්ධන බැංකුව වෙත ගෙවීමට ඇති බැවින් ද, 2007.11.30 දින සිට වර්ෂයකට 20% බැගින් රුපියල් එක්ලක්ෂ පනස්තුන්දහස් පන්සිය හතලිස් පහයි ශත පනස් දෙකක (රු. 1,53,545.52) මුදලක් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොලිය හා වෙන්දේසි වියදම් ද සමග අනතුරුව කිසියම් මුදලක් ලැබීමට ඇත්නම් ඒවාද ඇතුළුව එකී මුදල අයකර ගැනීම සඳහා මාතර බලයලත් වෙන්දේසිකාර ජී. පී. ආනන්ද මහතා විසින් එකී අංක 180 දරන උකස්කරය යටතේ බැංකුවට උකස්කර ඇති දේපළ සහ පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි එකී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරනු ලැබේ.

#### උකස්කර ඇති දේපළ පිළිබඳ විස්තර

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, බෙන්තර වලල්ලාවිටි කෝරළයේ (නැගෙනහිර) බටුවන්හේන ගමේ පිහිටියාවූ බලයලත් මානක එස්. කොඩිකාර මහතා විසින් වර්ෂ 1999.09.15 දින මැන සකස් කරන ලද අංක මු. පි. ගා. 2939 දරන පිඹුරේ සවිස්තරව දැක්වෙන (මු. පි. ගා 2245 දරන පිඹුරේ 1 වැනි බිම් කැබැල්ලෙන් කොටසක් වන) ඉගල්කන්දවත්ත නමැති ඉඩම බෙදා වෙන් කළ අංක 17 දරන බිම් කැබැල්ල නම්වූ (ඉගල්කන්ද නිවාස නියාමක ව්‍යාපෘතිය) උතුරට : කැබලි අංක 18, ගම් සභා මාර්ගය සහ කැබලි අංක 16 ද, නැගෙනහිරට : කැබලි අංක 16 ද, දකුණට : කැබලි අංක 16, කැබලි අංක 30, කැබලි අංක 29, 1/2 ද, බස්නාහිරට : කැබලි අංක 18 ද, යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් හෙක්ටයාර් බිංදුවයි දශම බිංදුවයි පහයි තුනක් (හෙක්. 0.053) විශාල මුළු බිම් කැබැල්ල සහ එහි තුළ පිහිටි සියළු දේද, ඉහත කී අංක මු. පි. ගා. 2939 දරන පිඹුරේ මාර්ග ලෙස දක්වා ඇති සියළුම බිම් කැබලි පාවිච්චි කිරීමේ මාර්ග අයිතියද වේ.

එකී ඉඩම ගාල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බී 421/246හි වංචල 10/125හි 2005.03.07 දින ලියාපදිංචි වී ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඒ. ප්‍රතාපසිංහ,
සාමාන්‍යාධිකාරී.

2009 දෙසැම්බර් මස 15 වැනි දින.
රුහුණ සංවර්ධන බැංකුව,
ප්‍රධාන කාර්යාලය,
පමුරන, මාතර.

06-529

---

### සෙලාන් බැංකුව පීඑල්සී - මහරගම ශාඛාව සහ කෝපරේට් බෑන්කිං යුනිට්

2007 අංක 07 දරන සමාගම් පනත අනුව යොමුව පීකිවු 9 යටතේ ලියාපදිංචි කර ඇත

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2010.04.06 දින පවත්වන්නට යෙදුනු රැස්වීමේ දී, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ගිණුම් අංකය : 0040-122532-001 සහ 0864-040269-001.

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යොමු අංක පීකිව් 9 යටතේ ලියාපදිංචි කර ඇත) ප්‍රසිද්ධ නොතාරිස් පී. ආර්. ද ලිවේරා විසින් සියල්ල සහතික කරන ලද 1994 ඔක්තෝබර් මස 04 දිනැති අංක 2503, ප්‍රසිද්ධ නොතාරිස් ඒ. ඩබ්ලිව්. ඒ. එමැනුවෙල් විසින් සහතික කරන ලද 1996 මැයි මස 17 වැනි දිනැති අංක 1326, ප්‍රසිද්ධ නොතාරිස් ඩී. පී. එල්. එච්. එච්. සිල්වා විසින් සහතික කරන ලද 1996 නොවැම්බර් මස 19 දිනැති අංක 84 සහ ප්‍රසිද්ධ නොතාරිස් එම්. ට්. එස්. පීරිස් විසින් සහතික කරන ලද 1997 සැප්තැම්බර් මස 5 දිනැති අංක 95, ප්‍රසිද්ධ නොතාරිස් පී. එස්. ආර්. රාජකරුණා විසින් සහතික කරන ලද 2000 ජූලි මස 24 දිනැති අංක 375, ප්‍රසිද්ධ නොතාරිස් ජී. ඒ. සී. පෙරේරා විසින් සහතික කරන ලද 2008 ජූලි 3 දිනැති අංක 509, ප්‍රසිද්ධ නොතාරිස් ජී. එස්. එන්. රාජකරුණා විසින් සහතික කරන ලද 2000 ජූලි 24 දිනැති අංක 376 සහ ප්‍රසිද්ධ නොතාරිස් ජී. ඒ. සී. පෙරේරා විසින් සහතික කරන ලද 2008 ජූලි මස 3 වැනි දිනැති අංක 510 දරන බැඳුම්කර මත අයවිය යුතු මුදල් ගෙවීම, කොට්ටාව ව්‍යාපාර ලියාපදිංචි අංක ඩබ්ලිව් 43183 දරන කුමුදු එන්ටර්ප්‍රයිසස් යන නාමය විලාශය සහ අභිධානය යටතේ තනි ස්වාමිත්වයේ ව්‍යාපාරයක් පවත්වාගෙන යන තුෂාන් රත්නපාල මාපටුන යන අය බන්ධනදායී වශයෙන් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කර යටතේ රුපියල් හාරකෝටි අනූදෙලක්ෂ අනූපන්දහස් එකසිය අසූඑකයි ශත තිස් නවයක (රු. 4,92,95,181.39) මුදලක්, 2009 දෙසැම්බර් මස 20 වැනි දින වන විට සෙලාන් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රු. 4,92,95,181.39 මුදල ද, 2009 දෙසැම්බර් මස 21 දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට විසිනවය (29%) බැගින් වූ පොලිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුනු වෙනත් ගාස්තුද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහත කී අංක 375, 509, 376, 510, 2503, 1326, 84 සහ 95 දරන බැඳුම්කර මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස් කර ඇත්තාවූ මෙහි පහත සඳහන් පළමුවැනි, දෙවැනි, තුන්වැනි සහ හතරවැනි උපලේඛනවල සවිස්තරව විස්තර කර ඇති දේපළ බලයලත් වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

#### පළමුවැනි උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළයේ, පල්ලේ පත්තුවේ, පොල්වත්ත පිහිටි බලයලත් මිනින්දෝරු එල්. ඩබ්ලිව්. එල්. ද සිල්වා විසින් සාදන ලද 1993 ඔක්තෝබර් මස 7 දිනැති අංක 10851 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන අළුබෝගහවත්ත, කැටකෑලගහවත්ත සහ මූනමල්ගහවත්ත නමැති ඉඩමේ ලොට් 3 ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩමට මායිම්, උතුරට : ලොට් 2 ද, නැගෙනහිරට : ලොට් 5 ද, දකුණට : ලොට් 4 සහ බස්නාහිරට : අංක 8027 දරන සැලැස්මේ සඳහන් ලොට් 1සී ද යන මායිම් තුළ එකී අංක 10851 දරන සැලැස්ම අනුව පර්චස් දහහතක් (අ. 0, රූ. 0, පර්. 17) විශාල ඉඩම. මෙය දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ හිමිකම් එම් 1998/88 යටතේ ලියාපදිංචි කර ඇත.

පහත සඳහන් ඉඩම තුළ, උඩින්, යටින් සහ දිගේ මාර්ග අයිතිය සමග :-

පෙර කී අංක 10851 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන ලොට් 5 සහ 1 ලකුණු කළ (පාර සඳහා වෙන් කිරීම) බෙදා වෙන් කරන ලද පිළිවෙලින් ප්‍රමාණයෙන් පර්චස් දහයක් (අ. 0, රූ. 0, පර්. 10) හෙක්ටයාර් 0.0253 සහ පර්චස් හයක් (අ. 0, රූ. 0. පර්. 6) හෙක්ටයාර් 0.0152ක් විශාල බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස. මෙය දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ හිමිකම් එම් 1995/114 සහ එම් 1998/200බී යටතේ ලියාපදිංචි කර ඇත.

අංක 10851 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන ලොට් 1 (පාර සඳහා වෙන් කිරීම) සම්බන්ධ අඩි 12ක් පළල පාර සඳහා වෙන් කිරීම පොදුවේ පාවිච්චි කිරීමේ අයිතිය සමග ය.

### දෙවැනි උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, හෝමාගම ප්‍රාදේශීය සභා සීමාව තුළ බ්‍රහ්මණාගම පිහිටි බලයලත් මිනින්දෝරු එච්. ඒ. ඩී. ප්‍රේමරත්න විසින් සාදන ලද 1995 පෙබරවාරි මස 21 වැනි දිනැති අංක 1254ඒ දරන සැලැස්මේ සඳහන් අන්දරගහවත්ත නමැති ඉඩමේ ලොට් ඒ1 ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : රුද්‍රිගු සහ තවත් අය විසින් හිමිකම් කියනු ලබන ඉඩම, එච්. ඒ. එම්. බණ්ඩාර සහ තවත් අය විසින් හිමිකම් කියනු ලබන අංක 604 දරන සැලැස්මේ සඳහන් ලොට් 4 සහ අංක 4600 දරන සැලැස්මේ සඳහන් ලොට් 5බී ද, නැගෙනහිරට : අඩි 20ක් පළල පාර (අංක 604 දරන සැලැස්මේ සඳහන් ලොට් 6 සහ අංක 4600 දරන සැලැස්මේ සඳහන් ලොට් 5ඊ සහ 5අයි) සහ අංක 196 දරන සැලැස්මේ සඳහන් ලොට් 5එල් ද, දකුණට : අංක 196 දරන සැලැස්මේ සඳහන් ලොට් 5එල්, අඩි 20ක් පළල පාර සහ ඩී. එස්. හෙට්ටිආරච්චි විසින් හිමිකම් කියනු ලබන ලොට් 10හි ඉතිරි කොටස සහ බස්නාහිරට : ඩී. එස්. හෙට්ටිආරච්චි විසින් හිමිකම් කියනු ලබන ලොට් 10හි ඉතිරි කොටස ද සහ රුද්‍රිගු සහ තවත් අය විසින් හිමිකම් කියනු ලබන ඉඩම සහ එච්. ඒ. එම්. බණ්ඩාර සහ තවත් අය විසින් හිමිකම් කියනු ලබන අංක 604 දරන සැලැස්මේ සඳහන් ලොට් 4 ද යන මායිම් තුළ එකී අංක 1254ඒ දරන සැලැස්ම අනුව රූඩ් දෙකයි පර්චස් විසිහයයි දශම හයයි බිංදුවක් (අ. 0, රූ. 2, පර්. 26.60) විශාල සියලු ගස්, වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම.

ඉහත විස්තර කරන ලද පෙර කී අංක 1254ඒ දරන සැලැස්මේ සඳහන් එකී ලොට් ඒ1 පහත සඳහන් ඉඩම් කොටස්වල එකතුවක නැවත මැනීමක් වේ :-

1. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ පල්ලේ පත්තුවේ, හෝමාගම ප්‍රාදේශීය සභා සීමාව තුළ බ්‍රාහ්මණාගම පිහිටි බලයලත් මිනින්දෝරු බී. ඒ. එස්. ඒ. ගුණසේකර විසින් සාදන ලද 1994 පෙබරවාරි මස 20 දිනැති අංක 196 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන අන්දරගහවත්ත නමැති ඉඩමේ ලොට් 5එෆ්, 5ජී, 5එම්, 5එච්, 5ජේ, 5කේ සහ 10ඒ ලකුණු කළ පිළිවෙලින් ප්‍රමාණයෙන් පර්චස් දොළහයි දශම පහක් (අ. 0, රූ. 0, පර්. 12.5) *නොහොත්* (හෙක්ටයාර් 0.0316)ක් පර්චස් දහ හතයි දශම පහක් (අ. 0, රූ. 0, පර්. 17.5) *නොහොත්* (හෙක්ටයාර් 0.0443) පර්චස් එකයි දශම අටක් (අ. 0, රූ. 0, පර්. 1.8) නොහොත් (හෙක්ටයාර් 0.0046ක්) පර්චස් දහතුනයි දශම පහක් (අ. 0. රූ. 0. පර්. 13.5) *නොහොත්* (හෙක්ටයාර් 0.0341) පර්චස් දහතුනයි දශම පහක් (අ. 0, රූ. 0, පර්. 13.05) *නොහොත්* හෙක්ටයාර් 0.0341) පර්චස් දොළහක් (අ. 0, රූ. 0, පර්. 12) *නොහොත්* (හෙක්ටයාර් 0.0304), පර්චස් දහතුනයි දශම පහයි බිංදුවක් (අ. 0, රූ. 0, පර්. 13.50) *නොහොත්* (හෙක්ටයාර් 0.0341) ක් විශාල සියලු ගස්, වගා සහ එහි පිහිටි සියලු දේ සමග බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස. මෙය හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ හිමිකම් ජී 894/241, ජී 894/242, ජී 894/243, ජී 894/264, ජී 894/265, ජී 894/266 සහ ජී 894/267 යටතේ ලියාපදිංචි කර ඇත.

පහත සඳහන් ඉඩම් තුළ උඩින් යටින් සහ දිගේ මාර්ග අයිතිය සහ වෙනත් අයිතීන් සමග :-

1. පෙර කී අංක 196 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන එකී අංක 196 දරන සැලැස්ම අනුව පර්චස් දහනවයක් (අ. 0, රූ. 0. පර්. 19) *නොහොත්* (හෙක්ටයාර් 0.0480) විශාල ලොට් 5අයි ලකුණු කළ (අඩි 9 1/2ක් පළල පාර සඳහා වෙන් කිරීම) බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස. මෙය හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ හිමිකම් ජී 894/220 යටතේ ලියාපදිංචි කර ඇත.

2. බලයලත් මිනින්දෝරු ඩී. ඩබ්ලිව්. අබේසිංහ විසින් සාදන ලද 1993.12.12 දිනැති අංක 4600 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන එකී අංක 4600 දරන සැලැස්ම අනුව පර්චස් පහයි දශම පහක් (අ. 0, රූ. 0. පර්. 5.5) ක් විශාල ලොට් 5ඊ ලකුණු කළ (අඩි 9 1/2ක් පළල පාර සඳහා වෙන් කිරීම) බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස. මෙය හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ හිමිකම් ජී 894/216 යටතේ ලියාපදිංචි කර ඇත.

3. බලයලත් මිනින්දෝරු පි. එච්. පෙරේරා විසින් සාදන ලද 1993 මාර්තු මස 9 සහ 26 දිනැති අංක 604 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන එකී අංක 604 දරන සැලැස්ම අනුව පර්චස් විසිපහයි දශම පහක් (අ. 0, රූ. 0, පර්. 25.5) ක් විශාල ලොට් 6 ලකුණු කළ (අඩි 10 1/2ක් පළල පාර සඳහා වෙන් කිරීම) බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස. මෙය හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ හිමිකම් පී 927/112 යටතේ ලියාපදිංචි කර ඇත.

### තුන්වැනි උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළයේ, පල්ලේ පත්තුවේ, හෝමාගම ප්‍රාදේශීය සභා සීමාව තුළ බ්‍රාහ්මණගම පිහිටි බලයලත් මිනින්දෝරු ඩී. ඩබ්ලිව්. අබේසිංහ විසින් සාදන ලද 1993 දෙසැම්බර් මස 12 දිනැති අංක 4600 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන අන්දරගහවත්ත නමැති ඉඩමේ ලොට් 5බී ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : මිනින්දෝරු ඩී. ඩබ්ලිව්. අබේසිංහ විසින් සාදන ලද අංක 4355 දරන සැලැස්මේ සඳහන් ලොට් 5ඒ ද, නැගෙනහිරට : ලොට් 5ඊ ද, දකුණට : ලොට් 5සී ද සහ බස්නාහිරට : බලයලත් මිනින්දෝරු පී. එච්. පෙරේරා විසින් සාදන ලද 1993 මාර්තු 9 දිනැති අංක 604 දරන සැලැස්මේ සඳහන් ලොට් 2, 3 සහ 4 ද යන මායිම් තුළ එකී අංක 4600 දරන සැලැස්ම අනුව පර්චස් දහයක් (අ. 0, රූ. 0, පර්. 10) විශාල ඉඩම. මෙය හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ හිමිකම් ජී 894/291 යටතේ ලියාපදිංචි කර ඇත. පෙර කී අංක 4600 දරන සැලැස්මේ සඳහන් ලොට් 5ඊ (පාර සඳහා වෙන් කිරීම, බලයලත් මිනින්දෝරු පී. එච්. පෙරේරා විසින් සාදන ලද 1993 මාර්තු මස 9 දිනැති අංක 604 දරන සැලැස්මේ සඳහන් ලොට් 6 (අඩි 10.5ක් පළල පාර සඳහා වෙන් කිරීම) උඩින් දිගේ සහ තුළ මාර්ග අයිතිය සමග.

### හතරවැනි උපලේඛනය

1. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, හෝමාගම ප්‍රාදේශීය සභා සීමාව තුළ මාබුල්ගොඩ පිහිටි බලයලත් මිනින්දෝරු එස්. වික්‍රමසිංහ විසින් සාදන ලද 1990 අප්‍රේල් මස 09 දිනැති අංක 4571 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන දවටගහවත්ත *හෙවත්* අන්දරගහවත්ත නමැති ඉඩමේ ලොට් 2 ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් 1 ද, නැගෙනහිරට : සයිමන් පෙරේරා සහ තවත් අයගේ ඉඩම ද, දකුණට : ලොට් 3 ද සහ බස්නාහිරට : ලොට් 7 ලකුණු කළ අඩි 12ක් පළල පාර ද යන මායිම් තුළ එකී අංක 4571 දරන සැලැස්ම අනුව පර්චස් එකොළහක්

(අ. 0, රූ. 0, පර්. 11) විශාල ඉඩම. මෙය හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ හිමිකම් පී815/22 යටතේ ලියාපදිංචි කර ඇත.

2. පෙර කී මාබුල්ගොඩ පිහිටි බලයලත් මිනින්දෝරු එස්. වික්‍රමසිංහ විසින් සාදන ලද 1990 අප්‍රේල් 9 වැනි දිනැති අංක 4571 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන දවටගහවත්ත හෙවත් අන්දරගහවත්ත නමැති ඉඩමේ ලොට් 3 ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් 2 ද, නැගෙනහිරට : සයිමන් පෙරේරා සහ තවත් අයගේ ඉඩම ද, දකුණට : මාටින් පෙරේරාගේ ඉඩම සහ බස්නාහිරට : ලොට් 4 සහ ලොට් 7 ලකුණු කළ අඩි 12ක් පළල පාර සඳහා වෙන් කිරීම ද යන මායිම් තුළ එකී අංක 4571 දරන සැලැස්ම අනුව පර්චස් එකොළහක් (අ. 0, රූ. 0, පර්. 11) විශාල ඉඩම. මෙය හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ හිමිකම් ජී 815/21 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සී. කොටිගල,
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී-නීති.

06-620/2

---

## ඩීඑෆ්සීසී බැංකුව

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය ප්‍රකාර ඩීඑෆ්සීසී බැංකුව විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනා සම්මතය ඒකච්ඡන්දයෙන් සම්මත කරගන්නා ලද බව 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 08 වැනි වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

#### අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය

ඩීඑෆ්සීසී බැංකුව නමට කළුතර ප්‍රසිද්ධ නොතාරිස්වරුන් වන එන්. ඩී. බී. පී. වීරසිංහ ලියා සහතික කළ අංක 2638 හා 2006 මාර්තු මස 31 දින ද, ඩී. ඒ. පුංචිහේවා ලියා සහතික කළ අංක 8962 හා 2008 ජූලි 02 දින ද, එන්. ඩී. බී. පී. වීරසිංහ ලියා සහතික කළ අංක 2639 හා 2006 මාර්තු 31 දින ද දරන උකස් බැඳුම්කර මත අයවිය යුතු මුදල් ගෙවීම "දේශාබී එන්ටප්‍රයිසස් " යන නාමය, අභිධානය සහ ආයතනය යටතේ හවුල් ව්‍යාපාරයක් ලෙස ව්‍යාපාරය කරගෙන යන බේරුවල, පාලමුණි බෙල්ටන් පතිරත්න ද සිල්වා, පාලමුණි දමිත් ධනංජය ද සිල්වා සහ හර්ෂණී බුද්ධිකා ගුණසේකර යන අය විසින් පැහැර හැර ඇති හෙයින් ද, 2010 මාර්තු 31 වැනි දිනට ඉහත කී අංක 2638, 8962 හා 2639 දරන උකස් බැඳුම්කර මත එකී පාලමුණි බෙල්ටන් පතිරත්න ද සිල්වා, පාලමුණි දමිත් ධනංජය ද සිල්වා සහ හර්ෂණී බුද්ධිකා ගුණසේකර යන අයගෙන් ඩීඑෆ්සීසී බැංකුවට රුපියල් හතලිස් හතර ලක්ෂ තිස්තුන් දහස් හත්සිය හැත්තෑ හතරකුත් ශත දහසයක (රු. 44,33,774.16) මුදලක් සහ 2010 අප්‍රියෙල් 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් හාරලක්ෂ හැත්තෑපන් දහස් හාරසිය විසි දෙකක් (රු. 4,75,422) සඳහා එක් එක් වර්ෂයේ සෑම තුන් මසකට වරක් ජනවාරි, අප්‍රියෙල්, ජූලි සහ ඔක්තෝබර් යන මාසවල ව්‍යාපාර කටයුතු කරන ප්‍රථම දිනයේදී ප්‍රතිශෝධනය කරනු ලබන බර තැබූ මධ්‍යක මූලික ණය පොලී අනුපාතිකයට (AWPR) වර්ෂයකට සියයට හතකුත් දශම පහක් (7.5%) ඉහළ අනුපාතිකයක් මත ගණන් බලනු ලබන, ආසන්නතම 0.5%ට තීන්දු කරන අනුපාතිකය මත පොලිය ද, රුපියල් දහතුන් ලක්ෂ තිස් දෙදහස් හාරසිය අසූ එකක් (රු. 13,32,481) සඳහා මෙහි පහත දැක්වෙන පාදක පොලී අනුපාතික අතරින් එනම්,

(අ) බරතැබූ මධ්‍යක මූලික ණය පොලී අනුපාතිකයට (ඒ. ඩබ්ලිව්. පී. ආර්.) ආසන්නතම ඉහල 0.5%ට තීන්දු කරන වාර්ෂික අනුපාතිකය හෝ

(ආ) රඳවාගැනීමේ බදු අඩුකර ගැනීමෙන් පසු, දවස් 91 මධ්‍යක භාණ්ඩාගාර බිල්පත් පොලී අනුපාතිකයට ආසන්නතම ඉහල 0.5% තීන්දු කරන වාර්ෂික අනුපාතිකය.

යන මෙයින් ප්‍රතිශෝධන දිනයේ දී බලාත්මකව පැවැති වඩා ඉහල අනුපාතිකයට සියයට දහයක (10%) ආන්තිකයක් එකතු කළ අනුපාතිකය මත පොලියද (මෙම පොලී අනුපාතික එක් එක් වර්ෂයේ සෑම තුන් මසකට වරක් ජනවාරි, අප්‍රියෙල්, ජූලි සහ ඔක්තෝබර් යන මාසවල ව්‍යාපාර කටයුතු කරන ප්‍රථම දිනයේදී ප්‍රතිශෝධනය කරනු ලැබේ) සහ රුපියල් පහළොස් ලක්ෂයක් (රු. 15,00,000) සඳහා වර්ෂයකට සියයට තිස් හය (36%) බැගින් පොලියද ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද,

ඉහත කී උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල වන හතලිස් හතර ලක්ෂ තිස්තුන් දහස් හත්සිය හැත්තෑ හතරකුත් ශත දහසයක (රු. 44,33,774.16) මුදල සහ 2010 අප්‍රියෙල් 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් හාරලක්ෂ හැත්තෑපන් දහස් හාරසිය විසි දෙකක් (රු. 4,75,422) සඳහා එක් එක් වර්ෂයේ සෑම තුන් මසකට වරක් ජනවාරි, අප්‍රියෙල්, ජූලි සහ ඔක්තෝබර් යන මාසවල ව්‍යාපාර කටයුතු කරන ප්‍රථම දිනයේදී ප්‍රතිශෝධනය කරනු ලබන බර තැබූ මධ්‍යක මූලික ණය පොලී අනුපාතිකයට (AWPR) වර්ෂයකට සියයට හතකුත් දශම පහක් (7.5%) ඉහල අනුපාතිකයක් මත ගණන් බලනු ලබන, ආසන්නතම 0.5%ට තීන්දු කරන අනුපාතිකය මත පොලිය ද, රුපියල් දහතුන් ලක්ෂ තිස් දෙදහස් හාරසිය අසූ එකක් (රු. 13,32,481) සඳහා මෙහි පහත දැක්වෙන පාදක පොලී අනුපාතික අතරින් එනම්,

(අ) බරතැබූ මධ්‍යක මූලික ණය පොලී අනුපාතිකයට (ඒ. ඩබ්ලිව්. පී. ආර්.) ආසන්නතම ඉහල 0.5%ට තීන්දු කරන වාර්ෂික අනුපාතිකය හෝ

(ආ) රඳවා ගැනීමේ බදු අඩුකර ගැනීමෙන් පසු, දවස් 91 මධ්‍යක භාණ්ඩාගාර බිල්පත් පොලී අනුපාතිකයට ආසන්නතම ඉහල 0.5% තීන්දු කරන වාර්ෂික අනුපාතිකය.

යන මෙයින් ප්‍රතිශෝධන දිනයේ දී බලාත්මකව පැවති වඩා ඉහල අනුපාතිකයට සියයට දහයක (10%) ආන්තිකයක් එකතු කළ අනුපාතිකය මත පොලිය ද (මෙම පොලී අනුපාතික එක් එක් වර්ෂයේ සෑම තුන් මසකට වරක් ජනවාරි, අප්‍රියෙල්, ජූලි සහ ඔක්තෝබර් යන මාසවල ව්‍යාපාර කටයුතු කරන ප්‍රථම දිනයේ දී ප්‍රතිශෝධනය කරනු ලැබේ) සහ රුපියල් පහලොස් ලක්ෂයක් (රු. 15,00,000) සඳහා වර්ෂයකට සියයට තිස් හය (36%) බැගින් පොලිය හෝ විකිණීමේ දිනට එයින් නොගෙවා ඉතිරිව ඇති යම් කොටසක් මීට අදාළ ඉඩම හා පරිශ්‍රය සහ එහි පිහිටි සියලු දේ විකිණීම පිළිබඳ ප්‍රචාරක ගාස්තු හා විකිණීමේ ගාස්තු ද, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද, ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය ප්‍රකාර එකී උකස් බැඳුම්කරවල ප්‍රඥප්ති අනුව ඩීඑෆ්සීසී බැංකුව වැය කර ඇති සියලු මුදල් හා දරා ඇති සියලු වියදම් හා ගාස්තු ද සමග අයකර

ගැනීම සඳහා ඉහත කී අංක 2638, 8962 හා 2639 දරන උකස් බැඳුම්කර මගින් ඩීඑෆ්සීසී බැංකුව වෙත උකස්කර ඇති මෙහි පහත විස්තර කරන ඉඩම හා පරිශ්‍රය හා එහි පිහිටි සියලු දේ බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහතුන් ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් සහ සංශෝධිත පරිදි වූ 1955 අංක 35 දරන ලංකා සංවර්ධන මුදල් සංස්ථා පනතින් පැවරී ඇති බලතල යටතේ ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කරයි.

**අංක 2638, 8962 හා 2639 දරන උකස් බැඳුම්කර මගින් උකස් කරන ලද දේපළ විස්තරය**

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, දකුණු කළුතර තොටමුණේ, බේරුවල් බද්දේ, බේරුවල නගර සභා සීමාව ඇතුළත වදකහවෙල පිහිටි (බලයලත් මිනින්දෝරු ඊ. ඩී. ජී. කේ. ප්‍රේමරත්න මැන සකස් කළ අංක 3042 හා 1992 දෙසැම්බර් 13 දින දරන පිඹුරේ ලොට් අංක 1, 2, 3 සහ 4 දරන බිම් කොටස් ද බලයලත් මිනින්දෝරු ඩී. ඒ. සෙන්ට් බීඩ් සමරසිංහ මැන සකස් කළ අංක 2036 හා 1983.12.31 දින දරන පිඹුරේ දැක්වෙන ඉඩම ද, නැවත මැන ඒකාබද්ධ කර අනුබෙදීමක් වන) බලයලත් මිනින්දෝරු එම්. කේ. රංජිත් ආනන්ද මැන සකස් කළ අංක 540 හා 2006 පෙබරවාරි 04 දින දරන පිඹුරේ ලොට් A, B, C සහ D ලෙස දැක්වෙන එකට යා වූ ඒකාබද්ධ "මිදිගහඹිවිට කට්ටිය, මහතලන්ගහඹිවිට සහ තලන්ගහඹිවිට කට්ටිය" කොටසක් නමැති ඉඩමේ, ඉහත කී අංක 540 දරන පිඹුරේ ලොට් B ලෙස ලකුණු කළ බෙදා වෙන් කළ බිම් කට්ටියට මායිම්, උතුරට : කළුතර දිසා අධිකරණයේ අංක පී/5099 දරන බෙදුම් නඩුවේ අවසාන තීන්දු ප්‍රකාශය ප්‍රකාර හිමිකම් කියන, "නලාවේ කුඹුර" දැනට "පෙරියතලේඅඩිවයල් " යනුවෙන් හැඳින්වන ඉඩම ද, නැගෙනහිරටඃ ගාලු පාර ද, දකුණට : (අඩි 10ක් පළල පාර සඳහා වෙන් වුණු) ලොට් C සහ ලොට් A දරන බිම් කට්ටිය ද, බස්නාහිරට : ලොට් A දරන බිම් කට්ටිය ද යන මායිම් ඇතුළත එකී අංක 540 දරන පිඹුර ප්‍රකාර රූඩ් එකක (අ. 0, රූ. 1, ප. 0) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම වේ.

ඒ. එන්. ෆොන්සේකා,
සාමාන්‍යාධිකාරී.

ඩීඑෆ්සීසී බැංකුව,
අංක 73/5, ගාලු පාර,
කොළඹ 03.

06-618/3

---

**සෙලාන් බැංකුව පීඑල්සී - මඩකලපුව ශාඛාව**

2007 අංක 07 දරන සමාගම් පනත අනුව යොමුව පීකිවු 9 යටතේ ලියාපදිංචි කර ඇත

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2009.03.15 දින පවත්වන්නට යෙදුනු රැස්වීමේ දී, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ගිණුම් අංකය : 0730-01137856-101.

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යොමු අංක පීකිව් 9 යටතේ ලියාපදිංචි කර ඇත) ප්‍රසිද්ධ නොතාරිස් එන්. වේලුපිල්ලෙයි විසින් සහතික කරන ලද 2006 සැප්තැම්බර් මස 15 දිනැති අංක 514 දරන බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම මඩකලපුව පදිංචි සින්නතුරෙයි රමේෂ් කලෙයිචෙල්වන් යන අය බන්ධනදායී වශයෙන් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් පන්ලක්ෂ හතලිස්එක්දහස් අටසිය දොලහයි ශත හැත්තෑඅටක (රු. 5,41,812.78) මුදලක්, 2009 ජූලි මස 31 වැනි දින වන විට සීමාසහිත සෙලාන් බැංකුව වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රු. 5,41,812.78 මුදල ද, 2009 අගෝස්තු මස 01 දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට විසිනවය (29%) බැගින් වූ පොලිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුණු වෙනත් ගාස්තු ද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහත කී අංක 514 දරන බැඳුම්කරය මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස් කර ඇත්තාවූ මෙහි පහත සඳහන් උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ බලයලත් වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

**උපලේඛනය**

නැගෙනහිර පළාතේ, මඩකලපුව දිස්ත්‍රික්කයේ, කෝරළෙයි පත්තුවේ වාලච්චේනෙයි පිහිටි තෙන්නතෝඩ්ඩම් නමැති බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, නැගෙනහිරට : පාර සඳහා වෙන් කළ ඉඩම, බස්නාහිරට : කේ. කරුණේශ්වරීගේ ඉඩම ද, උතුරට : වී ගුණලිංගම්ගේ අනික් කොටස ද, සහ දකුණට : ටී. කිරුබෙයිලෙච්චුමීගේ අනික් කොටස යන මායිම් තුළ රූඩ් එකක් (අ. 0, රූ. 1, පර්. 0) විශාල එහි තුළ පිහිටි නිවස, ළිඳ සහ වෙනත් දේ සහ සියලු අයිතීන් සමග ඉඩම. මෙය මඩකලපුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය ජී 151 පත්‍රිරුව 190හි ලියාපදිංචි කර ඇත.

එකී දේපළ බලයලත් මිනින්දෝරු එස්. නාගලිංගම් විසින් අඳින ලද 2005.06.12 දිනැති අංක එස්එන්/05/5823 දරන සැලැස්ම අනුව පහත සඳහන් පරිදි විස්තර කර ඇත.

නැගෙනහිර පළාතේ, මඩකලපුව දිස්ත්‍රික්කයේ, කෝරළෙයි පත්තු ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ වාලච්චේනෙයි ප්‍රාදේශීය සභා සීමාව තුළ වාලච්චේනෙයි ගමේ වාලච්චේනෙයි පිහිටි කොකනට් ගාඩ්න් නමැති බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම් උතුරට : කුණලිංගම්ගේ වත්ත ද, නැගෙනහිරට : පාර, දකුණට : ටී. කිරුබාලක්ෂ්මීගේ ඉඩම ද, සහ බස්නාහිරට : කේ. කරුණේශ්වරීගේ ඉඩම ද, යන මායිම් තුළ රූඩ් එකක් (අ. 0, රූ. 1, පර්. 0) විශාල එහි තුළ අඩංගු සියලු දේ සහ සියලු අයිතීන් සමග ඉඩම.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සී. කොටිගල,
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී-නීති.

06-620/5

### පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී - මාතර ශාඛාව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ අනුමත කළ යෝජනා සම්මුතිය

වර්ෂ 2010ක් වූ මැයි මස 26 වැනි දින පවත්වන ලද පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමක දී විශේෂයෙන් සහ ඒකමතිකව ද පහත දැක්වෙන පරිද්දෙන් යෝජනා සම්මත කර ගන්නා ලදී.

ගනුදෙනුකරුගේ නම : රණේපුර හේවගේ ගයාන් ෆොන්සේකා සහ සමරනායක ජයවීර ආරච්චිගේ අමරබන්දු.

කලින් පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් ලිමිටඩ් සහ පෑන් ඒෂියා බෑන්ක් ලිමිටඩ් යනුවෙන් නම් කරන ලද ලියාපදිංචි අංක පීකිව් 48 දරන පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී නමින් වූ මාතර ප්‍රසිද්ධ නොතාරිස් පී. ජී. සී. නානායක්කාර විසින් සහතික කරන ලද වර්ෂ 2008ක් වූ අප්‍රේල් මස 12 වැනි දිනැති අංක 10001 දරන උකස් බැඳුම්කරය මත ගෙවිය යුතු වූ ගෙවීම් සිදු කිරීම රණේපුර හේවගේ ගයාන් ෆොන්සේකා සහ සමරනායක ජයවීර ආරච්චිගේ අමරබන්දු බන්ධනදායී වශයෙන් ද, සමරනායක ජයවීර ආරච්චිගේ අමරබන්දු උකස්කරු වශයෙන් ද පැහැර හැර ඇති හෙයින් ද,

එකී උකස්කරය මත-

(අ) වර්ෂ 2010ක් වූ පෙබරවාරි මස 11 වැනි දින දක්වා මුල් මුදල සහ පොළිය වශයෙන් රුපියල් දෙලක්ෂ අසූතුන් දහස් පන්සිය අනූහයකුත් ශත හතරක (රු. 2,83,596.04) ක මුදල සහ වර්ෂ 2010ක් වූ පෙබරවාරි මස 01 වැනි දින සිට එකී උකස්කරය මත ගෙවිය යුතු සම්පූර්ණ මුදල ගෙවා නිම දරන දින තෙක්, රුපියල් දෙලක්ෂ පනස් දහසක් (රු. 2,50,000) මුදල මත වාර්ෂිකව සියයට විසි හයක (26%) බැගින් වූ පොළිය ද, රුපියල් දෙලක්ෂ පනස් දහස (රු. 2,50,000) ඉක්මවන මුදල මත වර්ෂයකට සියයට විසි නවය (29%) බැගින් වූ පොළිය ද.

(ආ) වර්ෂ 2010ක් වූ පෙබරවාරි මස 11 වැනි දින දක්වා මුල් මුදල සහ පොළිය වශයෙන් රුපියල් හයලක්ෂ අසූ දෙදහස් තුන්සිය අනූපහකුත් ශත හැට හතක (රු. 6,82,395.67) මුදලක් සහ වර්ෂ 2010 ක් වූ ජනවාරි මස 16 වැනි දින සිට එකී උකස්කරය මත ගෙවිය යුතු සම්පූර්ණ මුදල ගෙවා නිම කරන දිනය තෙක්, රුපියල් තුන්ලක්ෂ නවදහසක් (රු. 3,09,000) ක මුදල මත වාර්ෂිකව සියයට විසි හයක (26%) ක් බැගින් වූ පොළිය ද, රුපියල් දෙලක්ෂ අසූ පන්දහස් අටසිය පනස් හයකුත් ශත විසි හයක් (රු. 2,85,856.26) මුදල මත වාර්ෂිකව සියයට තිහක් (30%) බැගින් පොළිය ද,

පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී (මෙහි ඇතැම් තැනෙක "බැංකුව" යනුවෙන් සඳහන් කරනු ලබන) වෙත අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් ද,

පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගනු ලැබේ. ඒ කෙසේද යත්

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය ප්‍රකාරව, එකී අංක 10001 දරන එකී බැඳුම්කරය මත ගෙවීමට ඇති එකී රුපියල් නවලක්ෂ හැටපන්දහස් නවසිය අනූ එකකුත් ශත හැත්තෑ එකක (රු. 9,65,991.71) මුදල සහ ඉහත කී දිනවල සිට විකිණීමේ දිනය දක්වා පොළිය ද, එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි පිරිවැය සහ මුදල් අයකර ගැනීම සඳහා, මෙහි උපලේඛනයෙහි සවිස්තරව විස්තර කර ඇති බැංකුවට උකස් කර ඇත්තා වූ දේපළ, ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කොළඹ 12, බෙල්මන්ට් වීදියේ අංක 9 දරන ස්ථානයේ එම්. එස්. ඔක්ෂන්ස් හි බලයලත් වෙන්දේසිකාර ශ්‍රියාණි මනම්පේරි මහත්මියට අධිබලය දෙනු ලැබ බලය පවරන ලෙස ය.

#### පළමු උපලේඛනය

දකුණු පළාතේ, ගාලු දිස්ත්‍රික්කයේ, ගාල්ල කඩවත් සතර මහ නගර සභා සීමාව ඇතුළත ඇත්තිල්ලිගොඩ පිහිටි එච්. කේ. එඩ්මන්ඩ් මාවතේ, වරිපනම් අංක 12 දරන බලයලත් මිනින්දෝරු ඩී. ඩී. රණවීර විසින් සාදන ලද වර්ෂ 1995ක් වූ ජූනි මස 11 වැනි දිනැති අංක 3176 දරන පිඹුරේ නිරූපිත කඳවල ඕවිට යනුවෙන් හඳුන්වන ලබන ඉඩමේ ලොට් ඒ, ලොට් 9හි ලොට් 9බී වශයෙන් බෙදා වෙන් කරන ලද සියලුම පස, පලතුරු, ගොඩනැගිලි සහ එහි පිහිටි සියලුම දේ සමග වන ඉඩම. එකී ලොට් 9බී කැබැල්ලට මායිම්, ඊසානට : එඩ්මන්ඩ් මාවත ද, ගිණිකොණට : වැලිවත්ත හෙවත් පැඟිරි කොරටුව ද, නිරිතට : එම ඉඩමේම කොටසක් ද සහ වයඹට : අංක 3176 දරන පිඹුරේ ලොට් 9ඒ ද යන ප්‍රමාණයෙන් පර්චස් දහහතයි දශම එකයි අටක් (අ. 0, රූ. 0, පර්. 17.18) වන ඉඩම.

ගාල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ 672/02හි ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

මනෝනිත ආරියනන්ද,
කළමණාකරු - ණය අයකර ගැනීම්.

06-668/2

---

### පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී - කොල්ලුපිටිය ශාඛාව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ අනුමත කළ යෝජනා සම්මුතිය

වර්ෂ 2009ක් වූ ජූනි මස 24 වැනි දින පවත්වන ලද පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමක දී විශේෂයෙන් සහ ඒකමතිකව ද පහත දැක්වෙන පරිද්දෙන් යෝජනා සම්මත කර ගන්නා ලදී.

ගනුදෙනුකරුගේ නම : රොටන් වැන්ඩර් (ශ්‍රේයිටිංග්) ලිමිටඩ්.

කලින් පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් ලිමිටඩ් සහ පෑන් ඒෂියා බෑංක් ලිමිටඩ් යනුවෙන් නම් කරන ලද ලියාපදිංචි අංක පීකිව් 48 දරන පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී නමින් වූ, දෙකම කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ජේ. ආර්. දොළවත්තගේ විසින් සහතික කරන ලද වර්ෂ 2003ක් වූ ඔක්තෝබර් මස 31 වැනි දිනැති අංක 1230 සහ වර්ෂ 2005ක් වූ ඔක්තෝබර් මස 20 වැනි දිනැති අංක 1799 දරන උකස් බැඳුම්කර මත ගෙවිය යුතු වූ ගෙවීම් සිදු කිරීම රොටන් වැන්ඩර් (ශ්‍රේයිටිංග්) සමාගම බන්ධනදායී වශයෙන් ද, මෙලරීන් විරන්ති කරුණානායක උකස්කාරිය වශයෙන් ද පැහැර හැර ඇති හෙයින් ද,

එකී උකස්කරයන් මත-

(අ) වර්ෂ 2009ක් වූ ජුනි මස 22 වැනි දක්වා මුල් මුදල සහ පොළිය වශයෙන් රුපියල් අනූපන්ලක්ෂ තිස් දෙදහස් අටසිය හැත්තෑ හතක (රු. 95,32,877) මුදල සහ වර්ෂ 2009ක් වූ ජුනි මස 23 වැනි දින සිට එකී උකස්කරය මත ගෙවිය යුතු සම්පූර්ණ මුදල ගෙවා නිම දරන දින තෙක් රුපියල් ලක්ෂ හැටක (රු. 60,00,000) මුදල මත වාර්ෂිකව සියයට 25% බැගින් වූ පොළිය ද,

(ආ) වර්ෂ 2009ක් වූ ජුනි මස 19 වැනි දින දක්වා මුල් මුදල සහ පොළිය වශයෙන් රුපියල් අනූ ලක්ෂ එක් දහස් නවසිය හැට එකකුත් ශත හැට අටක් වූ (රු. 90,01,961.68) මුදලක් සහ වර්ෂ 2009 ක් වූ ජුනි මස 01 වැනි දින සිට එකී උකස්කරය මත ගෙවිය යුතු සම්පූර්ණ මුදල ගෙවා නිම කරන දිනය තෙක්, රුපියල් ලක්ෂ හැටක (රු. 60,00,000) ක මුදල මත වාර්ෂිකව සියයට 25%ක් බැගින් වූ පොළිය ද, රුපියල් ලක්ෂ හැටක (රු. 60,00,000) ඉක්මවන මුදල මත වාර්ෂිකව සියයට 29% බැගින් පොළිය ද,

පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී (මෙහි ඇතැම් තැනෙක "බැංකුව" යනුවෙන් සඳහන් කරනු ලබන) වෙත අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් ද,

පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගනු ලැබේ. ඒ කෙසේද යත්

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය ප්‍රකාරව, එකී අංක 1230 සහ 1799 දරන එකී බැඳුම්කර මත ගෙවීමට ඇති එකී රුපියල් එකසිය අසූපන් ලක්ෂ තිස්හතර දහස් අටසිය තිස් අටකුත් ශත හැට අටක (රු. 1,85,34,838.68) මුදල සහ ඉහත කී දිනවල සිට විකිණීමේ දිනය දක්වා පොළිය ද, එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි පිරිවැය සහ මුදල් අයකර ගැනීම සඳහා, මෙහි උපලේඛනයෙහි සවිස්තරව විස්තර කර ඇති බැංකුවට උකස් කර ඇත්තා වූ දේපළ, ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කොළඹ 12, බෙල්මන්ට් වීදියේ අංක 9 දරන ස්ථානයේ එම්. එස්. ඔක්ෂන්ස් හි බලයලත් වෙන්දේසිකාර ශ්‍රියාණි මනම්පේරි මහත්මියට අධිබලය දෙනු ලැබ බලය පවරන ලෙස ය.

**පළමු උපලේඛනය**

1. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළයේ, පල්ලේ පත්තුවේ (කලින් කෝට්ටේ නගර සභා සීමාව ඇතුළත) ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභා සීමාව ඇතුළත මිරිහානේ පිහිටි (දැනට වරිපනම් අංක 289/6 කෝට්ටේ පාර) ස්ටැන්ලි තිලකරත්න මාවතේ වරිපනම් අංක 287/8 සහ 287/9 දරන කැටකැලගහවත්ත යනුවෙන් හඳුන්වනු ලබන බලයලත් මිනින්දෝරු ඩී. ඕ. වී. ද එස්. අබේවික්‍රම විසින් සාදන ලද වර්ෂ 1991ක් වූ ජනවාරි මස 19 වැනි දිනැති අංක 59 දරන පිඹුරේ ලොට් 1බී වශයෙන් සලකුණු කර නිරූපිත ඉඩම් කැබැල්ල. එකී ලොට් 1බී කැබැල්ලට මායිම්, උතුරට : විජේසිංහ මහතාගේ සහ වෙනත් අයගේ ඉඩම ද, නැගෙනහිරට : ඒ. ඊ. ගුණවර්ධන මහතාගේ සහ වෙනත් අයගේ ඉඩම ද. දකුණට : වරිපනම් අංක 287/12 දරන දේපළ ද සහ බස්නාහිරට : ලොට් 1ඒ සහ 1සී ද යන එකී අංක 59 දරන පිඹුර ප්‍රකාරව ප්‍රමාණයෙන් පර්චස් දහසයයි දශම එකක් (අ. 0, රූ. 0. පර්. 16.1) වන එහි පිහිටි ගහකොළ, පළතුරු, ගොඩනැගිලි සහ සියලුම දේ සමග වන ඉඩම. මෙය ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ හිමිකම් එම් 1770/87 යටතේ (දැන් දෙල්කඳ-නුගේගොඩ) ලියාපදිංචි කර ඇත.

2. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළයේ, පල්ලේ පත්තුවේ (කලින් කෝට්ටේ නගර සභා සීමාව ඇතුළත) ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභා සීමාව ඇතුළත මිරිහානේ පිහිටි ස්ටැන්ලි තිලකරත්න මාවතේ වරිපනම් අංක 287/12 දරන එහි පිහිටි ගහකොළ, පළතුරු, ගොඩනැගිලි සහ සියලුම දේ සමග වන බලයලත් මිනින්දෝරු එන්. ජී. ඩී. විජේරත්න විසින් සාදන ලද වර්ෂ 1962 ක් වූ මාර්තු මස 02 වැනි දිනැති අංක 41 දරන මැනුම් පිඹුරේ ලොට් 2 වශයෙන් නිරූපිත අතුරු බෙදීමක් වන) කැටකැලගහ වත්ත යනුවෙන් හඳුන්වනු ලබන බලයලත් මිනින්දෝරු එස්. වික්‍රමසිංහ විසින් සාදන ලද වර්ෂ 1984 ක් වූ මැයි මස 20 වැනි දිනැති අංක 1364 දරන පිඹුරේ ලොට් 2බී වශයෙන් සලකුණු කර නිරූපිත ඉඩම් කැබැල්ල. එකී ලොට් 2බී කැබැල්ලට මායිම්, උතුරට : අංක 41 දරන පිඹුරේ ලොට් 1 ද, නැගෙනහිරට : එම ඉඩමේම ලොට් 2ඒ ද, දකුණට : එම ඉඩමේම ලොට් 2සී ද, සහ බස්නාහිරට : අඩි 12ක් පළල පාර (අංක 41 දරන පිඹුරේ ලොට් 4) ද වන ප්‍රමාණයෙන් පර්චස් නවයයි දශම හයයි බිංදුවක් (අ. 0, රූ. 0, පර්. 9.60)වන එහි පිහිටි ගහකොළ, පළතුරු, ගොඩනැගිලි සහ සියලුම දේ සමග වන ඉඩම. මෙය ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ හිමිකම් එම් 2624/226 යටතේ (දැන් දෙල්කඳ නුගේගොඩ) ලියාපදිංචි කර ඇත.

3. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ (කලින් කෝට්ටේ නගර සභා සීමාව ඇතුළත) ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහනගර සභා සීමාව ඇතුළත මිරිහානේ ස්ටැන්ලි තිලකරත්න මාවතේ වරිපනම් අංක 287/10 දරන කැටකැලගහවත්ත යනුවෙන් හඳුන්වනු ලබන බලයලත් මිනින්දෝරු එස්. වික්‍රමසිංහ විසින් සාදන ලද වර්ෂ 1984ක් වූ මැයි මස 20 වැනි දිනැති අංක 1364 දරන පිඹුරේ ලොට් 2ඒ වශයෙන් සලකුණු කර නිරූපිත ඉඩම් කැබැල්ල. එකී ලොට් 2ඒ කැබැල්ලට මායිම් උතුරට : අංක 41 දරන පිඹුරේ ලොට් 1 ද, නැගෙනහිරට : එස්. බී. ගුණවර්ධන මියගේ සහ වෙනත් අයගේ ඉඩම ද, දකුණට : ස්ටැන්ලි තිලකරත්න මාවතේ වරිපනම් අංක 287/8 දරන පරිශ්‍රය ද, සහ බස්නාහිරට : එකී ඉඩමේ ලොට් 2සී සහ ලොට් 2බී ද වන ප්‍රමාණයෙන් පර්චස් නවයයි දශම හයයි බිංදුවක් (අ. 0, රූ. 0, පර්. 9.60) වන එහි පිහිටි ගහකොළ, පළතුරු, ගොඩනැගිලි සහ සියලුම දේ සමග වන ඉඩම. මෙය ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ හිමිකම් එම් 2696/202 යටතේ (දැන් දෙල්කඳ - නුගේගොඩ) ලියාපදිංචි කර ඇත.

අංක 41 දරන පිඹුරේ ලොට් 3 සහ ලොට් 4 වශයෙන් නිරූපිත, අංක 59 දරන පිඹුරේ ලොට් 1සී ලෙස නිරූපිත සහ අංක 1364 දරන පිඹුරේ ලොට් 2සී ලෙස නිරූපිත මාර්ග අයිතිවාසිකම ද සහිතව.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

මනෝනීත ආරියනන්ද,
කළමණාකරු - ණය අයකර ගැනීම්.

06-668/1

---

**සෙලාන් බැංකුව පීඑල්සී - මඩකලපුව ශාඛාව**

(2007 අංක 07 දරන සමාගම් පනත අනුව යොමුව පීකිවු 9 යටතේ ලියාපදිංචි කර ඇත)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2010.03.25 දින පවත්වන්නට යෙදුණු රැස්වීමේ දී, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය

කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ගිණුම් අංකය : 0730-00780410-101.

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යොමු අංක පීකිව් 9 යටතේ ලියාපදිංචි කර ඇත) ප්‍රසිද්ධ නොතාරිස් නිරෝජිනී වේලුපිල්ලෙයි විසින් සහතික කරන ලද 2006 ජූලි මස 28 දිනැති අංක 503 දරන බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම දෙදෙනාම මඩකලපුව පදිංචි මනිකපොඩි අරුලම්පලම් සහ වීරකුඩ්ඩි කුපේන් තිර රාජා යන අය බන්ධනදායී වශයෙන් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් දහසයලක්ෂ විසිහතරදහස් නවසිය හැත්තෑවයි ශත තිස්හතරක (රු. 16,24,970.34) මුදලක්, 2009 ජූලි මස 09 වැනි දින වන විට සෙලාන් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රු. 16,24,970.34 මුදලද, 2009 ජූලි මස 10 දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට තිස්දෙක (32%) බැගින් වූ පොලිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුණු වෙනත් ගාස්තුද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහතකී අංක 503 දරන බැඳුම්කරය මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස් කර ඇත්තාවූ මෙහි පහත සඳහන් උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ සහ පරිශ්‍රය බලයලත් වෙන්දේසිකාර අයි. ඩබ්ලිව්. ජයසූරිය මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### පළමු උපලේඛනය

නැගෙනහිර පළාතේ, මඩකලපුව දිස්ත්‍රික්කයේ, මන්මුනෙයි පත්තුවේ, කොඩ්ඩෙයිමුනෙයි ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු එච්. ජේ. ජේ. ඉස්තෝගුපිල්ලෙයි විසින් සාදන ලද 1953.02.13 දිනැති අංක 13 දරන සැලැස්මේ සඳහන් වරිපනම් අංක 86/01 දරන කුලවාඩි පිහිටි කුලවාඩි ප්‍රොස්පෙක්ට් නමැති ඉඩමේ බෙදූ ලොට් අංක 04ට මායිම්, උතුරට : එස්. ශ්‍රීස්කන්ධකුමාරට අයිති එකී අංක 13 දරන සැලැස්මේ ලොට් අංක 05 ද, නැගෙනහිරට : එස්. ශ්‍රීස්කන්ධට අයිති එකී සැලැස්මේ සඳහන් ලොට් 06 ද, දකුණට : පීපීජ්/1404 හි සඳහන් ඉඩම ද, සහ බස්නාහිරට : එස්. ශ්‍රීස්කන්ධවේල් සහ තවත් අයට අයිති ඉඩම ද යන මායිම් නැගෙනහිර පැත්තෙන් අඩි එකසිය තිස් නවයක් (අඩි 139) උතුරු පැත්තෙන් අඩි දෙසිය දොළහක් (අඩි 212) දකුණු පැත්තෙන් අඩි දෙසිය හැට හතරක් (අඩි 264) සහ බස්නාහිර : පැත්තෙන් අඩි දෙසිය හැට හතරක් (අඩි 264) ක් විශාල එහි තුළ අඩංගු සියලු අයිතීන් සහ සියලු දේ සමග ඉඩම.

බර තැබූ මධ්‍යක, මූලික ණය පොළී අනුපාතිකයට (AWPR) වර්ෂයකට සියයට හතක් (7%) ඉහළ අනුපාතිකයක් වන, ආසන්නතම ඉහළ 0.5% වාර්ෂික අනුපාතිකයට තීන්දු කරන අනුපාතිකය මත පොලිය ද, රුපියල් පනස් පන් ලක්ෂ පහළොස් දහස් තුන්සිය තිස් පහක් (රු. 55,15,335) සඳහා එක් එක් වර්ෂයේ සෑම තුන් මසකට වරක් ජනවාරි, අප්‍රේල්, ජූලි සහ ඔක්තෝබර් යන මාසවල ව්‍යාපාරික කටයුතු කරන ප්‍රථම දිනයේ දී ප්‍රතිශෝධනය කරනු ලබන, බර තැබූ මධ්‍යක, මූලික ණය පොළී අනුපාතිකයට (AWPR) වර්ෂයකට සියයට හයකුත් දශම පහක් (6.5%) ඉහළ අනුපාතිකයක් වන, ආසන්නතම ඉහළ 0.5% වාර්ෂික අනුපාතිකයට තීන්දු කරන අනුපාතිකය මත පොලිය ද, රුපියල් දස ලක්ෂ තිස් අට දහස් එකසිය අසූ පහකුත් ශත හතලිස් තුනක් (රු. 10,38,185.43) සඳහා වර්ෂයකට සියයට විස්ස (20%) බැගින් පොලිය ද ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද,

ඉහත කී උකස් බැඳුම්කර මත අයවිය යුතු මුදල වන රුපියල් දෙකෝටි පනස් හය ලක්ෂ පනස් හතර දහස් දෙසිය පනස් නවයකුත් ශත විසිඅටක (රු.2,56,54,259.28) මුදලක් සහ 2010 පෙබරවාරි මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් එක් කෝටි පනස් පන් ලක්ෂ පනස් පන්දහස් පන්සිය හතලිස් අටක් (රු. 1,55,55,548) සඳහා, එක් එක් වර්ෂයේ සෑම තුන් මසකට වරක් ජනවාරි, අප්‍රේල්, ජූලි සහ ඔක්තෝබර් යන මාසවල ව්‍යාපාරික කටයුතු කරන ප්‍රථම දිනයේ දී ප්‍රතිශෝධනය කරනු ලබන, බර තැබූ මධ්‍යක, මූලික ණය පොළී අනුපාතිකයට ( AWPR) වර්ෂයකට සියයට හතක් (7%) ඉහළ අනුපාතිකයක් වන, ආසන්නතම ඉහළ 0.5% වාර්ෂික අනුපාතිකයට තීන්දු කරන අනුපාතිකය මත පොලිය ද, රුපියල් පනස් පන් ලක්ෂ පහළොස් දහස් තුන්සිය තිස් පහක් (රු. 55,15,335) සඳහා එක් එක් වර්ෂයේ සෑම තුන් මසකට වරක් ජනවාරි, අප්‍රේල්, ජූලි සහ ඔක්තෝබර් යන මාසවල ව්‍යාපාරික කටයුතු කරන ප්‍රථම දිනයේදී ප්‍රතිශෝධනය කරනු ලබන බර තැබූ මධ්‍යක, මූලික ණය පොළී අනුපාතිකයට (AWPR) වර්ෂයකට සියයට හයකුත් දශම පහක් (6.5%) ඉහළ අනුපාතිකයක් වන, ආසන්නතම ඉහළ 0.5% වාර්ෂික අනුපාතිකයට තීන්දු කරන අනුපාතිකය මත පොලිය ද, රුපියල් දස ලක්ෂ තිස් අට දහස් එකසිය අසූ පහකුත් ශත හතලිස් තුනක් (රු. 10,38,185,43) සඳහා වර්ෂයකට සියයට විස්ස (20%) බැගින් පොලිය හෝ විකිණීමේ දිනට එයින් නොගෙවා ඉතිරිව ඇති යම් කොටසක් මීට අදාළ ඉඩම හා පරිශ්‍රය සහ එහි පිහිටි සියලු දේ විකිණීම පිළිබඳ ප්‍රචාරක ගාස්තු හා විකිණීමේ ගාස්තු ද, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද, ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය ප්‍රකාර එකී උකස් බැඳුම්කර වල ප්‍රඥප්ති අනුව ඩීඑෆ්සීසී බැංකුව වැය කර ඇති සියලු මුදල් හා දරා ඇති සියලු වියදම් හා ගාස්තු ද සමග අයකර ගැනීම සඳහා ඉහත කී අංක 7659 සහ 7953 දරන උකස් බැඳුම්කර මගින් ඩීඑෆ්සීසී බැංකුව වෙත උකස් කර ඇති මෙහි පහත විස්තර කරන ඉඩම හා පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් සහ සංශෝධිත පරිදි වූ 1955 අංක 35 දරන ලංකා සංවර්ධන මුදල් සංස්ථා පනතින් පැවරී ඇති බලතල යටතේ ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කරයි.

**7659 හා 7953 දරන උකස් බැඳුම්කර මගින් උකස් කරන ලද දේපළ විස්තරය**

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, පානදුර තොටමුණේ, පානදුර තල්පිටි දෙබද්ද ප්‍රාදේශීය සභා සීමාව ඇතුළත, කෙසෙල්වත්ත උපකාර්යාල බලප්‍රදේශයේ, හොරේතුඩුවේ පිහිටි, "හොරේතුඩුවේ කුරුඳුවත්ත නොහොත් ගොරකගහලන්ද, පොකුණේවත්ත සහ හොරතුඩුවෙවත්ත ලොට් අංක 1 සහ හොරේතුඩුවේ කුරුඳුවත්ත නොහොත් ගොරකගහලන්ද, පොකුණෙවත්ත හා හොරේතුඩුවෙවත්ත ලොට් X2 යන ඒකාබද්ධ බිම් කට්ටි දෙක" නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු ඒ. එම්. ආර්. ජයසේකර විසින් මැන සකස් කළ අංක 4232 හා 2004.11.20 දින දරන පිඹුරේ ලොට් A දරන වරිපනම් අංක 30A දරන බිම් කට්ටියට මායිම්, උතුරට : අංක 3090 දරන පිඹුරේ ලොට් A දරන බිම් කට්ටියේ කොටසක් සහ අංක 1710 දරන පිඹුරේ ලොට් අංක 12 (අඩි 15ක් පළල පාර) ද, නැගෙනහිරට : අංක 1710 දරන පිඹුරේ ලොට් 13A සහ 13B ද, දකුණට : අංක 1710 දරන පිඹුරේ ලොට් 19 (අඩි 15ක් පළල පාර) සහ අංක 2996 දරන පිඹුරේ ලොට් ද, බස්නාහිරට : අංක 2996 දරන පිඹුරේ ලොට් XX1 සහ අංක 3090 දරන පිඹුරේ ලොට් A කොටසක් ද යන මායිම් ඇතුළත පර්චස් තිස් පහකුත් දශම එකයි පහක් (අ. 0, රූ. 0, ප. 35.15) නොහොත් හෙක්ටෙයාර 0.0889 ක් බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩමේ බිම සහ එහි පිහිටි ගසකොළ, වැවිලි සහ ගොඩනැගිලි ද වේ.

2. ඉහත කී හොරේතුඩුවේ පිහිටි, හොරේතුඩුවේ කුරුඳුවත්ත නොහොත් ගොරකගහලන්ද සහ පොකුණේවත්ත, හොරේතුඩුවේ කුරුඳුවත්ත නොහොත් ගොරකගහලන්ද සහ හොරේතුඩුවේ වත්ත ඒකාබද්ධ ලොට් 25 සහ 26 නමැති ඉඩම් බලයලත් මිනින්දෝරු ඒ. එම්. ආර්. ජයසේකර මැන සකස් කළ අංක 3503 හා 2003.07.13 දරන දරන පිඹුරේ දැක්වෙන ලොට් A හා වරිපනම් අංක 18 දරන බිම් කට්ටියට මායිම්, උතුරට : අංක 1710 දරන පිඹුරේ (අඩි 15ක් පළල පාරක් වූ) ලොට් අංක 19 ද, නැගෙනහිරට: අංක 1710 දරන පිඹුරේ ලොට් අංක 24 ද, දකුණට : අංක 1710 දරන පිඹුරේ (අඩි 12ක් පළල පාරක් වූ) ලොට් අංක 30 සහ ලොට් අංක 29 ද, බස්නාහිරට: අංක 1710 දරන පිඹුරේ ලොට් 27 ද, යන මායිම් ඇතුළත පර්චස් තිස් එකකුත් දශම එකයි බිංදුවක් (අ. 0, රූ. 0, ප. 31.10) නොහොත් හෙක්ටෙයාර 0.0786 ක් බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩමේ බිම සහ එහි පිහිටි ගසකොළ, වැවිලි සහ ගොඩනැගිලි ද වේ.

මෙයට මෙහි පහත විස්තර කරන බිම් කට්ටි මතින් මාර්ග අයිතිය ද ඇතුළත් වේ :

(1) ඉහත කී හොරේතුඩුවේ පිහිටි හොරේතුඩුව, කුරුඳුවත්ත නොහොත් ගොරකගහලන්ද සහ පොකුණේවත්ත, හොරේතුඩුවේ කුරුඳුවත්ත නොහොත් ගොරකගහලන්ද සහ හොරේතුඩුවේ වත්ත නමැති ඉඩමේ, බලයලත් මිනින්දෝරු බී. එල්. ඩී. ප්‍රනාන්දු විසින් මැන සකස් කළ අංක 3114 හා 1990.04.24 දින දරන පිඹුරේ දැක්වෙන ලොට් අංක 2 (අඩි 15ක් පළල පාර) ට මායිම්, උතුරට : අංක 1710 දරන පිඹුරේ ලොට් A දරන බිම් කට්ටියේ ඉතිරි කොටස ද, නැගෙනහිරට : අඩි 15ක් පළල පාර ද, දකුණට: මෙහි ලොට් අංක 1 ද, බස්නාහිරට : අංක 3090 දරන පිඹුරේ ලොට් A දරන බිම් කට්ටියේ ඉතිරි කොටස ද යන මායිම් ඇතුළත පර්චස් තුනයි දශම හතරයි බිංදුවක් (අ. 0, රූ. 0, ප. 3.40) නොහොත් හෙක්ටෙයාර 0.0086ක් බිම් ප්‍රමාණයෙන් යුත් බිම් කට්ටිය.

(2) ඉහත කී හොරේතුඩුවේ පිහිටි හොරේතුඩුව කුරුඳුවත්ත නොහොත් ගොරකගහලන්ද සහ පොකුණේවත්ත, හොරේතුඩුවේ කුරුඳුවත්ත නොහොත් ගොරකගහලන්ද සහ හොරේතුඩුවේ වත්ත නමැති ඉඩමේ ලොට් අංක 19 (අඩි 15ක් පළල පාර)ට මායිම්, උතුරට : ලොට් අංක 11, 13B, 14B, 15B, 16B, 17B, සහ 18 B ද, නැගෙනහිරට : බලයලත් මිනින්දෝරු සී. ඩබ්ලිව්. ඒ. මැල් විසින් මැන සකස් කළ අංක 1396 හා 1960.02.06 දින දරන පිඹුරේ ලොට් අංක 27 ද, දකුණට : අංක 1710 දරන පිඹුරේ ලොට් 20, 21, 22, 23, 24, 25, 26, 27 හා 28 ද, බස්නාහිරට : අංක 1710 දරන පිඹුරේ ලොට් අංක 10 ද යන මායිම් ඇතුළත බලයලත් මිනින්දෝරු සී. ඩබ්ලිව්. ද මැල් විසින් මැන සකස් කළ අංක 1710 හා 1966.01.15 දින දරන පිඹුර ප්‍රකාර පර්චස් විසිහයකුත් දශම නවයයි පහක් (අ. 0, රූ. 0, ප. 26.95) බිම් ප්‍රමාණයෙන් යුත් බිම් කට්ටිය.

(3) ඉහත කී හොරේතුඩුවේ පිහිටි හොරේතුඩුවේ, කුරුඳුවත්ත නොහොත් ගොරකගහලන්ද සහ පොකුණේවත්ත, හොරේතුඩුවේ කුරුඳුවත්ත නොහොත් ගොරකගහලන්ද සහ හොරේතුඩුවේ වත්ත නමැති ඉඩමේ ලොට් අංක 19 (අඩි 15ක් පළල පාර) ට මායිම්. උතුරට : ලොට් අංක 25, 24, 23, 22, 21 සහ 20 ද, නැගෙනහිරට : පාර සඳහා වෙන් කළ බිම, දකුණට : පාර සඳහා වෙන් කළ බිම සහ ලොට් 34, 33, 32, සහ 31 ද,

බස්නාහිරට : ලොට් අංක 29 ද යන මායිම් ඇතුළත ඉහත කී අංක 1710 දරන පිඹුර ප්‍රකාර පර්චස් දහතුනකුත් දශම අටක් (අ. 0, රූ. 0, ප. 13.8) බිම් ප්‍රමාණයෙන් යුත් බිම් කට්ටිය.

ඒ. එන්. ෆොන්සේකා,
සාමාන්‍යාධිකාරී.

ඩීඑෆ්සීසී බැංකුව,
අංක 73/5, ගාලු පාර,
කොළඹ 03.

06-618/1

---

## ලංකා බැංකුව - මීගමුව කඩවීදිය ශාඛාව

1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වැනි වගන්තිය යටතේ දැන්වීම

2010.03.18 වැනි දින පවත්වන ලද රැස්වීමක දී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී :

1. මහජන නොතාරිස් ජී. සී. පී. තිලකරත්න විසින් සහතික කරන ලද 2009.02.25 දිනැති අංක 3439 දරන බැඳුම්කරය මත මුල් මුදල හා 2010.01.28 වැනි දින තෙක් ණය මුදල් දෙක මත පොළිය වශයෙන් රුපියල් හතලිස් නව ලක්ෂ පනස් දහස් පන්සිය හතලිස් නවයයි ශත දෙකක (රු. 49,50,549.02) මුදලක් සමඟ ණය මුදල (I) රුපියල් හයලක්ෂ අනූපන්දහස් අටසිය හැත්තෑ නවයයි ශත තිස්හතක (රු. 6,95,879.37) හා ණය මුදල (II) රුපියල් තිස්හය ලක්ෂ පනස්නව දහස් තුන්සිය පනහයි ශත හැටක් (රු. 36,59,350.60) මත වසරකට සියයට දාසය (16%) බැගින් පොළියක් ද, 2010.01.28 වැනි දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් කොච්චිකඩේ, දලුවකොටුව, අඩි 60 පාර, සින්නමෝලේවත්ත, අංක 284 5බී/බී2 හි පදිංචි පිරමාන සිංහගේ ජගත් වසන්ත ෆොන්සේකා මහතාගෙන් අයවිය යුතුව ඇත.

2. එකී අංක 3439 දරන බැඳුම්කරය මත අයවිය යුතු එකී රුපියල් හතලිස් නවලක්ෂ පනස් දහස් පන්සිය හතලිස් නවයයි ශත දෙකක (රු. 49,50,549.02) මුදල සමඟ 2010.01.29 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් ඉහත කී ආකාරයට අයවිය යුතු පොළිය ද, ලංකා බැංකු ආඥාපනතේ 26 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල් ද අයකරගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරනු ලැබ මෙහි පහත විස්තර කොට ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කොළොන්නාව, විහාර මාවත, අංක 50/3 හි පදිංචි වෙන්දේසිකාර ටී. ඇන්ඩ් එච්. ඔක්ෂන්ස් හි තුසිත කරුණාරත්න මහතාට එකී ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 19 වැනි වගන්තිය යටතේ ද, ලංකා බැංකු ආඥාපනතේ 21 වැනි වගන්තිය යටතේ මෙම යෝජනාවේ දැන්වීම පළ කිරීමට ලංකා බැංකුව, මීගමුව කඩවීදිය ශාඛාවේ කළමනාකරුට ද මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

### උපලේඛනය

### විකිණීමට ඇති දේපළ

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරළයේ, දූනගහපත්තුවේ, මීගමු මහ නගර සභා සීමාව තුළ පල්ලංසේන උතුර පිහිටි පාසැල් පටුමගේ, වරිපනම් අංක 12/43 දරන හික්ගහවත්ත, ඉරිප්පුවෙල, හික්ගහකුඹුර, තල්ගහවත්ත, සියඹලාගහවත්ත නොහොත් කෝන්ගහවත්ත, කෝන්ගහවත්ත නොහොත් නිත්තුල්ලගහවත්ත, කරදගහකුඹුරෙහි ලොට් 3 හා 4 දැනට ඉරිප්පුවෙල නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩබ්. ඒ. ප්‍රනාන්දු විසින් සාදන ලද 1995 ජනවාරි 05 සහ 07 දිනැති අංක 6114ඒ දරන පිඹුරෙහි ලොට් ඩී. ලෙස දක්වා සීමා නිර්ණය කොට නිරූපනය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් ඩී උතුරට : ලොට් සී ද, නැගෙනහිරටඃ ලොට් වී (අඩි 15ක් පළල පාරට වෙන්කළ කොටස) ද, දකුණට : ලොට් ඊ ද, බස්නාහිරට : (මහ නගර සභා පාර) සොයිසාවත්ත පාර ද මායිම්ව එකී අංක 6114ඒ දරන පිඹුර ප්‍රකාර පර්චස් දහයකින් (අ. 0, රූ. 0, පර්. 10) යුක්තවන අතර, එහි ඇති ගහකොළ වැවිලි සහ වෙනත් සියලු දේ ද වේ. මෙය මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඊ 630/319 හි ලියාපදිංචි කර ඇත.

මේ සමඟ මෙයට එකී අංක 6114ඒ දරන පිඹුරෙහි නිරූපිත ලොට් ජී ලෙස දක්වා ඇති පාරට වෙන්කළ කොටස (අඩි 15 පළල පාර), ලොට් වී (අඩි 15 පළල පාර) සහ ලොට් ඩබ්ලිව් (අඩි 12 පළල පාර) මතින් පාරේ අයිතිය ද ඇත.

ජී. එච්. එස්. ප්‍රනාන්දු මහතා,
ශාඛා කළමනාකරු.

ලංකා බැංකුව,
මීගමුව කඩවීදිය ශාඛාව.

06-591

---

## ඩීඑෆ්සීසී බැංකුව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය ප්‍රකාර ඩීඑෆ්සීසී බැංකුව විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනා සම්මතය ඒකච්ඡන්දයෙන් සම්මත කරගන්නා ලද බව 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 08 වැනි වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ :

### අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය

ඩීඑෆ්සීසී බැංකුව නමට කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එල්. එස්. ජයසිංහ විසින් ලියා සහතික කරන ලද අංක 247 හා 2004 මාර්තු 04 දින දරන හා අංක 371 හා 2004 නොවැම්බර් 25 දින දරන උකස් බැඳුම්කර දෙක මත අයවිය යුතු මුදල් ගෙවීම 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ යථා පරිදි සංස්ථාගත කර ඇත්තා වූ ද, ලියාපදිංචි කාර්යාලය කොළඹ 3, ගෝල්ෆේස් කෝට්, යුනිට් අංක 34 දරන ස්ථානයේ පිහිටා ඇත්තා වූ ද (මෙහි මින් ඉදිරියට "එකී සමාගම" යනුවෙන් සඳහන් කරනු ලබන්නා වූ ද) සමාගමක් වන, "එස්. ඩබ්ලිව්. කේ. හෝල්ඩිංස් (ප්‍රයිවෙට්) ලිමිටඩ්" සමාගම විසින් පැහැර හැර ඇති හෙයින් ද, 2010 මාර්තු 31 වැනි දිනට ඉහත කී අංක 247 හා 371 දරන බැඳුම්කර මත එකී එස්. ඩබ්ලිව්. කේ. හෝල්ඩිංස් (ප්‍රයිවෙට්) ලිමිටඩ් සමාගමෙන් ඩීඑෆ්සීසී බැංකුවට රුපියල් තුන්කෝටි හයලක්ෂ තිස් දෙදහස් හාරසිය පනස්

අටකුත් ශත හැටඅටක (රු. 3,06,32,458.68) මුදලක් සහ 2010 අප්‍රේල් 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් එක්කෝටි තිස්හත් ලක්ෂ හතලිස් නව දහස් නවසිය හතලිස් අටක් (රු. 1,37,49,948) සඳහා එක් එක් වර්ෂයේ සෑම තුන් මසකට වරක් ජනවාරි, අප්‍රේල්, ජූලි සහ ඔක්තෝබර් මාසවල ව්‍යාපාර කටයුතු කරන ප්‍රථම දිනයේ දී ප්‍රතිශෝධනය කරනු ලබන, බරතැබූ මධ්‍යක මූලික ණය පොළී අනුපාතිකයට වර්ෂයකට සියයට හයක් (6%) ඉහළ අනුපාතිකයක් මත ගණන් බලනු ලබන ආසන්නතම ඉහළ 0.5% ට තීන්දු කරන අනුපාතිකය මත පොළිය ද, රුපියල් පන්ලක්ෂ පනස් පන් දහස් පන්සිය තිස්හයක් (රු. 55,55,536) සඳහා එක් එක් වර්ෂයේ සෑම තුන් මසකට වරක් ජනවාරි, අප්‍රේල්, ජූලි, ඔක්තෝබර් යන මාසවල ව්‍යාපාර කටයුතු කරන ප්‍රථම දිනයේ දී ප්‍රතිශෝධනය කරනු ලබන බර තැබූ මධ්‍යක මූලික ණය පොළී අනුපාතිකයට (ඒ. ඩබ්ලිව්.පී. ආර්.) වර්ෂයකට සියයට හයකුත් දශම පහක් (6.5%) ඉහළ අනුපාතිකයක් මත ගණන් බලනු ලබන ආසන්නතම ඉහළ 0.5% ට තීන්දු කරන වාර්ෂික අනුපාතිකය මත පොළිය ද ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද,

ඉහත කී උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල වන රුපියල් තුන්කෝටි හයලක්ෂ තිස් දෙදහස් හාරසිය පනස්අටකුත් ශත හැට අටක (රු. 3,06,32,458.68) මුදලක් සහ 2010 අප්‍රේල් 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් එක්කෝටි තිස්හත් ලක්ෂ හතලිස් නව දහස් නවසිය හතලිස් අටක් (රු. 1,37,49,948) සඳහා එක් එක් වර්ෂයේ සෑම තුන් මසකට වරක් ජනවාරි, අප්‍රේල්, ජූලි සහ ඔක්තෝබර් මාසවල ව්‍යාපාර කටයුතු කරන ප්‍රථම දිනයේ දී ප්‍රතිශෝධනය කරනු ලබන, බරතැබූ මධ්‍යක මූලික ණය පොළී අනුපාතිකයට වර්ෂයකට සියයට හයක් (6%) ඉහළ අනුපාතිකයක් මත ගණන් බලනු ලබන ආසන්නතම ඉහළ 0.5% ට තීන්දු කරන අනුපාතිකය මත පොළිය ද, රුපියල් පනස් පන් ලක්ෂ පනස් පන් දහස් පන්සිය තිස් හයක් (රු. 55,55,536) සඳහා එක් එක් වර්ෂයේ සෑම තුන්මසකට වරක් ජනවාරි, අප්‍රේල්, ජූලි, ඔක්තෝබර් යන මාසවල ව්‍යාපාර කටයුතු කරන ප්‍රථම දිනයේ දී ප්‍රතිශෝධනය කරනු ලබන බර තැබූ මධ්‍යක මූලික ණය පොළී අනුපාතිකයට (ඒ. ඩබ්ලිව්. පී. ආර්) වර්ෂයකට සියයට හයකුත් දශම පහක් (6.5%) ඉහළ අනුපාතිකයක් මත ගණන් බලනු ලබන ආසන්නතම ඉහළ 0.5%ට තීන්දු කරන වාර්ෂික අනුපාතිකය මත පොළිය හෝ විකිණීමේ දිනට එයින් නොගෙවා ඉතිරිව ඇති යම් කොටසක් මීට අදාළ ඉඩම හා පරිශ්‍රය විකිණීම පිළිබඳ ප්‍රචාරක ගාස්තු හා විකිණීමේ ගාස්තු ද, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද, ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය ප්‍රකාර එකී උකස් බැඳුම්කරවල ප්‍රඥප්ති අනුව ඩීඑෆ්සීසී බැංකුව වැය කර ඇති සියලු මුදල් හා දරා ඇති සියලු වියදම් හා ගාස්තු ද සමග අයකර ගැනීම සඳහා ඉහත කී අංක 247 හා 371 දරන උකස් බැඳුම්කර මගින් ඩීඑෆ්සීසී බැංකුව වෙත උකස් කර ඇති මෙහි පහත විස්තර කරන ඉඩම හා පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහතුන් ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් සහ සංශෝධිත පරිදි වූ 1955 අංක 35 දරන ලංකා සංවර්ධන මුදල් සංස්ථා පනතින් පැවරී ඇති බලතල යටතේ ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කරයි.

### අංක 247 හා 371 දරන උකස් බැඳුම්කර මගින් උකස් කරන ලද දේපළ විස්තරය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළයේ, පල්ලේ පත්තුවේ, මොරටුව නගර සභා සීමාව ඇතුළත, තෙලවල පිහිටි "ලේඩි කැතරින් ගෘප් " නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු පී. සින්නතම්බි විසින් මැන සකස් කළ අංක 3810 හා 1992 දෙසැම්බර් 10 වැනි දින දරන පිඹුරේ ලොට් අංක 1 ලකුණු කළ බිම් කට්ටිය වූ දැනට කටුබැද්ද, ගාලු පාර, වරිපනම් අංක 586 දරන බිම් කට්ටියට මායිම්, උතුරට : මොඩල් ටවුන් පාර ද, නැගෙනහිරට : බලයලත් මිනින්දෝරු එච්. ඩබ්ලිව්. ප්‍රනාන්දු මැන සකස් කළ අංක 3239 හා 1965 අප්‍රේල් 13 දින දරන පිඹුරේ ලොට් 15 සී දරන බිම් කට්ටිය ද, දකුණට : බලයලත් මිනින්දෝරු බී. මහේන්ද්‍රන් මැන සකස් කළ අංක 191 හා 1978 මාර්තු 06 වැනි දින දරන පිඹුරේ ලොට් අංක 2 ලකුණු කළ ගාලු පාර වරිපනම් අංක 584 දරන ඉඩම සහ ලංකා විදුලිබල මණ්ඩලයේ ඉඩම ද, බස්නාහිරට : ගාලු පාර ද, යන මායිම් ඇතුළත ඉහත කී අංක 3810 දරන පිඹුර ප්‍රකාර රූඩ් එකකුත්, පර්චස් විසි හතරකුත් දශම හතරයි පහක් (අ. 0, රූ. 1, පර්. 24.45) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම සහ එහි පිහිටි සියලු දේ. මෙම ඉඩම දෙහිවල - ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර තිබේ.

මෙයට මෙහි පහත දැක්වෙන බිම් කට්ටිය තුළින්, මතින් සහ ඔස්සේ මාර්ග අයිතිය ද ඇතුළත් වේ :

ඉහත සඳහන් තෙලවල පිහිටි, බලයලත් මිනින්දෝරු එච්. එම්. ප්‍රනාන්දු මැන සකස් කළ, අංක 3239 හා 1965 අප්‍රේල් 13 වැනි දින දරන පිඹුරේ දැක්වෙන ලොට් 15H ලෙස ලකුණු කළ (අඩි 40ක් පළල) බෙදා වෙන් කළ බිම් කොටස වූ එකී ලොට් 15H දරන බිම් කට්ටියට මායිම්, උතුරට : අංක 3239 දරන පිඹුරේ ලොට් 15B, 15C, 15D, 15E, 15F සහ 15G ද, නැගෙනහිරට : බලයලත් මිනින්දෝරු එච්. ඩබ්ලිව්. ප්‍රනාන්දු මැන සකස් කළ අංක 2833 හා 1962 ජූලි 31 වැනි දින දරන පිඹුරේ ලොට් අංක 14 ද, දකුණට : ඉහත කී අංක 3239 දරන පිඹුරේ ලොට් 15 I, 15 J, 15K, 15L, 15M සහ 15N ද, බස්නාහිරට : කොළඹ - ගාල්ල පාර ද යන මායිම් ඇතුළත එකී අංක 3239 දරන පිඹුර ප්‍රකාර රූඩ් දෙකකුත්, පර්චස් තිහයි දශම බිංදුවයි පහක් (අ. 0, රූ. 2, පර්. 30.05) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම වේ. මෙය දෙහිවල-ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර තිබේ.

ඒ. එන්. ෆොන්සේකා,
සාමාන්‍යාධිකාරී.

ඩීඑෆ්සීසී බැංකුව,
අංක 73/5, ගාලු පාර,
කොළඹ 3.

06-616/2

---

## ලංකා බැංකුව

### 1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වැනි වගන්තිය යටතේ දැන්වීම

2010.03.18 වැනි දින පවත්වන ලද රැස්වීමක දී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී :

1. මහජන නොතාරිස් ඒ. සී. පී. තිලකරත්න විසින් සහතික කරන ලද 2003.09.08 දිනැති අංක 2199 දරන බැඳුම්කරය, මහජන නොතාරිස් බී. බී. රණසිංහ විසින් සහතික කරන ලද 2006.08.14 වැනි දිනැති අංක 5061 දරන බැඳුම්කරය මත මුල් මුදල හා 2010.02.15 වැනි දින තෙක් පොලිය වශයෙන් රුපියල් හැත්තෑඑක්ලක්ෂ හැත්තෑපන් දහස් හත්සිය තිස්අටයි ශත අසූනවයක (රු. 71,75,738.89) මුදලක් සමග ණය හා අයිරා ගිණුම රුපියල් දාහතර ලක්ෂ දහදහස් හත්සිය දාහතරයි ශත විසිපහක (රු. 14,10,714.25) මුදලක් මත වසරකට සියයට විසිඅට (28%) බැගින් ද, අනුමත කළ සීමාව වන රුපියල් හතලිස් ලක්ෂයක් (රු. 40,00,000) දක්වා වර්ෂයකට සියයට විසිනවය (29%) බැගින් (ස්ථිර අයිරා සීමාව ඉක්මවා ගිය මුදල වන (රුපියල් දාහතර ලක්ෂ අනූහය දහස් අටසිය විසිහතයි ශත අසූවක (රු. 14,96,827.80) මුදල ඇතුළත් කොට නොමැත) පොළියක් ද, 2010.02.16 වැනි දින සිට ගෙවීම නිම

කරන දිනය තෙක් කැළණිය, නුවර පාරේ, අංක 1023/A හි "ගුඩ්විල් මෝටර්ස් " හි හවුල්කරුවන් වන කැළණිය, නුංගමුගොඩ, ශාන්ත ජෝෂප් වත්ත, අංක 435/10/A හි පදිංචි ඇහැලපිටිය හේවගේ ක්‍රිෂාන්ත රණසිංහ සහ තෙලිකඩ පල්ලගේ ඉන්ද්‍රානි මහත්මිය යන අයගෙන් අයවිය යුතුව ඇත.

2. එකී අංක 2199 සහ 5061 දරන බැඳුම්කර මත අයවිය යුතු එකී රුපියල් හැත්තෑඑක්ලක්ෂ හැත්තෑපන් දහස් හත්සිය තිස්අටයි ශත අසූනවයක (රු. 71,75,738.89) (ස්ථිර අයිරා සීමාව ඉක්මවා ගිය මුදල වන රුපියල් දාහතර ලක්ෂ අනූහය දහස් අටසිය විසිහතයි ශත අසූවක (රු. 14,96,827.80) මුදල ඇතුළත් කොට නොමැත) මුදල සමග 2010.02.16 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් ඉහත කී ආකාරයට අයවිය යුතු පොළිය ද, ලංකා බැංකු ආඥාපනතේ 26 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරනු ලැබ මෙහි පහත විස්තර කොට ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කොලොන්නාව, විහාර මාවත, අංක 50/3 හි පදිංචි වෙන්දේසිකාර ටී ඇන්ඩ් එච් ඔක්ෂන්ස් හි තුසිත කරුණාරත්න මහතාට එකී ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 19 වැනි වගන්තිය යටතේ ද ලංකා බැංකු ආඥාපනතේ 21 වැනි වගන්තිය යටතේ මෙම යෝජනාවේ දැන්වීම පළ කිරීමට ලංකා බැංකුව, පැලියගොඩ අධිශ්‍රේණි ශාඛාවේ, ජ්‍යෙෂ්ඨ කළමනාකරුට ද මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

### විකිණීමට ඇති දේපළ

### ඉහත සඳහන් උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළයේ, අධිකාරි පත්තුවේ, කැළණිය ප්‍රාදේශීය සභා සීමාව තුළ (කැළණිය උප කාර්යාලය) දළුගම, හිඹුටුවෙල්ගොඩ පිහිටි, නුවර පාරේ, වරිපනම් අංක 1021/A දරන කටහගහවත්තෙහි ලොට් C නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු කේ. ඒ. රූපසිංහ විසින් සාදන ලද 1991.08.18 දිනැති අංක 514/1991 දරන පිඹුරෙහි ලොට් A ලෙස දක්වා සීමා නිර්ණය කොට ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ඉඩම, උතුරට : නන්දදේවගේ නුවර පාරේ, වරිපනම් අංක A/1019 (කොටස), දරන පරිශ්‍රය ද, නැගෙනහිරට : සිරිසේන දැඩිගමගේ නුවර පාරේ, වරිපනම් අංක 1021 (කොටස) දරන එම ඉඩමේ කොටසක් ද, දකුණට : නුවර පාර ද, බස්නාහිරට : නන්දදේවගේ නුවර පාරේ වරිපනම් අංක A/1019 (කොටස) දරන පරිශ්‍රය ද, මායිම්ව එකී අංක 514/1991 දරන පිඹුර ප්‍රකාර පර්චස් තුනයි දශම නවයයි බිංදුවක (අ. 0, රූ. 0, පර්. 3.90) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ C 508/122 හි ලියාපදිංචි කර ඇත.

එම්. කේ. පී. කබ්රාල් මහත්මිය,
ජ්‍යෙෂ්ඨ කළමනාකරු.

ලංකා බැංකුව,
පැලියගොඩ අධිශ්‍රේණි ශාඛාව.

06-590

---

### ඩීඑෆ්සීසී බැංකුව

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය ප්‍රකාර ඩීඑෆ්සීසී බැංකුව විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනා සම්මතය ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලද බව 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 08 වැනි වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය

ඩීඑෆ්සීසී බැංකුව නමට ප්‍රසිද්ධ නොතාරිස් ඒ. එම්. එම්. රවුප් විසින් ලියා සහතික කරන ලද අංක 1811 හා 2009 මැයි මස 25 වැනි දින ද අංක 1804 සහ 2009 මැයි මස 13 වැනි දින ද දරන උකස් බැඳුම්කර මත, අයවිය යුතු මුදල් ගෙවීම, 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ යථා පරිදි සංස්ථාගත කරන ලද්දා වූ ද ලියාපදිංචි කාර්යාලය පොළොන්නරුවේ පිහිටා ඇත්තාවූ ද, සමාගමක් වන (මෙහි මින් ඉදිරියට "එකී සමාගම" යනුවෙන් සඳහන් කරන) "සේවාගම රයිස් ප්‍රොඩක්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්" යන සමාගම විසින් පැහැර හැර ඇති හෙයින් ද, 2010 පෙබරවාරි මස 28 වැනි දිනට එකී සමාගමෙන් ඩීඑෆ්සීසී බැංකුවට ඉහත සඳහන් අංක 1811 සහ 1804 දරන උකස් බැඳුම්කර මත රුපියල් තුන්කෝටි අටලක්ෂ විසිපන් දහස් අනූ පහකුත් ශත තිස් දෙකක (රු. 3,08,25,095.32) මුදලක් සහ 2010 මාර්තු මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් තුන් කෝටියක් (රු. 3,00,00,000) සඳහා වර්ෂයකට සියයට දහයකුත් දශම පහක් (10.5%) බැගින් වූ අනුපාතිකය මත පොළිය ද ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද,

ඉහත කී උකස් බැඳුම්කර මත අයවිය යුතු මුදල වන රුපියල් තුන්කෝටි අටලක්ෂ විසිපන් දහස් අනූ පහකුත් ශත තිස් දෙකක (රු. 3,08,25,095.32) මුදල සහ 2010 මාර්තු මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් තුන් කෝටියක් (රු. 3,00,00,000) සඳහා වර්ෂයකට සියයට දහයකුත් දශම පහක් (10.5%) බැගින් වූ අනුපාතිකය මත පොළිය හෝ විකිණීමේ දිනට එයින් නොගෙවා ඉතිරිව ඇති යම් කොටසක් මීට අදාළ ඉඩම හා පරිශ්‍රය සහ මෙහි පහත විස්තර කරන පිරියත හා යන්ත්‍රෝපකරණ විකිණීම පිළිබඳ ප්‍රචාරක ගාස්තු හා විකිණීමේ ගාස්තු ද 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය ප්‍රකාර එකී උකස් බැඳුම්කරවල ප්‍රඥප්ති අනුව ඩීඑෆ්සීසී බැංකුව වැය කර ඇති සියලු මුදල් හා දරා ඇති සියලු වියදම් හා ගාස්තු ද සමග අයකර ගැනීම සඳහා සමාගම සඳහා සහ වෙනුවෙන් එහි අධ්‍යක්ෂකවරයකු වන වැලිවිට දොන් කුසුමිත මුදිත් පෙරේරා විසින් අංක 1811 දරන උකස් බැඳුම්කරය මගින් ද එකී සමාගම විසින් අංක 1804 දරන උකස් බැඳුම්කරය මගින් ද ඩීඑෆ්සීසී බැංකුව වෙත උකස් කර ඇති මෙහි පහත විස්තර කරන ඉඩම හා පරිශ්‍රය සහ එහි පිහිටි පිරියත හා යන්ත්‍රෝපකරණ කොළඹ බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහතුන් ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් සහ සංශෝධිත පරිදි වූ 1955 අංක 35 දරන ලංකා සංවර්ධන මුදල් සංස්ථා පනතින් පැවරී ඇති බලතල යටතේ ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කරයි.

### අංක 1811 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කරන ලද දේපළ විස්තරය

උතුරු මැද පළාතේ, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ, තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මැද පත්තුවේ, සේවාගම ග්‍රාම නිලධාරී වසමේ "සේවාමුක්ත ජනපදය" ග්‍රාමයේ පිහිටි සර්වේයර් ජනරාල්වරයා සකස් කළ ඔහු භාරයේ ඇති අංක එෆ්. සී. පී. පී 013 දරන පිඹුරේ ලොට් අංක 920 ලෙස ලකුණු කළ බෙදා වෙන් කළ බිම් කට්ටිය වන, උතුරට : ලොට් අංක 828 ද, නැගෙනහිරට : ලොට් අංක 921 ද, බස්නාහිරට : ලොට් අංක 911 සහ 912 ද යන මායිම් ඇතුළත අක්කර දෙකකුත්, රූඩ් තුනකුත්, පර්චස් විසි හතරක් (අ. 2, රූ. 3, පර්. 24) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම සහ

එහි පිහිටි සියලු දේ. මෙම ඉඩම පොළොන්නරුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර තිබේ.

මැතක දී කරන ලද මැනීමකට අනුව ඉහත සඳහන් ඉඩම පහත දැක්වෙන පරිදි විස්තර කර තිබේ :

උතුරු මැද පළාතේ, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ, තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මැද පත්තුවේ, සේවාගම ග්‍රාම නිලධාරි වසමේ සේවාමුක්ත ජනපදනය ග්‍රාමයේ පිහිටි "බඳුළුළිදමන" නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු පී. බී. ඉලංගසිංහ විසින් මැන සකස් කළ අංක 2009/PO/045A හා 2009.02.15 වැනි දින දරන පිඹුරේ ලොට් අංක 1 ලකුණු කළ බිම් කට්ටිය වන, උතුරට : FCP PO 13 දරන පිඹුරේ ලොට් අංක 912 සහ FCP PO 13 දරන පිඹුරේ ලොට් අංක 828 (ප්‍රාදේශීය සභා පාර ) ද, FCP PO 13 දරන පිඹුරේ ලොට් අංක 921 ද, නැගෙනහිරට : FCP PO 13 දරන පිඹුරේ ලොට් අංක 828 (ප්‍රාදේශීය සභා පාර) සහ FCP PO 13 දරන පිඹුරේ ලොට් අංක 921 ද, දකුණට : FCP PO 13 දරන පිඹුරේ ලොට් අංක 921 සහ FCP PO 15 දරන පිඹුරේ ලොට් අංක 28, බස්නාහිරට : FCP PO 13 දරන පිඹුරේ ලොට් අංක 911 සහ FCP PO 13 දරන පිඹුරේ ලොට් අංක 912 යන මායිම් ඇතුළත අක්කර දෙකකුත්, රූඩ් තුනකුත් පර්චස් විසිහතරක් (අ. 2, රූ. 3, පර්. 24) බිම් ප්‍රමාණයකින් යුත් ඉඩම සහ එහි පිහිටි සියලු දේ.

**අංක 1804 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කරන ලද දේපළ විස්තරය**

පහත සඳහන් චංචල පිරියත, යන්ත්‍ර සූත්‍ර හා උපකරණ ඇතුළුව එනම්,

1. සේවාගම රයිස් ප්‍රොඩක්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගමේ පරිශ්‍රයේ දැනට සවිකර තිබෙන යන්ත්‍ර සූත්‍ර හා උපකරණ වූ-

තැම්බූ සහල් (Par Boiled) මෝල :

| *අංකය* | *විස්තරය* | *නිෂ්පාදිත රට* | *ධාරිතාව* |
|---|---|---|---|
| 1. | පැඩී ක්ලීනර් | ශ්‍රී ලංකාව | කි. ග්‍රෑ. 2,500 |
| 2. | බොයිලරය | එක්සත් රාජධානිය | කි. ග්‍රෑ. 4,500 |
| 3. | ඩ්‍රයරය - 01 | ශ්‍රී ලංකාව | ටොන් 12 |
| 4. | ඩ්‍රයරය - 02 | ශ්‍රී ලංකාව | ටොන් 32 |
| 5. | කුලරය | ශ්‍රී ලංකාව | කි. ග්‍රෑ. 800 |
| 6. | පැඩී ක්ලීනර් | ඉන්දියාව | කි. ග්‍රෑ. 300 |
| 7. | පැඩී හස්කර් | ඉන්දියාව | කි. ග්‍රෑ. 4,500 |
| 8. | හලර් | චීනය | කි. ග්‍රෑ. 2,500 |
| 9. | ජෙට් පොලිෂර් - 01 | චීනය | කි. ග්‍රෑ. 2,000 |
| 10. | ජෙට් පොලිෂර් - 02 | චීනය | කි. ග්‍රෑ. 2,000 |
| 11. | ඩි ස්ටෝනර් - 01 | ශ්‍රී ලංකාව | කි. ග්‍රෑ. 2,500 |
| 12. | ඩි ස්ටෝනර් - 02 | ශ්‍රී ලංකාව | කි. ග්‍රෑ. 2,500 |
| 13. | සිල්කි පොලිෂර් | ඉන්දියාව | කි. ග්‍රෑ. 4,000 |
| 14. | ග්‍රේඩර් | ඉන්දියාව | කි. ග්‍රෑ. 4,000 |
| 15. | කොම්ප්‍රෙෂර් | ඉන්දියාව | |
| 16. | වේට්බ්‍රිජ් - ටොන් 40T | එක්සත් රාජධානිය | |
| 17. | පැඩී හස්කර් (ඩී) | ඉන්දියාව | කි. ග්‍රෑ. 3,000 |
| 18. | එලිවේටර් - උස අඩි 25 | ශ්‍රී ලංකාව | |
| 19. | එලිවේටර් - උස අඩි 34 | ශ්‍රී ලංකාව | |
| 20. | එලිවේටර් - උස අඩි 32 | ශ්‍රී ලංකාව | |
| 21. | එලිවේටර් - උස අඩි 28 | ශ්‍රී ලංකාව | |
| 22. | එලිවේටර් - උස අඩි 29 | ශ්‍රී ලංකාව | |
| 23. | එලිවේටර් - උස අඩි 29 | ශ්‍රී ලංකාව | |
| 24. | 9 එලිවේටර්ස් | ශ්‍රී ලංකාව | අඩි 21 |

කැකුළු සහල් මෝල :

| *අංකය* | *විස්තරය* | *නිෂ්පාදිත රට* | *ධාරිතාව* |
|---|---|---|---|
| 1. | පැඩී ක්ලීනර් (වයිබ්‍රේසන්) | ශ්‍රී ලංකාව | කි. ග්‍රෑ. 2,500 |
| 2. | පැඩී ක්ලීනර්ස් දෙකයි | ශ්‍රී ලංකාව | කි. ග්‍රෑ. 2,500 |
| 3. | පැඩී හස්කර් | ඉන්දියාව | කි. ග්‍රෑ. 4,000 |
| 4. | පැඩී සෙපරේටර් | ශ්‍රී ලංකාව | කි. ග්‍රෑ. 4,000 |
| 5. | ඇබ්‍රසිව් පොලිෂර්ස් දෙකයි | ශ්‍රී ලංකාව | කි. ග්‍රෑ. 1,500 |
| 6. | N - 120 පොලිසර් | චීනය | කි. ග්‍රෑ. 2,500 |
| 7. | ග්‍රේඩර් | ශ්‍රී ලංකාව | කි. ග්‍රෑ. 3,000 |
| 8. | එලිවේටර් - උස අඩි 37 | ශ්‍රී ලංකාව | |
| 9. | එලිවේටර් තුනයි | ශ්‍රී ලංකාව | අඩි 25 |
| 10. | එලිවේටර් හයයි | ශ්‍රී ලංකාව | අඩි 21 |

2. සේවාගම රයිස් ප්‍රොඩක්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගමේ සවි කිරීමට සහ ඉදි කිරීමට යෝජිත යන්ත්‍රසූත්‍ර හා උපකරණ :

| *අංකය* | *විස්තරය* |
|---|---|
| 1. | නවීකරණය කළ, පරිසර දූෂණයෙන් තොර, වී පිරිසිදු කිරීමේ පද්ධතිය (Paddy Cleaning System) |
| 2. | ජලය පිරිසැකසුම් ක්‍රමය සහ කුණු දිය පිරි සැකසුම් ක්‍රම පද්ධතිය (Water Treatment System and Waste Water Treatment System) |
| 3. | වී තැම්බීමේ නවීන ක්‍රම පද්ධතිය සහ වී වේලීමේ ක්‍රම පද්ධතිය |
| 4. | දුම් තුරන් කිරීමේ ක්‍රමය සහිත නවීකරණය කළ වාෂ්ප උත්පාදනය |
| 5. | වාෂ්ප විසුරුවා හැරීමේ නවීකරණය කළ ක්‍රම පද්ධතිය |

ඇතුළුව සියලු චංචල පිරියත, යන්ත්‍රසූත්‍ර හා උපකරණ.

ඒ. එන්. පොන්සේකා,
සාමාන්‍යාධිකාරී.

ඩීඑෆ්සීසී බැංකුව,
අංක 73/5, ගාලු පාර,
කොළඹ 3.

06-616/3

---

**ඩීඑෆ්සීසී බැංකුව**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය ප්‍රකාර ඩීඑෆ්සීසී බැංකුව විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනා සම්මතය ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලද බව 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 08 වැනි වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය**

ඩීඑෆ්සීසී බැංකුව නමට අනුරාධපුර ප්‍රසිද්ධ නොතාරිස් එස්. කේ. එන්. ඒ. කුරෝ විසින් ලියා සහතික කරන ලද අංක 1526 හා 2003 ජූලි

මස 17 වැනි දින ද, අංක 1531 සහ 2003 ජූලි මස 18 දින ද දරන උකස් බැඳුම්කර දෙක මත, අයවිය යුතු මුදල් ගෙවීම, "සරත් හාඩ්වේයාර් ස්ටෝර්ස් " යන නාමය, අභිධානය සහ ආයතනය යටතේ මිහින්තලේ ව්‍යාපාරය කරගෙන යන මිහින්තලේ, පටබැඳි මද්දුමගේ සරත් නොහොත් පටබැඳි මද්දුමගේ සරත් ද සිල්වා යන අය විසින් පැහැර හැර ඇති හෙයින් ද, 2010 ජනවාරි මස 31 වැනි දිනට ඉහත කී අංක 1526 හා අංක 1531 දරන උකස් බැඳුම්කර මත එකී පටබැඳි මද්දුමගේ සරත් නොහොත් පටබැඳි මද්දුමගේ සරත් ද සිල්වා යන අයගෙන් ඩීඑෆ්සීසී බැංකුවට රුපියල් විසිඅට ලක්ෂ අසූහය දහස් හාරසිය දහනවයකුත් ශත හතලිස්තුනක (රු. 28,86,419.43) මුදලක් සහ 2010 පෙබරවාරි මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් දෙලක්ෂ හැත්තෑ දහස් හයසියයක් (රු. 2,70,600) සඳහා එක් එක් වර්ෂයේ සෑම තුන්මසකට වරක් ජනවාරි, අප්‍රේල්, ජූලි, ඔක්තෝබර් යන මාසවල ව්‍යාපාර කටයුතු කරන ප්‍රථම දිනයේ දී ප්‍රතිශෝධනය කරනු ලබන බර තැබූ මධ්‍යක මූලික ණය පොළී අනුපාතිකයකට (ඒ. ඩබ්ලිව්. පී. ආර්) වර්ෂයකට සියයට හතක් (7%) ඉහළ අනුපාතිකයක් මත ගණන් බලනු ලබන ආසන්නතම ඉහළ 0.5%ට තීන්දු කරන වාර්ෂික අනුපාතිකය මත පොළිය ද, රුපියල් විසි ලක්ෂයක් (රු. 20,00,000) සඳහා වර්ෂයකට සියයට තිස් හය (36%) බැගින් පොළිය ද ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද,

ඉහත කී උකස් බැඳුම්කර මත අයවිය යුතු මුදල වන රුපියල් විසිඅට ලක්ෂ අසූහය දහස් හාරසිය දහනවයකුත් ශත හතලිස් තුනක (රු. 28,86,419.43) මුදලක් සහ 2010 පෙබරවාරි මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් දෙලක්ෂ හැත්තෑදහස් හය සියයක් (රු. 2,70,600) එක් එක් වර්ෂයේ සෑම තුන්මසකට වරක් ජනවාරි, අප්‍රේල්, ජූලි, ඔක්තෝබර් යන මාසවල ව්‍යාපාර කටයුතු කරන ප්‍රථම දිනයේ දී ප්‍රතිශෝධනය කරනු ලබන බර තැබූ මධ්‍යක මූලික ණය පොළී අනුපාතිකයට (ඒ. ඩබ්ලිව්. පී. ආර්.) වර්ෂයකට සියයට හතක් (7%) ඉහළ අනුපාතිකයක් මත ගණන් බලනු ලබන ආසන්නතම ඉහළ 0.5%ට තීන්දු කරන වාර්ෂික අනුපාතිකය මත පොළිය ද, රුපියල් විසි ලක්ෂයක් (රු. 20,00,000) සඳහා වර්ෂයකට සියයට තිස්හය (36%) බැගින් පොළිය හෝ විකිණීමේ දිනට එයින් නොගෙවා ඉතිරිව ඇති යම් කොටසක් මීට අදාළ ඉඩම හා පරිශ්‍රය සහ එහි පිහිටි සියලු දේ විකිණීම පිළිබඳ ප්‍රචාරක ගාස්තු හා විකිණීමේ ගාස්තු ද, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය ප්‍රකාර එකී උකස් බැඳුම්කරවල ප්‍රඥප්ති අනුව ඩීඑෆ්සීසී බැංකුව වැය කර ඇති සියලු මුදල් හා දරා ඇති සියලු වියදම් හා ගාස්තු ද සමග අයකර ගැනීම සඳහා ඉහත කී අංක 1526 හා 1531 දරන උකස් බැඳුම්කර මගින් ඩීඑෆ්සීසී බැංකුව වෙත උකස් කර ඇති මෙහි පහත විස්තර කරන ඉඩම හා පරිශ්‍රය සහ එහි පිහිටි සියලු දේ කොළඹ බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහතුන් ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරනල ද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් සහ සංශෝධිත පරිදි වූ 1955 අංක 35 දරන ලංකා සංවර්ධන මුදල් සංස්ථා පනතින් පැවරී ඇති බලතල යටතේ ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කරයි.

**අංක 1526 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කරන ලද දේපළ විස්තරය**

උතුරු මැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, නුවරගම් පළාතේ, නුවරගම් කෝරළයේ, නැගෙනහිර නුවරගම් පළාත සහකාර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අනුරාධපුර නගර සහා බල ප්‍රදේශ සීමා ඇතුළත 1 වැනි අදියරේ පිහිටි "නුවරවැව කැලේ " නමැති ඉඩමේ සර්වේයර් ජනරාල්වරයා විසින් සකස් කළ අංක FUPA 2 දරන අවසාන නාගරික පිඹුරේ ලොට් අංක 56 ලෙස ලකුණු කළ බිම් කට්ටිය වූ බලයලත් මිනින්දෝරු ටී. බී. ආරියසේන විසින් නැවත මැන සකස් කළ අංක 1821 හා 1996.12.01 දින දරන පිඹුරේ ලොට් අංක 01 ලෙස ලකුණු කළ. වරිපනම් අංක 38 දරන බෙදා වෙන් කළ බිම් කට්ටියට මායිම්, උතුරට : FUP A2 පිඹුරේ ලොට් අංක 8 1/2 ද. නැගෙනහිරට : FUP A2 පිඹුරේ ලොට් අංක 55 1/2 ද, දකුණට : FUP A2 දරන පිඹුරේ ලොට් අංක 66 1/2 ද, බස්නාහිරට : FUP A2 පිඹුරේ ලොට් අංක 57 ද යන මායිම් ඇතුළත පර්චස් හතරකුත් දශම දෙකක් (අ. 0, රූ. 0, පර්. 4.2) නොහොත් (හෙක්ටයාර් 0.0106) ක් බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම සහ එහි පිහිටි සියලු දේ

මෑතක දී කරන ලද මැනීමකට අනුව මෙම ඉඩම පහත දැක්වෙන පරිදි විස්තර කර තිබේ.

උතුරු මැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අනුරාධපුර මහ නගර සභා බල ප්‍රදේශය ඇතුළත, අනුරාධපුර නව නගරයේ 1 වැනි අදියරේ මහ නගර සභා කොට්ඨාස අංක 6හි පිහිටි "නුවරවැව කැලේ " නමැති ඉඩමේ සර්වේයර් ජනරාල්වරයා විසින් නිකුත් කළ අංක FUP A2 දරන පිඹුරේ ලොට් අංක 56 ලෙස ලකුණු කළ වරිපනම් අංක 38 දරන බිම් කට්ටිය වූ බලයලත් මිනින්දෝරු ටී. බී. ආරියසේන විසින් මැන සකස් කළ අංක 2225A හා 2008.08.11 දින දරන පිඹුරේ ලොට් අංක 1 ලකුණු කළ බිම් කට්ටියට මායිම්, උතුරට : FUP A2 පිඹුරේ ලොට් අංක 8 1/2 ද, නැගෙනහිරට : FUP A2 පිඹුරේ ලොට් අංක 55 1/2 ද, දකුණට : FUP A2 දරන පිඹුරේ ලොට් අංක 66 1/2 ද, බස්නාහිරට : FUP A2 පිඹුරේ ලොට් අංක 57 ද යන මායිම් ඇතුළත පර්චස් හතරකුත් දශම දෙකක් (අ. 0, රූ. 0, පර්. 4.2) නොහොත් (හෙක්ටයාර් 0.0106) ක් බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම සහ එහි පිහිටි සියලු දේ.

**අංක 1531 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කරන ලද දේපළ විස්තරය**

අනුරාධපුර මාර්කට් සයිට් අංක 76 දරන පරිශ්‍රයේ ගබඩා කර තිබෙන හාඩ්වේයාර් බඩු.

ඒ. එන්. ෆොන්සේකා,
සාමාන්‍යාධිකාරී.

ඩීඑෆ්සීසී බැංකුව,
අංක 73/5, ගාලු පාර,
කොළඹ 3.

06-618/2

---

**සම්පත් බැංකුව පීඑල්සී**
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කර ගන්නා ලද සම්මුතිය

කේ. බී. නිහාල්.
ගිණුම් අංක : 0066 5000 0062.

සම්පත් බැංකුව පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2010 ක් වූ මාර්තු මස 25 වැනි දින පවත්වන්නට යෙදුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා කොට සම්මත කර ගන්නා ලදී.

සමාගම් ලියාපදිංචි අංක පීකිව්. 144 දරන සම්පත් බැංකුව පීඑල්සී නමින් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ආර්. අලහේන්ද්‍ර යන අය විසින් ලියා සහතික කරන ලද 2008 අගෝස්තු මස 22 දාතම හා අංක 2673 දරන උකස් බැඳුම්කරය මගින් උකස්කොට ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසු ගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ක්‍රිස්තෝගු බදුගේ නිහාල් යන අය බන්ධනදායීන් වශයෙන් පැහැර හැර ඇති හෙයින් ද, එකී බැඳුම්කරය ප්‍රකාර අයවිය යුතු මුළු මුදල වශයෙන් ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් හතලිස් හතරලක්ෂ අනූහතර දහස් හත්සිය හතලිස් හතරයි ශත තිස්තුනක (රු. 44,94,744.33) මුදලක් 2010 ජනවාරි මස 19 වැනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රුපියල් හතලිස් හතරලක්ෂ අනූහතර දහස් හත්සිය හතලිස් හතරයි ශත තිස්තුනක (රු. 44,94,744.33) මුදල ද 2010 ජනවාරි මස 20 දින සිට අංක 2673 දරන එකී බැඳුම්කරය මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් තිස්හත් ලක්ෂ තිස්තුන් දහස් හතලිස් අටයි ශත අසූවක (රු. 37,33,048.80) මුදලක් සඳහා වාර්ෂිකව සියයට විසිපහක් (25%) බැගින් වූ පොලිය ද, දැන්වීම් ගාස්තු ද, දරන්නට සිදුවූ වෙනත් වියදම් ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා, අංක 2673 දරන එකී බැඳුම්කරය මගින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස්කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන අයි. ඩබ්ලිව්. ජයසූරිය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණාලිය යුතු යැයි, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන ) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කර ගන්නා ලදී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළයේ, පල්ලේ පත්තුවේ, කඩුවෙල ප්‍රාදේශීය සභා සීමාවන් තුළ හේවාගම ග්‍රාමයේ පිහිටි "දිසාවත්ත *නොහොත්* කටුගම්පොල ඕවිට " යැයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එස්. පී. ආර්. පතිරාජ යන අය විසින් සාදන ලද 2007 ජනවාරි මස 20 දාතම හා අංක 4291බී දරන පිඹුරේ නිරූපිත බෙදාවෙන් කොට සීමා නිර්ණය කොට ලොට් 16 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : එකී අංක 4291බී දරන පිඹුරේ නිරූපිත ලොට් 12, 11 සහ 10 යන සියල්ලම, නැගෙනහිරට : එකී අංක 4291බී දරන පිඹුරේ නිරූපිත ලොට් 17, දකුණට : එකී අංක 4291බී දරන පිඹුරේ නිරූපිත ලොට් 20 සහ බස්නාහිරට : ලොට් 13 ( අඩි 20 පළල පාර) යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් නමයයි දශම එකක් (අ. 0, රූ. 0, පර්. 9.1) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන් ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේත් සහ සියලුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන් ප්‍රවශතාවන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී අංක 4291බී දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව ජී 1819/125 යටතේ හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළයේ, පල්ලේ පත්තුවේ, කඩුවෙල ප්‍රාදේශීය සභා සීමාවන් තුළ හේවාගම ග්‍රාමයේ පිහිටි "දිසාවත්ත *නොහොත්* කටුගම්පොල ඕවිට" යැයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එස්. පී. ආර්. පතිරාජ යන අය විසින් සාදන ලද 2007 ජනවාරි මස 20 දාතම හා අංක 4291බී දරන පිඹුරේ නිරූපිත බෙදාවෙන් කොට සීමා නිර්ණය කොට ලොට් 20 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : එකී අංක 4291බී දරන පිඹුරේ නිරූපිත ලොට් 16, නැගෙනහිරට : එකී අංක 4291බී දරන පිඹුරේ නිරූපිත ලොට් 19, දකුණට : එකී අංක 4291බී දරන පිඹුරේ නිරූපිත ලොට 24 සහ 23 සහ බස්නාහිරට : ලොට් 13 ( අඩි 20 පළල පාර) යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් නමයයි දශම එකක් (අ. 0, රූ. 0, පර්. 9.1) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන් ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේත් සහ සියලුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන් ප්‍රවශතාවන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී අංක 4291බී දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව ජී 1819/126 යටතේ හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

පහත සඳහන් දෑ මතින් ගමන් කිරීමේ හා මාර්ග අයිතිය ද සමග ය.

එකී හේවාගම ග්‍රාමයේ පිහිටි "දිසාවත්ත *නොහොත්* කටුගම්පොල ඕවිට" යැයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එස්. පී. ආර්. පතිරාජ යන අය විසින් සාදන ලද 2007 ජනවාරි මස 20 දාතම හා අංක 4291බී දරන පිඹුරේ නිරූපිත බෙදාවෙන් කොට සීමා නිර්ණය කොට ලොට් 7 (අඩි 20 පළල පාර සඳහා වෙන් කිරීම) වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : එකී අංක 4291බී දරන පිඹුරේ නිරූපිත ලොට් 2 සහ 6, නැගෙනහිරට : එකී පීපී අංක 8772 දරන පිඹුරේ නිරූපිත ලොට් 6 (යෝජිත මහා මාර්ගය සඳහා වෙන් කිරීම), දකුණට : එකී අංක 4291බී දරන පිඹුරේ නිරූපිත ලොට 8, 10, 11.12 සහ 14 යන සිල්ලම, ලොට් 18 සහ 13 (අඩි 20 පළල පාර) සහ බස්නාහිරට : එකී අංක 4291බී දරන පිඹුරේ නිරූපිත ලොට් 14 සහ 1 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දහසයයි දශම හයක් (අ. 0, රූ. 0, පර්. 16.6) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේත් සහ සියලුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන් ප්‍රවශතාවන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී අංක 4291බී දරන පිඹුරට අනුව ය.

එකී හේවාගම ග්‍රාමයේ පිහිටි "දිසාවත්ත *නොහොත්* කටුගම්පොල ඕවිට" යැයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එස්. පී. ආර්. පතිරාජ යන අය විසින් සාදන ලද 2007 ජනවාරි මස 20 දාතම හා අංක 4291බී දරන පිඹුරේ නිරූපිත බෙදාවෙන් කොට සීමා නිර්ණය කොට ලොට් 13 (අඩි 20 පළල පාර සඳහා වෙන් කිරීම) වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : එකී අංක 4291බී දරන පිඹුරේ නිරූපිත ලොට් 7 (අඩි 20 පළල පාර), නැගෙනහිරට : එකී අංක 4291බී දරන පිඹුරේ නිරූපිත ලොට් 12, 16, 20 සහ 23 යන සිල්ලම, දකුණට : පීපී අංක 8772 දරන පිඹුරේ නිරූපිත ලොට් 6 (යෝජිත මහා මාර්ගය සඳහා වෙන් කිරීම) සහ බස්නාහිරට : ලොට් 22, 21, 15 සහ 14 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් පහළොවක් (අ. 0, රූ. 0, පර්. 15) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේත් සහ සියලුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන් ප්‍රවශතාවන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී අංක 4291බී දරන පිඹුරට අනුව ය.

එකී හේවාගම ග්‍රාමයේ පිහිටි "දිසාවත්ත *නොහොත්* කටුගම්පොල ඕවිට" යැයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එස්. පී. ආර්. පතිරාජ යන අය විසින් සාදන ලද 2007 ජනවාරි මස 20 දාතම හා අංක 4291බී දරන පිඹුරේ නිරූපිත බෙදාවෙන් කොට සීමා නිර්ණය කොට ලොට් 18 (අඩි 20 පළල පාර සඳහා වෙන් කිරීම) වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : එකී අංක 4291බී දරන පිඹුරේ නිරූපිත ලොට් 7 (අඩි 20 පළල පාර), නැගෙනහිරට සහ දකුණට : පීපී අංක 8772 දරන පිඹුරේ නිරූපිත ලොට් 6 (යෝජිත මහා මාර්ගය සඳහා වෙන් කිරීම), සහ බස්නාහිරට : ලොට් 25, 19. 17 සහ 8 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් පහළොවක් (අ. 0, රූ. 0, පර්. 15) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන් ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේත් සහ සියලුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන් ප්‍රවශතාවන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී අංක 4291බී දරන පිඹුරට අනුව ය.

එකී ලොට් 16, 20, 7, 13 සහ 18 නැවත මිනුම් වන අතර පහතින් මැනවින් විස්තර කොට ඇති පරිදි පිඹුරු අංක 4210හි නිරූපිත ලොට් 01 සහ 2 හි කොටසක් යන දෙකම ඒකාබද්ධ කොට ඇති උපබෙදුම් වේ.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළයේ, පල්ලේ පත්තුවේ, කඩුවෙල ප්‍රාදේශීය සභා සීමාවන් තුළ හේවාගම ග්‍රාමයේ පිහිටි "දිසාවත්ත නොහොත් කටුගම්පොල ඕවිට" යැයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එස්. පී. ආර්. පතිරාජ යන අය විසින් සාදන ලද 2006 සැප්තැම්බර් මස 08 දාතම හා අංක 4210 දරන පිඹුරේ නිරූපිත බෙදාවෙන් කොට සීමා නිර්ණය කොට ලොට් 01 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : කැළණි ගඟ, නැගෙනහිරට : පීපී අංක 8772 දරන පිඹුරේ නිරූපිත ලොට් 6 (යෝජිත මහා මාර්ගය සඳහා වෙන් කිරීම) සහ කපිල ප්‍රනාන්දු යන අය විසින් හිමිකම් කියනු ලබන ඉඩම, දකුණට : පීපී අංක 8772 දරන පිඹුරේ නිරූපිත ලොට් 6 (යෝජිත මහා මාර්ගය සඳහා වෙන් කිරීම) සහ බස්නාහිරට : කේ. සෙනෙවිරත්න යන අය විසින් හිමිකම් කියනු ලබන ඉඩම යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් අක්කර එකයි රූඩ් එකයි පර්චස් විස්සයි දශම හතක් (අ. 1, රූ. 1, පර්. 20.7)) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන් ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේත් සහ සියලුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන් ප්‍රවශතාවන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී අංක 4210 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍ඉරුව ජී 1697/20 යටතේ හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

එකී හේවාගම ග්‍රාමයේ පිහිටි දිසාවත්ත නොහොත් කටුගම්පොල ඕවිට" යැයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එස්. පී. ආර්. පතිරාජ යන අය විසින් සාදන ලද 2006 සැප්තැම්බර් මස 08 හා අංක 4210 දරන පිඹුරේ නිරූපිත බෙදාවෙන් කොට සීමා නිර්ණය කොට ලොට් 02 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : කැළණි ගඟ, නැගෙනහිරට : කපිල ප්‍රනාන්දු යන අය විසින් හිමිකම් කියනු ලබන ඉඩම, දකුණට : කැළණි ගඟ සඳහා වෙන් කිරීම සහ බස්නාහිරට : කේ. සෙනෙවිරත්න යන අය විසින් හිමිකම් කියනු ලබන ඉඩම යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් විසිදෙකක් (අ. 0, රූ. 1, පර්. 22) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන් ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේත් සහ සියලුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන් ප්‍රවශතාවන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී අංක 4210 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍ඉරුව ජී 1697/21 යටතේ හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණපරිදි,

සමාගම් ලේකම්.

06-623

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.